පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - **491**

ආයතනයේ නම - **ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව**

පාර්ලිමේන්තුවේ රාජ්‍ය මූල්‍ය පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - **491**

நிறுவனத்தின் பெயர் - **இலங்கைப் புகையிரதத் திணைக்களம்**

பாராளமன்றத்தின் அரச கணக்கு குழுவினால் முனவைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் **119 (4)** இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliamentary Series Number - 491

Name of the Institution - Department of Sri Lanka Railway

Submission of observations of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee On Public Accounts in terms of standing order No. 119(4)

සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු සඳහා ප්‍ර.ග.නි./ග.නි. කරුණු පැහැදිලි කිරීම අනුව කාරක සභාවේ නිරීක්ෂණ සහ නිර්දේශ	ගන්නා ලද පියවර හා එහි වර්තමාන ප්‍රගතිය
01) **විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.** ❖ විමර්ශනය කරන ලද දිනය - 2025.05.09 **a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)** කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක ඩී.එම්.ඒ/01/2019 හා 2019 ජනවාරි 12 දිනැති කළමණාකරන විගණන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශයේ 5.3 ඡේදයට අනුව වර්ෂයකට අවම වශයෙන් විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් 04 ක් වත් පැවැත්විය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබූ බවත්, එය පහත වගුවේ පරිදි වන බව විගණනය වීසින් පෙන්වා දෙන ලදී. *වගුව 1: එක් එක් වර්ෂයට අදාළව පැවැත්වූ විගණන හා කළමනාකරණ කමිටු ගණන* | වර්ෂය | පැවැත්වූ වාර ගණන | |---|---| | 2021 | 01 | | 2022 | 02 | | 2023 | 02 | | 2024 | 02 | | 2025 | 01 |	2025/06/05 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමේදී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළ අතර, ඕන් ඉදිරියට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසි පරිදි පැවැත්වීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදෙන ලදී. 2025 හා 2026 වර්ෂවලදී පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පහත පරිදි පවත්වා ඇත. | කාර්තුව | 2025 | 2026 | |---|---|---| | I | 2026/03/24 | 2026/03/10 | | II | 2026/06/17 | 2026/06/23 | | III | 2026/08/20 | | | IV | 2026/12/24 | |

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තා විගණනයේදී පෙන්වා දෙන ගැටළු ඇතුළු සියලු කරුණු සාකච්ඡා කොට දෙපාර්තමේන්තු ක්‍රමවේද නිවැරදි කර ගැනීමේ අවස්ථාව එම කමිටු නිසි පරිදි නොපැවැත්වීම හේතුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට මහඟරී ඇති බව විගණනය වීසින් පෙන්වා දෙන ලදී.

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

2025 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු නිසි පරිදි පවත්වා එතුළින් දෙපාර්තමේන්තු ක්‍රමවේද නිවැරදි කර ගැනීමට අපේක්ෂා කරන බව ග.නි. ප්‍රකාශ කළේය.

c. කාරක සභාවේ නිරීක්ෂණ

කෙටි කාලසීමාවක් තුල දුම්රිය සාමාන්‍යාධිකාරීවරුන් කිහිප දෙනෙකු පත් වීම, රටට පැවති විසංගත වැනි තත්ත්වයන් හේතුවෙන් රජයෙන් බත් කිරණ, දුම්රිය දෙපාර්තමේන්තු සේවකයන් වීසින් පවත්වනු ලැබූ වෘත්තීය ක්‍රියාමාර්ග වැනි කරුණු හේතුවෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට අපොහොසත් වී ඇති බවත්,

මෙම ගැටලුවට නිශ්චිත පිළිතුරක් ඒවකට දුම්රිය දෙපාර්තමේන්තු පාලන අධිකාරිය ලබා දීමට අපොහොසත් වූ බවත් කාරක සභාව වීසින් නිරීක්ෂණය කරන ලදී.

d. කාරක සභාවේ නිර්දේශ

1. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පවත්වා එතුළින් දෙපාර්තමේන්තු ක්‍රමවේද නිවැරදි කර ගැනීමෙන් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කර ගැනීමට කටයුතු කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ ග.නි. වෙත,

2. මෙම කාල සීමාවේ සේවයේ නියුතුව සිටි හිටපු දුම්රිය සාමාන්‍යාධිකාරීවරුන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් වීළඟ රැස්වීමට කැඳවා ප්‍රමාදයන්ට හේතු විමසීමට කාරක සභාව තීරණය කළ අතර අවශ්‍ය නොවෙතුරු ලබා ගෙන එකී නිලධාරීන් කාරක සභාව හමුවට කැඳවන ලෙස කාරක සභාවේ ලේකම් වෙත,

නිර්දේශ කළ අතර, ප්‍ර.ග.නි./ ග.නි. ඒ සඳහා එකඟ වන ලදී.

ඉ. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම • කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක DMA/01/2019 හා 2019.01.12 දිනැති කළමනාකරණ විගණන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ අනුව විගණන කළමනාකරණ කමිටුව දුම්රිය සංමිශ්‍රාහාධිකාරී (සභාපති), දෙපාර්තමේන්තු ප්‍රධාන අභ්‍යන්තර විගණක (සාදස්‍යාධිකරු), දෙපාර්තමේන්තු ප්‍රධාන මූල්‍ය නිලධාරී (සමාජික), භාණ්ඩාගාර විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තු නියෝජිතයකු (සාමාජික), විගණකාධිපතිගේ නියෝජිතයකු ලෙස සහකාර විගණකාධිපති හෝ විගණක අධිකාරී (නිරීක්ෂක), ප්‍රධාන අමාත්‍යාංශ අභ්‍යන්තර විගණක (නිරීක්ෂක) යන නිලධාරීන්ගෙන් සමන්විත විය යුතු බවත්, • සාකච්ඡා කරනු ලබන කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා දුම්රිය සාමාන්‍යාධිකාරී (සභාපති) විගණකාධිපතිගේ නියෝජිත (නිරීක්ෂක) හා භාණ්ඩාගාරයේ නියෝජිත (සාමාජික) යන නිලධාරීන් සහභාගී වීම අත්‍යාවශ්‍ය බවත්, ගැටලුකාරී තත්ත්වය සාකච්ඡා කර තීරණ ගැනීමට අවශ්‍යතාවක් නිලධාරීන්ට නොහැකි බවත්, • විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා කමිටු සභාපතිවරයාටත් විගණකාධිපතිගේ නියෝජිත හා භාණ්ඩාගාර නියෝජිතවරයාට සහභාගී විය හැකි දිනයක් යොදා ගැනීමට දුරකථන මඟින් සාකච්ඡා කර තීරණය කරනු ලබන බවත්, එම දිනය බොහෝ විට දින 14කට පමණ පෙර තීරණය කරන අතර පසුව ඇතිවන යම් විශේෂිත කරුණු මත එම නිලධාරීන්ට එහෙස් සහභාගී වීමට නොහැකි නම් රැස්වීම් පසුවට කල් දැමීමට සිදුවන බවත්, නැවත දිනයක් යොදා ගැනීම ඉතා අපහසු බැවින් ඇතැම් විට රැස්වීම් නොපැවැත්වීමට සිදුවන බවත්, • 2021 වර්ෂයේ දී ද මෙම අනියතකර තත්ත්වය මත කොවිඩ් - 19 තුක්වන රැල්ල ව්‍යාප්ත වීම නිසා 2021 සැප්තැම්බර් 30 දක්වා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමෙන් නිදහස් කරන බවට විගණන කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMA/AMC/M/2021/2 හා 2021.09.06 දිනැති චක්‍රලේඛයේ උපදෙස් දී ඇති බවත්, 2021 අවසානේ කාර්තුවේ දී රැස්වීමක් පවත්වන ලෙස උපදෙස් ලැබුණු බවත්. ඒ අනුව 2021.12.14 දින එක් රැස්වීමක් පවත්වා ඇති බවත්, • 2023 වර්ෂයේ 2023.05.12 හා 2023.11.16 දින රැස්වීම් දෙකක් පැවැත්වූ බවත්, ඉතිරි රැස්වීම් පැවැත්වීමට නොහැකි වී ඇති බවත්,	

- 2024 වර්ෂයේ 2024.07.10 සහ 2024.10.16 දින රැස්වීම් දෙකක් පැවැත්වූ බවත්, 2024.12.26 දිනට නියමිතව තිබූ රැස්වීම නව දුම්රිය සාමාන්‍යාධිකාරී රාජකාරී හේතුවෙන් දිනට යෙදී තිබුණු බැවින් එදින පැවැත්වීමට නොහැකිවුණු බව දන්වමින් MT/04/14/03/01-2025 හා 2025.06.04 දිනැති ලිපියට අදාළ වාර්තාව දුම්රිය දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර ඇත.

- කළමනාකරණ විගණන මාර්ගෝපදේශයේ 2.2 (i) වගන්තිය අනුව සෑම කාර්තුවකටම එක් රැස්වීමක් වන පරිදි රැස්වීම් 04 ක් වත් පැවැත්විය යුතු සහර 2025 වර්ෂය වෙනුවෙන් කමිටු රැස්වීම් 03 ක් පවත්වා තිබුණු බව විගණකාධිපති පෙන්වා දෙන ලදී.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

වර්ෂයකට අවම විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් 04 ක් වත් පැවත්විය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබීම පිළිබඳව මීන් පෙර සේවය කරන ලද දුම්රිය සාමාන්‍යාධිකාරීවරුන්ගෙන් සහ නිවාඩු අමාත්‍යංශ ලේකම්වරුන්ගෙන් විමසිය යුතු බවට කාරක සභාව විසින් කළ නිර්දේශයට ප්‍ර.ග.නි/ග.නි එකඟ වූ බව විගණනය වීසින් දක්වන ලදී.

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම

2019 වසරේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 4ම පවත්වා ඇති බවත්, 2020 සහ 2021 වසර වල පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් නිසි පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වූ බවත්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2020.06.02 දිනැති කළමනාකරණ චක්‍රලේඛ අංක DMA/AMC/M/2020/5-4 ට අනුකූල වෙමින් අදාළ රැස්වීම් පැවැත්වීම් සිමා කළ බවත්, දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීහු ප්‍රකාශ කළහ.

c. කාරක සභාවේ නිරීක්ෂණ

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නොපැවැත්වීම් හේතුවෙන් විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමෙන්

2025/06/05 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමේදී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළ අතර, මීන් ඉදිරියට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසි පරිදි පැවැත්වීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදෙන ලදී.

2025 හා 2026 වර්ෂවලදී පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පහත පරිදි පවත්වා ඇත.

කාර්තුව	2025	2026
I	2026/03/24	2026/03/10
II	2026/06/17	2026/06/23
III	2026/08/20	
IV	2026/12/24	

වහාම් ඵලදායී සේවා තත්ත්වයක් ඇති කර ගැනීමට හොඳැකි වීම දුම්රිය දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂමතාවයට සෘජු ලෙස බලපෑ ඇති බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

d. කාරක සභාවේ නිර්දේශ

මෙම විගණන කරුණු සම්බන්ධයෙන් කාරක සභාව විසින් මෙදින කිසිදු නිර්දේශයක් ලබා නොදෙන ලදී.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

අදාල නොවේ.

02) වාර්ෂික වාර්තා ප්‍රමාදව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.05.09</u>

a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

අංක 02/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් වත්‍රලේඛයේ 12.1 ඡේදයට අනුව දෙපාර්තමේන්තුව විසින් ගිණුම් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුලත වාර්ෂික කාර්යසාධන වාර්තා සකස් කර පාර්ලිමේන්තුවට සභාගත කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, 2020, 2021, 2022 හා 2023 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා පහත පරිදි ප්‍රමාදයන් සහිතව සභාගත කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණු බවත්,

වගුව 2: එක් එක් වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා සභාගත කළ දින

වර්ෂය	සභාගත කිරීම සඳහා ඉදිරිපත් කළ දිනය
2020	2023/05/31
2021	2023/05/31
2022	2023/12/12
2023	2025/01/22
2024	2025/08/19

2020 වර්ෂයේ හා 2021 වර්ෂයේ පැවති කොරෝනා තත්වයන් හේතුවෙන් සංචරණය සීමා පැනවීම, මෙම සංචරණ සීමා නිසා කාර්යාලවලට පැමිණෙන සේවක මණ්ඩලය බෙහෙවින් සීමා වූ අතර, ඒ හේතුවෙන් කාර්යසාධන වාර්තාව සඳහා තොරතුරු ලබා ගැනීමේ ප්‍රමාදයන් විය. එබැවින් 2020 හා 2021 වර්ෂයන්ට අදාළව කාර්ය සාධන වාර්තා පිළියෙළ කිරීමට හැකි වූයේ 2023 වර්ෂයේ ය. ඉතා දීර්ඝ කාලයක් තොරතුරු රැස් කිරීම හා අදාළ තොරතුරු පිළියෙල කිරීම සඳහා වැඩි කාලයක් වැය විය. ඉන් පසු ඇති වූ එම ප්‍රමාදයන් හේතුවෙන් අත පසු වූ කාර්යයන් 2022 වර්ෂයේ සිට සිදු කළ අතර 2022 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව සභාගත කිරීම ප්‍රමාදවීමට මෙම කරුණු බෙහෙවින් ඉවහල් විය. 2023 වර්ෂය සඳහා සභාගත කිරීමට නියමිත කාර්ය සාධන වාර්තාව ප්‍රමාදය සඳහා සම්පිණ්ඩන වාර්තාව ලැබුණේ 2024.05.31 වන දිනට පසුව ය. 2023 වර්ෂයේ කාර්ය සාධන වාර්තාවට එකතු කරන ලද සංශෝධනයන් හේතුවෙන් ද යම් ප්‍රමාදයක් සිදු විය.

2024 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව සම්පිණ්ඩන වාර්තාව ප්‍රමාද වීම හා නිවැරදි ගිණුම් තොරතුරු ප්‍රමාද වී ලැබීම හේතුවෙන් ප්‍රමාද වීම සිදු විය.

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම

මෙම කරුණ සම්බන්ධයෙන් සැලකියයුතු පැහැදිළිකිරීමක් ප්‍ර.ග.නි./ග.නි. වෙතින් කාරක සභාවට ඉදිරිපත් කොලඹ නැත.

c. කාරක සභාවේ නිරීක්ෂණ

දුම්රිය දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තුවට වාර්තා ඉදිරිපත් කිරීමෙදී ඉහත අකාර්යක්ෂමතාව කටයුතු කර ඇති බව කාරක සභාවේ නිරීක්ෂණය වීය.

d. කාරක සභාවේ නිර්දේශ

1. ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස කාරක සභාව දෙපාර්තමේන්තුවේ ග.නි. වෙත නිර්දේශ කළේය.

2. මෙම කාල සීමාවේ සේවයේ නියුතුව සිටි සිටපු දුම්රිය කාමනාකාධිකාරීවරුන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් ඊළඟ රැස්වීමට කැඳවා ප්‍රමාදයන්ට හේතු විමසීමට කාරක සභාව තීරණය කළ අතර අවශ්‍ය තොරතුරු ලබා ගෙන එකී නිලධාරීන් කාරක සභාව හමුවට කැඳවන ලෙස කාරක සභාවේ ලේකම් වෙත කාරක සභාව නිර්දේශ කළේය.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

- 2020 වර්ෂයේ හා 2021වර්ෂයේ පැවති කොරෝනා තත්ත්වයන් හේතුවෙන් සංචරණ සීමා පැනවූ බවත්, ඒ හේතුවෙන් කාර්යාලවලට පැමිණෙන සේවක මණ්ඩලය මණ්ඩලයෙන් සීමා වූ බවත් එම හේතුවෙන් කාර්යසාධන වාර්තාව සඳහා තොරතුරු ලබාගැනීමේ ප්‍රමාදයන් සිදුවීම හේතුවෙන් 2020 හා 2021 වර්ෂයන්ට අදාලව කාර්යසාධන වාර්තා සිළිමයළු කිරීමට හැකි වූයේ 2022 වර්ෂයේ වූ බවත්,

- පළාතිහ කාර්ය මණ්ඩල නිහය මත උප දෙපාර්තමේන්තු 09කින් තොරතුරු ලබා ගැනීමෙදී සිදුවන ප්‍රමාදය මත 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව ප්‍රමාද වී පාර්ලිමේන්තුවේ සභාගත කර ඇති බවත්,

- 2024 වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සඳහා 2025/06/02 දින ඉදිරිපත් කර ඇත. 2025/05/30 දින නිකුත් කර ඇති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 2/2025ට අනුව 2025/06/30 දිනට පෙර 2024 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සභාගත කිරීමට කටයුතු කරන බවත්,

03) <u>විගණන විමසුම් වලට පිළිතුරු ලබා නොදීම</u>

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.05.09</u>

a. සංකේතවත් කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

2022 සිට 2024 දක්වා නිකුත් කරන ලද විගණන විමසුම් වලින් පිළිතුරු ලබා නොදුන් විගණන විමසුම් 27 ක් පවතින බව විගණනය විසින් පෙන්වාදෙන ලදී.

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

දුම්රිය දෙපාර්තමේන්තුවේ උප දෙපාර්තමේන්තු 9 ක් පැවතීම හා සේවක හිඟය හේතුවෙන් විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේ ප්‍රමාදයක් ඇති වී ඇති බව ප්‍රධාන මූල්‍ය නිලධාරී ප්‍රකාශ කළාය. එමෙන්ම 2024 වසරේ දුම්රිය දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 51 ක් අතුරින් 36 ක් සඳහා මේ වන විට පිළිතුරු සපයා ඇති බව නිලධාරීහු තව දුරටත් ප්‍රකාශ කළහ.

c. කාරක සභාවේ නිරීක්ෂණ

විගණන විමසුම් අවම කර ගැනීම, විගණනය හා කළමණාකරන කමිටු රැස්වීම් තුළින් දෙපාර්තමේන්තු ක්‍රමවේද නිවැරදි කරගත හැකි බවත් මෙම කාල සීමාවේ සේවයේ නියුතුව සිටි හිටපු දුම්රිය සාමාන්‍යාධිකාරීවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු වකුගඩු යුතු නිලධාරීන් මීළඟ රැස්වීමට කැඳවා ප්‍රමාදයන්ට හේතු විමසීම් සුදුසු ගැයි කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

d. කාරක සභාවේ නිර්දේශ

1. විගණන විමසුම් අවම කර ගැනීම සඳහා විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් තුළින් දෙපාර්තමේන්තු ක්‍රමවේද නිවැරදි කර ගැනීමට කටයුතු කරන ලෙස දුම්රිය සාමාන්‍යාධිකාරී (ග/නී) වෙත කාරක සභාව නිර්දේශ කළේය.

2. මෙම කාල සීමාවේ සේවයේ නියුතුව සිටි හිටපු දුම්රිය සාමාන්‍යාධිකාරීවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු වගකිව යුතු

2022 සිට 2024 දක්වා වූ කාලයට අදළ සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දී ඇත.
විගණනයෙන් යොමු කර ඇති ඇතැම් විගණන විමසුම් සඳහා ප්‍රාදේශීය අංශ ප්‍රධානීන් වෙතින් තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා ගැනීමට සිදු වීමත්, ඇතැම් විට පැරැණි ලිපිගොනු ආශ්‍රිතව තොරතුරු පරීක්ෂා කරමින් දත්ත වාර්තා සැකසීමට සිදුවීම හේතුවෙන් පිළිතුරු අපේක්ෂිතව ඇති දින 07ක් තුළම පිළිතුරු ලබා දීමේ හැකියාවක් නොමැති වන අවස්ථා පවතී. එසේම, අතුරු වාර්තාවක් සැකසීම සඳහා ද ප්‍රමාණවත් පරිදි තොරතුරු ලබා ගැනීමට සිදු වන්නේ ද ඒ ආකාරයටම ය. එබැවින් විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට ගතවන කාලය මසක් ඉක්මවා යෑම ද පාලනය කළ නොහැකි තත්ත්වයකි. කෙසේ වෙතත්, හැකිතාක් කඩිනමින් පිළිතුරු සහ තොරතුරු ලබා දීමට සෑම විටම ක්‍රියා කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

නිලධාරීන් මිළඟ රැස්වීමට කැඳවා ප්‍රමාදයන්ට හේතු විමසීමට කාරක සභාව තීරණය කළ අතර අවශ්‍ය නොරතුරු ලබා ගෙන එකී නිලධාරීන් කාරක සභාව හමුවට කැඳවන මෙලස කාරක සභාවේ ලේකම් වෙත කාරක සභාව නිර්දේශ කළේය.

ඇ. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

- 2025 ජූනි මස 05 වැනි දින පැවති කාරක සභාවට 2022 සිට 2024 කාල සීමාවේ සේවයේ නියුතුව සිටි හිටපු දිස්ත්‍රික් සංඛ්‍යාධිකාරිවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු වගකිව යුතු නිලධාරීන් කැඳවා ප්‍රමාදයන්ට හේතු විමසනු ලැබූ අතර එවකට ලොව පුරා පැතිර තිය COVID - 19 වසංගත තත්ත්වය හේතුවෙන් රජය මඟින් හදු ලැබූ තීරණ, දිස්ත්‍රික් සේවකයන්ගේ උද්ඝෝෂණ වැනි කරුණු හේතුවෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කල්දැමීමට/අවලංගු කිරීමට සිදු වූ බව කාරක සභාව ඉදිරියේ අනාවරණය කරන ලදී.

- 2022 වර්ෂයට අදාලව විගණන වීමසුම් 67ක් පැවති බවත්, ඒ සියලුම විගණන වීමසුම්වලට පිළිතුරු ලබා දී ඇති බවත්,

- 2023 වර්ෂයට අදාලව විගණන වීමසුම් 53ක් පැවති බවත්, ඒ සියලුම විගණන වීමසුම්වලට පිළිතුරු ලබා දී ඇති බවත්,

- 2024 වර්ෂයට අදාලව විගණන වීමසුම් 51ක් පැවති බවත්, ඉන් විගණන වීමසුම් 41කට පිළිතුරු ලබා දී ඇති බවත්, විගණන වීමසුම් 10කට පිළිතුරු ලබා දීමට ඇති බවත්,

- 2025 වර්ෂයට අදාලව විගණන වීමසුම් 25ක් පැවති බවත්, ඉන් විගණන වීමසුම් 7කට පිළිතුරු ලබා දී ඇති බවත්, විගණන වීමසුම් 18කට පිළිතුරු ලබා දීමට ඇති බවත්,

M/04/14/03/01-2025 හා 2025.06.04 දිනැති ලිපියට අදාළ වාර්තාවේ සඳහන් කර කාරක සභාවට ඉදිරිපත් කර ඇත.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

අ. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

2022 සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ පිළිතුරු නොදුන් විගණන වීමසුම් සංඛ්‍යාව 27 ක් වන බව කාරක සභාව වෙතින් පෙන්වා දෙන ලදී.

2022 – 2024 දක්වා වූ කාලයට අදාළ සියළුම විගණන වීමසුම් සඳහා පිළිතුරු සපයා ඇත.

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම රටෙහි එවකට වූ නත්ත්වයන් හා රජය විසින් ගත විවිධ තීරණ හේතුවෙන් නිසි පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ බව දුම්රිය දෙපාර්තමේන්තුවේ මතය වීය. **c. කාරක සභාවේ නිර්ක්ෂණ** විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වීය යුත්තේ විගණන වීමසුම් මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමෙන් වඩාත් ඵලදායී සේවා නත්ත්වයක් ඇති කිරීම බව කාරක සභාවේ මතය වීය. **d. කාරක සභාවේ නිර්දේශ** මෙම විගණන කරුණු සම්බන්ධයෙන් මෙදින කිසිදු නිර්දේශයක් කාරක සභාව විසින් ලබා නොදෙන ලදී. **e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම** අදාළ නොවේ.	විගණනයෙන් යොමු කර ඇති ඇතැම් විගණන වීමසුම් සඳහා ප්‍රාදේශීය අංශ ප්‍රධානීන් වෙතින් තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා ගැනීමට සිදු වීමත්, ඇතැම් විට පැරණි ලිපිගොනු ආශ්‍රිතව තොරතුරු පරීක්ෂා කරමින් දත්ත වාර්තා සැකසීමට සිදුවීම හේතුවෙන් පිළිතුරු අපේක්ෂිතව ඇති දින 07ක් තුළම පිළිතුරු ලබා දීමේ හැකියාවක් නොමැති වන අවස්ථා පවතී. එසේම, අතුරු වාර්තාවක් සැකසීම සඳහා ද ප්‍රමාණවත් පරිදි තොරතුරු ලබා ගැනීමට සිදු වන්නේ ද ඒ ආකාරයටම ය. එබැවින් විගණන වීමසුම් සඳහා පිළිතුරු සැපයීමට ගතවන කාලය මසක් ඉක්මවා යෑම ද පාලනය කළ නොහැකි තත්ත්වයකි. කෙසේ වෙතත්, හැකිතාක් කඩිනමින් පිළිතුරු සහ තොරතුරු ලබා දීමට සෑම විටම ක්‍රියා කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
04) <u>වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගෙනැනීම විගණන වීමසුම් වලට පිළිතුරු ලබා නොදීම</u> ❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.05.09</u> **a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)** අංක 02/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වන ඡේදයට අනුව ප්‍රසම්පාදන සැලැස්ම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගෙන් අනුමැතිය ලබා ගත යුතු වුවත් 2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අදාළ අනුමැතිය ලබාගෙන නොමැති බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.	2024 වර්ෂයේ දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා වන මිලදී ගැනීම් " වාර්ෂික අවශ්‍යතා ලැයිස්තුව" (Annual Requirement List) මත පදනම්ව සිදුකර ඇති අතර 2025 වර්ෂය සඳහා යෝජිත ප්‍රසම්පාදන සැලැස්ම අනුමැතිය සඳහා ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇති බවත් කාරුණිකව දන්වමි.

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

දුම්රිය මෙහෙයුම්කාණ්ඩය සඳහා වන මිලදී ගැනීම් "වාර්ෂික අවශ්‍යතා ලැයිස්තුව (Annual Requirement List)" මත පදනම් වී සිදු කර ඇති බවත්, 2025 වර්ෂය සඳහා යෝජිත ප්‍රසම්පාදන සැලැස්ම අනුමැතිය සඳහා ප්‍රවාහන,මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති බව ගණන්දීමේ නිලධාරියා ප්‍රකාශ කර සිටීමයි.

c. කාරක සභාවේ නිරීක්ෂණ

2006 වසරේ දී රජය විසින් එළිදක්වනු ලැබූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය, දුම්රිය දෙපාර්තමේන්තුව විසින් 2024 වසර වන තෙක්ම, ක්‍රියාත්මක නොකිරීම් කාරක සභාවේ දැඩි අප්‍රසාදය දක්වන ලදී.

එමෙන්ම ප්‍රසම්පාදන සැලැස්මේ අපේක්ෂිත කටයුතු ප්‍රසම්පාදන කොමිෂන් සභාවට යැවීම් ඇති අතරින් රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව මඟින් අපේක්ෂිතයක් සිදු නොකරන බව නිලධාරීහු ප්‍රකාශ කළහ.

d. කාරක සභාවේ නිර්දේශ

1. අදාළ කාල සීමාවේ සේවයේ නියුතුව සිටි නිවැරදි දුම්රිය සාමාන්‍යාධිකාරිවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුලු වගකිව යුතු නිලධාරීන් මිළඟ රැස්වීමට කැඳවා මෙම කරුණට අදාළව හේතු විමසීමට කාරක සභාව තීරණය කළ අතර අවශ්‍ය නොවන්නා වූ බවත් එකී නිලධාරීන් කාරක සභාව හමුවට කැඳවන ලෙස කාරක සභාවේ ලේකම් වෙත නිර්දේශ කළේය.

2. 2025 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම සකියක් කුතුළුන (2025.05.16 දින වන විට) මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත ලැබීමට කටයුතු කරන ලෙස කාරක සභාව ග.නි වෙත නිර්දේශ කළායි.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

- 2025 වර්ෂයට අදාළ යෝජිත ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති බව M/04/14/03/01-2025 හා 2025.06.04 දිනැති ලිපියට අදාළ වාර්තාවේ ඇමුණුම් 05 මඟින් කාරක සභාවට ඉදිරිපත් කර ඇත.

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.06.05

a. සංකේතා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

2024 හා 2025 වසර සඳහා ද ප්‍රසම්පාදන සැලසුම් අනුමත කර නොතැනීම සම්බන්ධයෙන් විගණනය පෙන්වා දෙන ලදී.

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

2024 ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ප්‍රමාදව ඉදිරිපත් කරන ලද බවත්, 2025 වසර සඳහා ප්‍රසම්පාදන සැලැස්ම මේ වන විට අමාත්‍යාංශයට යොමු කර ඇති බවත් ගණන්දීමේ නිලධාරී ප්‍රකාශ කළේය.

c. කාරක සභාවේ නිරීක්ෂණ

සියළුම රාජ්‍ය ආයතන සෑම වසරකම දෙසැම්බර් 10 වන දින වන විට තම ආයතනයේ ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙතින් අනුමත කර ගත යුතු අතර පිටපත් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව, ප්‍රසම්පාදන කොමිෂන් සභාව හා විගණකාධිපති වෙත යොමු කළ යුතු බවක්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දුර්වලතා හේතුවෙන් දෙපාර්තමේන්තුව විසින් මිලදී ගෙන ඇති මිල අධික යන්ත්‍ර හා උපකරණ උගස් උපයෝජිතව පවතින බවත්, කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

d. කාරක සභාවේ නිර්දේශ

ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දුර්වලතා හේතුවෙන් දෙපාර්තමේන්තුව විසින් මිලදී ගෙන ඇති මිල අධික යන්ත්‍ර /යන්ත්‍රාංගර හා උපකරණ උගස් උපයෝජිතව පැවතීම සම්බන්ධයෙන් අවධානය යොමු කළ කාරක සභාව 2012 වසරේ සිට එම මිලදී ගැනීම් වලදී හිඟ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර ඇත්ද යන්න පිළිබඳව වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන ලෙස දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරියා වෙත නිර්දේශ කරන්නේ.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

2012 වර්ෂයෙන් පසු රත්මලාන ප්‍රධාන යාන්ත්‍රික උප දෙපාර්තමේන්තුවට ප්‍රධාන යන්ත්‍ර 58කට අසන්න ප්‍රමාණයක් මිලදී ගෙන ඇති බවත්, එයින්, Vertical Hydraulic Wheel 500T, Hydraulic Wheel Press, Universal Dynamic Balancing Machine, Injector Pump Testing Machine හා

2024 වර්ෂයේ දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා වන මිලදී ගැනීම් "වාර්ෂික අවශ්‍යතා ලැයිස්තුව" (Annual Requirement List) මත පදනම්ව සිදුකර ඇති අතර 2025 වර්ෂය සඳහා යෝජිත ප්‍රසම්පාදන සැලැස්ම අනුමැතිය සඳහා ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇති බවත් කාරුණිකව දන්වමි.

Common Rail Injector Tester යන උපකරණ/යන්ත්‍ර 05ක් ඌන උපයෝජිතව පවතින බව MT/04/14/03/01-2025 හා 2025.11.13 දිනැති ලිපිය මඟින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ, ඇමුණුම 14,15,16,17 හා 18 යටතේ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

05) **ක්‍රියාකාරී සැලැස්ම.**

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.05.09</u>

a. **සාකච්ඡා කරන ලද කරුණු (විමණකාධිපති නිරීක්ෂණ අනුව)**

අංක 02/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් වක්‍රලේඛයේ 03 වන ඡේදයට අනුව ඉදිරි වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු බවද දුම්රිය දෙපාර්තමේන්තුව විසින් 2023 සහ 2024 වර්ෂයන්ට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් ප්‍රමාදයක් සහිතව පිළිවෙලින් 2023 ජනවාරි 16 දින හා 2024 අප්‍රේල් 08 දින අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණු බව විමණනය විසින් පෙන්වා දෙන ලදී.

b. **ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**

2025 ට අදාළ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම ඒ වන විට ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයට ලැබී ඇති බව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා ප්‍රකාශ කර සිටියේය.

c. **කාරක සභාවේ නිරීක්ෂණ**

අදාළ නොවේ.

d. **කාරක සභාවේ නිර්දේශ**

මෙම විමණනය කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ලබා නොදෙන ලදී.

e. **නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

අදාළ නොවේ.

ප්‍රවාහන අමාත්‍යාංශයේ 2022.1.29 දිනැති ලිපියෙන් දී ඇති උපදෙස්වලට අනුකූලව සකසන ලද දුම්රිය දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම 2023.02.02 වන දින ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. මෙම ක්‍රියාකාරී සැලැස්ම සඳහා ඇතුළත් කළ යුතු උපදෙපාර්තමේන්තු සඳහා වෙන් කරන ලද අනුමත ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු පමා වී ලැබුණු බැවින් දෙසැම්බර් 31 දිනට ලබා දීමට නොහැකි විය.

2024 වසරේ උපදෙපාර්තමේන්තු සඳහා වෙන් කරනලද අනුමත ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු 2024.01.08 දින ලැබුණු අතර, 2024.02.27 ප්‍රවාහන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ ද ප්‍රවාහන අමාත්‍යාංශය මඟින් එහි තිබූ අඩු පාඩු සකස් කර සංශෝධනයන් සහිතව 2025.04.08 දින නැවත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි. ඒ අනුව යොමු අංක MT/05/03/01/(2024) 2025.05.02 දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දී ඇත.

06) දුම්රිය මාර්ගය අලුතින් ඉදි කිරීම සඳහා ගලවා ඉවත් කළ පැරණි සිල්පර හා රේල්පීලි මහව සිට ඕමන්තෙ දක්වා දුම්රිය මාර්ගය දෙපස ප්‍රයෝජනයට නොගෙන විනාශ වීම.

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.05.09

a. සංකේතීය කරන ලද කරුණු (විගණනාධිපති නිරීක්ෂණ අනුව)

ඉන්දියානු ණය යේවා ගිවිසුම යටතේ වූ ණය ආධාර අනුව මහව - අනුරාධපුරය - ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය ඇ.ඩොලර් මිලියන 91.26ක් වැයකර නිම කිරීමට 2019 වර්ෂයේ ආරම්භ කල මහව සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ගය ඉදි කිරීමේ ව්‍යාපෘතියට අදාලව දුම්රිය මාර්ගය අලුතින් ඉදි කිරීම සඳහා දුම්රිය මාර්ගයේ පැරණි සිල්පර හා රේල්පීලි ගලවා ඉවත් කළ යුතු අතර කොන්ත්‍රාත් ගිවිසුමෙහි අයිතම 7.1 වගන්තිය ප්‍රකාරව එම සිල්පර හා රේල්පීලි ගලවා ළඟම දුම්රිය ස්ථානයට ගෙනගොස් භාර දිය යුතු වුවද, ගිවිසුම් ප්‍රකාරව එම අවශ්‍යතාවය ඉටුවී නොතිබුණු බව නිරීක්ෂණය විය. කොන්ත්‍රාත්කරු විසින් අදියර 01 හා අදියර 02 යටතේ ගලවා ඉවත් කරන ලද සිල්පර සෙකට 159.626ක් සහ රේල් පීලි 106,464ක් මහව සිට ඕමන්තෙ දක්වා දුම්රිය මාර්ගය දෙපස ස්ථාන 1024 ක ගොඩගසා තිබීමෙන් එම තොග 2025 මාර්තු 31 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින බව ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය වන බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

b. ප්‍රධාන ගණුන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණුන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

දැනට කිලෝමීටර 65ක මාර්ගයක් එකවර ගලවා ඉවත් කර ඇති බැවින් එම පැරණි සිල්පර හා රේල්පීලි, ආසන්න දුම්රිය ස්ථානයේ ඉඩම ප්‍රමාණාත්මක නොමැති වීම හේතුවෙන් ගබඩා කිරීමට පහසුකම් ලබා ගැනීමට හැකියාවක් නොමැති නිසා එසේ ගොඩගසා තැබීමට සිදු වූ බවත්, හාවිතයට ගත හැකි රේල්පීලි හා සිල්පර නැකොට ඉදිකිරීම් කටයුතු සඳහා දැනටමත් යොදාගෙන ඇති බවත් ඉතිරි කොටස කොන්ඩර් කැඳවා විකිණීමට කටයුතු කරන බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීහු ප්‍රකාශ කර සිටියහ. එමෙන්ම මෙයී දුම්රියවලට ප්‍රමුඛතාවය ලබා දීමත්, සේවා දුම්රියවල පවතින නිශ්චිතාවයත් හේතුකොට ගෙන මෙම ප්‍රමාදය සිදු වී ඇති බව ඔවුහු තව දුරටත් ප්‍රකාශ කර සිටියහ.

මහව/අනුරාධපුර හා ඕමන්තේ අතර ඉවත් කරන ලද සිල්පර හා රේල්පීලි ආසන්නතම දුම්රිය ස්ථානය වෙත ප්‍රවාහනය නොකිරීම හේතුවෙන් ඉතිරි වන මුදල් කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගෙන ඇත.

මහව හා අනුරාධපුර අතර දුම්රිය මාර්ගය අලුතින් ඉදි කිරීමේදී දුම්රිය මාර්ගයෙන් ගලවා ඉවත් කරන ලද රේල් පීලි හා කොන්ක්‍රීට සිල්පර බැහැර කිරීම පිළිබඳ 2026.02.02 දිනැතිව ඔබ වෙත යොමුකර ඇති වාර්තාවේ පිටපතක් මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම 01)

නමුත්, දිවිවා සුළි කුණාටුව සමඟ දුම්රිය මාර්ගය විනාශ වීමත් සමඟ එම කටයුතු යථාතත්වයට පත් කරගැනීමට කටයුතු කිරීම හමුවේ මෙම කටයුතු මන්දගාමීව සිදුවූ නමුත්, ඉදිරියේදී අදාල සැලසුමට අනුව අවශ්‍ය කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

c. කාරක සභාවේ නිරීක්ෂණ

සැලැස්මකින් තොරව කටයුතු කිරීමත්, ව්‍යාපෘති යෝජනාව නිවැරදිව සකස් කර නොතිබීමත් මෙම ගැටලුවට ප්‍රධානතම හේතුව වී ඇති බව කාරක සභාවේ නිරීක්ෂණය වීය.

d. කාරක සභාවේ නිර්දේශ

සිල්පර හා රේල්පිලි වර්ගීකරණය නොව අදාල ස්ථානවලින් ඉවත් කිරීම සඳහා සැලැස්මක් සහිත වාර්තාවක් සති 02ක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස දෙපාර්තමේන්තුවේ ජ.නි. වෙත කාරක සභාව නිර්දේශ කළායය.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

දුම්රිය සංඛ්‍යාන්සිකාරීගේ හා ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික අභිවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ PS/LEG/COPA/02/DEPT(10)04/2025 වෙළුම II හා 2025/06/04 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත යොමු කර ඇති පරිදි; හාවිතයට ගත හැකි සිල්පර තෙක්රා ගැනීමෙන් පසු අධිකාරී ඉංජිනේරු අංශයන් වෙත ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් කර ඇති ප්‍රමාණය සම්බන්ධයෙන් නොවැම්බර් (ඇමුණුම 03) මගින් ඉදිරිපත් කර ඇත.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.11.27</u>

a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

- 2025 නොවැම්බර් 14 දින වන විටත් සැලැස්මක් කාරක සභාවට යොමු කර නොමැති බවත්,
- සිල්පර හා රේල්පිලි වර්ගීකරණය කිරීමක් කර නොමැති බවත්,
- සිල්පර 24,771 ක් පමණක් ක්ථාන වලට ප්‍රවාහනය කර තිබූ අතර සිල්පර 58,217 ක් තවදුරටත් ප්‍රවාහනය කළ යුතුව ඇති බවත්,
- රේල් පිලි අඩි 62,389 ක් මේ වන විට අදාළ මාර්ග අංශ වෙත ප්‍රවාහනය කර ඇතත්, 203,199 ක ප්‍රමාණයක් ප්‍රවාහනය කළ යුතුව ඇති බවත්,
- මහව ඔමන්න ව්‍යාපෘතියේ උපදේශක ආයතනයේ වාර්තා අනුව දෙපාර්තමේන්තුවට භාරදුන් රේල්පිලි අඩි 290,928ක් වුවද, දෙපාර්තමේන්තු වාර්තා අනුව රේල්පිලි අඩි 265,588ක් පමණක් රේල්පිලි අඩි 25,340ක ඌනතාවයක් පවතින බවත්, විගණනය විසින් පෙන්වා දෙන ලදී.

මහව හා අනුරාධපුර අතර දුම්රිය මාර්ගය අලුතින් ඉදි කිරීමේදී දුම්රිය මාර්ගයෙන් ගලවා ඉවත් කරන ලද රේල් පීලි හා කොන්ක්‍රීට් සිල්පර බැහැර කිරීම පිළිබඳ 2026.02.02 දිනැතිව ඔබ වෙත යොමුකර ඇති වාර්තාවේ පිටපතක් මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම 01)

නමුත්, දිට්වා සුළි කුණාටුව සමඟ දුම්රිය මාර්ගය විනාශ වීමත් සමඟ එම කටයුතු යථාතත්වයට පත් කරගැනීමට කටයුතු කිරීම හමුවේ මෙම කටයුතු මන්දගාමීව සිදුවූ නමුත්, ඉදිරියේදී අදාල සැලසුමට අනුව අවශ්‍ය කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

b. ප්‍රධාන ඉණක් දීමේ නිලධාරි (ප්‍ර.ඉ.නි.) / ඉණුන් දීමේ නිලධාරීගේ (ඉ.නි.) කරුණු පැහැදිලි කිරීම

සිල්පර මාර්ගය දෙපස තවමත් ගොඩ ගසා තිබීම නිසා ප්‍රවාහනය පිළිබඳ නිවැරදි සැලැස්මක් සාදා ගැනීමේ අපහසුතාවයක් පවතින බවත්, සේවා දුම්රියකින් මෙවා ප්‍රවාහනය කළ යුතු බවත්, එක වතාවකදී ආසන්න වශයෙන් සිල්පර 400ක් හෝ රේල්පිලි 300ක් පමණ සුළු ප්‍රමාණයක් ප්‍රවාහනය කිරීමට හැකි වන නිසා මේ සඳහා සැලකිය යුතු කාලයක් ගත වන බවත්, සංමිශ්‍රණය දුම්රිය ධාවනය කාල සටහන හේතුවෙන් මෙම කටයුතු සිදු කිරීමෙදි ගැටළු මතු වී ඇති බවත් ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කර්මාන්ත) ප්‍රකාශ කර සිටියේය.

ඕමන්තේ ව්‍යාපෘතියට අදාල ගිවිසුමෙහි 7වන වගන්තියට අනුව, ගිවිසුම්ගත ආයතනය ව්‍යාපෘතියෙන් ඉවත්කරන දුම්රිය රේල්පිලි සහ සිල්පර ආසන්නම දුම්රිය ස්ථානයට ප්‍රවාහනය කරන බවටත්, ආසන්නම දුම්රිය ස්ථානය වෙනස් වන්නේ නම් ව්‍යාපෘති අධ්‍යක්ෂකයා විසින් දුම්රිය මෙහෙයුම්කාරතුමන්තුවට ඒ සඳහා ගෙවීමක් සිදු කළ යුතු බවටත් එකී සඳහන් වන බව ව්‍යාපෘති අධ්‍යක්ෂ පැවසිය.

නමුත්, ව්‍යාපෘතිය ප්‍රමාද වී ආරම්භ කිරීම, මියවර 1 හා මියවර 2 අතරතුර සැලකිය යුතු කාලයක් නොකිසීම, සාදා නිමකළ වහාම දුම්රිය ධාවනයට මාර්ගය යෙදවීම වැනි හේතූන් නිසා මෙහෙයුම්කාරතුමන්තුව හා අදාල පාර්ශ්වය අතර මුදල් නොගෙවීමේ එකඟතාවයකට එළඹුණ බවත්, සිල්පර හා රේල්පිලි ප්‍රවාහනය නොකිරීම නිසා අහෝසිකුණ මුල්‍යමය වාසිය එම ආයතනයේ නීළඟ සිල්පරෙන් අය කර ගැනීමට කටයුතු සූදානම් කර ඇති බවත්, ව්‍යාපෘති අධ්‍යක්ෂ ප්‍රකාශ කළේය.

සිල්පර හා රේල්පිලිවලින් හාවිතයට හැර ඇති පිලි වර්ගීකරණය කොට වෙනත් දුම්රිය මාර්ග නවීකරණය සඳහා භාවිතා ගන්නා බවත්, හාවිතයට ගත නොහැකි පිලි අදාල කම්පුවේ හා කර්මාන්ත අමාත්‍යාංශයේ නිර්දේශ මත යුධ හමුදාව, නාවික හමුදාව, ඔෂ්මල පසල වැනි රජයේ ආයතනවලට ලබා දෙන බවත්, කිසිදු රාජ්‍ය ආයතනයකට රේල්පිලි නොමිලේ ලබා නොදෙන බවත් නිලධාරීහු සඳහන් කළහ.

c. කාරක සභාවේ නිරීක්ෂණ

ඉතිරි වැඩ කටයුතු ආරම්භ කිරීමට ඉන්දීය එක්සිම් බැංකුවේ අධාර නවදුරටත් ලබා නොදෙන බැවින්, කැණීනට මිණ්ඩල අනුමැතිය ලබාගෙන විශේෂ කම්පුවක් පත් කර ශ්‍රී ලංකා රජයේ මුදල් ලබා දිය හැකි ද යන්න සාකච්ඡා කිරීමට නියමිත බවත්, එකී කම්පුව සභියක් තුළ පත් කරගෙන කැණීනට අනුමැතිය ලබා ගෙන හැකි ඉක්මනින් මෙම කටයුතු ආරම්භ කළයුතු බව කාරක සභාවේ නිරීක්ෂණය විය. මෙම කරුණ මීට අපර පැවති

කාරක සභා වලදී ද සාකච්ඡා කර නිර්දේශ කරන ලද වාර්තාව සම්පූර්ණයක් ලබා නොදීම සම්බන්ධයෙන් කාරක සභාව සිය අප්‍රසාදය පළ කළායි.

d. කාරක සභාවේ නිර්දේශ

අධ්‍යක්ෂවරු සිදු වන සිල්පර හා මේල්පිලි බැහැර කිරීම හා නිසි පරිදි ස්ථානගත කිරීමට සැලසුමක් කාරක සභාව වෙත ලබා දිය හැකි වෙනවානුව පිළිබඳව සති 03ක් ඇතුළත (24.12.2025 වන විට) කාරක සභාව දැනුවත් කරන බවට ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව සමඟ එකඟ විය.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

- මහව හා අනුරාධපුර අතර දුම්රිය මාර්ගය අලුතින් ඉදිකිරීමේදී රාත්තල් 80 වර්ගයේ මේල් පිලි මීටර් 111,195.67ක්, රාත්තල් 90 වර්ගයේ මේල්පිලි මීටර් 22,474.63ක් හා කොන්ක්‍රීට් සිල්පර 85,719ක් මහව - අනුරාධපුර දුම්රිය මාර්ග කොටසෙන් ගලවා ඉවත් කෙරුණු බවත්,

- අද දින වන විට, ඉහත ගලවා ඉවත් කළ ද්‍රව්‍යවලින් සැලකිය යුතු කොටසක් මවෙනත් මාර්ග කොටස් සංවර්ධනා හා පුනරුත්ථාපන කටයුතු සඳහා බැහැර කර ඇති අතර, දැනට බැහැර කිරීම සඳහා පවතින්නේ රාත්තල් 80 වර්ගයේ පිලි මීටර් 72,330.42ක්, රාත්තල් 90 වර්ගයේ පිලි මීටර් 3,672.89ක් හා කොන්ක්‍රීට් සිල්පර 55,041ක් පමණක් වන බවත්,

- දුම්රිය මාර්ගයේ පාලම අවත් වැඩියා කටයුතු, දිවවා සුළි කුණාටුවෙන් පසුව තාවකාලිකව පිළිසකර කරන ලද දුම්රිය මාර්ග කොටස්වල වැඩි කටයුතු නිම කිරීම හා අලින්ට හමින් කිරීම සඳහා කාසීකොටේ පුදේශයේ ඉදිකරනු ලබන උමං පාලමේ ඉදිකිරීම් කටයුතු සඳහා එම ගලවා ඉවත් කරන ලද මකාටස් භාවිතයට ගන්නා බවත්, ඇතුළත් වාර්තාවක්, MT/04/14/03/01-2025 (Vol-ii) හා 2026.02.16 දිනැති ලිපිය මඟින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

- මෙහි සම්පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීමට MT/04/14/03/01-2025 හා 2025.12.17 දිනැති ලිපිය මඟින් කාල දීඝුවක් ඉල්ලා ඇති අතර එය 2026.06.30 දක්වා PS/LEG/COPA/02/Dept/(10)/04 හා 2026.01.05 දිනැති ලිපිය මඟින් ලබා දී ඇත.

07) මහව සිට අනුරාධපුරය දක්වා වූ කොටසෙහි සංඥා පද්ධතිය.

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.05.09

a. සාකච්ඡා කරන ලද කරුණු (ව්‍යාපෘතිපති නිරීක්ෂණ අනුව)

මෙම මාර්ගය ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී මහව සිට අනුරාධපුරය දක්වා වූ කොටසෙහි සංඥා පද්ධතිය මෙම කොන්ත්‍රාත් විෂය පථයෙහි ඉවත් කර මාර්ග පද්ධතිය ඉදි කිරීම සඳහා පමණක් කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණද, එහි සංඥා පද්ධතිය ඊට සමගාමීව ආරම්භ කර නොනිමුණු බවත්, දුම්රිය ධාවනය 2025 අගෝස්තු මස සංඥා පද්ධතිය හොඳැකිව ආරම්භ කර තිබූ බවත් සංඥා පද්ධතිය ඉදි කිරීම ආරම්භ කර නොනිමීම හේතුවෙන් දුම්රිය මාර්ග පැයට කිලෝමීටර 100 ක වේගයෙන් පවත්වා ගැනීමෙ අපහසුතා තළඳ මෙම ගැටලුව හේතුවෙන් වේගය පැයට කිලෝමීටර 60 කට ආසන්න ප්‍රමාණයකින් දුම්රිය ධාවනය වීමෙන්, දුම්රිය මාර්ගය ඉදි කිරීමෙන් ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු අත්කර ගැනීමට නොහැකි වී තිබෙන බව විගණනය වීසින් පෙන්වා දෙන ලදී.

b. ප්‍රධාන ගණුන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණුන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම

දුම්රිය මාර්ගයේ එම කොටසෙහි සංඥා පද්ධතියට අදාළ ව්‍යාපෘතිය 2025 වසරේ මැයි (කාරක සභාව පැවැත්වූ මාසයේදීම) ආරම්භ කිරීමට කටයුතු සලසා ඇති බවත් දැනට සංඥා මෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් සෙහරන්ගම, කලාවි, ගල්ගමුව යන දුම්රිය ස්ථාන සඳහා මූලික සංඥා ක්‍රමයක් ලබා දී ඇති බවත් මහව - ඔමත්ත දක්වා දුම්රිය මාර්ග ඉදි කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂක කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය.

c. කාරක සභාවේ නිරීක්ෂණ

මෙම මාර්ගය ඉදිකිරීමේ ආරම්භක සැලැස්මට සංඥා පද්ධතිය ඇතුළත් කර නොනිමීමෙන් වියදම වැඩි වී ඇති බවත් නිවැරදි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර මේවැනි ව්‍යාපෘති ආරම්භ කිරීම ගැටලුකාරී තත්ත්වයට හේතු වී ඇති බව කාරක සභාව වීසින් නිරීක්ෂණය කරන ලදී.

d. කාරක සභාවේ නිර්දේශ

මෙම විගණන කරුණු සඳහා කාරක සභාව වීසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි.

සංඥා ව්‍යාපෘතිය මේ වන විට ආරම්භ කර ඇත. 2026 වසර තුල නිම කරනු ලැබේ. දැනට ප්‍රගතිය 30% ක් පමණ වේ.

ඇ. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

අදාළ නොවේ.

08) වන අලි දුම්රියේ ගැටීම.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.05.09</u>

a. සංනිවේදන කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

වන අලි අනතුරු අවම කර ගැනීම සඳහා වනජීවී දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව 2018 ඔක්තෝබර් 11 දින සිට 15 දින දක්වා සමීක්ෂණයක් සිදුකර වනඅලි දුම්රියේ ගැටුණු ස්ථාන හා වනඅලි දුම්රිය මාර්ගයේ ගැවසෙන ස්ථාන පිළිබඳව අධ්‍යයනයක් සිදුකර තිබුණත් වනඅලි ගැටීම් අවම කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් දුම්රියේ වන අලි ගැටීමෙන් වන අනතුරු වර්තමානය වන විට මහත් මෙදවාවහයක් බවට පත්ව ඇති අතර 2020 වර්ෂයේ සිට 2024 දක්වා වූ අවුරුදු 05 ක කාලය තුල දුම්රියේ ගැටීම් නිසා මිය ගිය වන අලි සංඛ්‍යාව 53ක් ද තුවාල ලද වන අලි සංඛ්‍යාව 17ක් වාර්තා වී ඇති බව විගණකය විසින් ඉදිරිපත් කරන ලදි.

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම

පසුගිය වසර 25ක කාල සීමාවෙදී වන අලි දුම්රියේ ගැටීමෙන් මරණ 138 ක් වාර්තා වී ඇති බවත්, අලි ඝාතවලට විශාල විසිරියක් පවතින බවත්, විසංයෝජිත සිදු කළ කාලසීමාව තුළ මෙය ප්‍රවර්ධනය වී ඇති බවත් එහි ව්‍යාපෘති අධ්‍යක්ෂක කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය.

මෙම ගැටළුවට විසඳුම් ලෙස අලින්ට මංරු වීමට හැකියාව ඇතිව මීටර් 5 ක් පමණ උසකින් උමං මාර්ග ඉදිකිරීම්, නව නිපැයුම්කරුවන්ගේ සංඝමිය සමඟ සාකච්ඡා කර විසඳුම් සෙවීම් වැනි දීඝකාලීන විසඳුම් ද, නව බලවේග කට්ටල හැඩගස්වා මඟින් කෙටි දුරකදී දුම්රිය නවත්වා ගැනීමට සැලැස්වීම්, දෙපස වන පෙදෙස් කපා ඉවත් කිරීම මඟින් හොඳින් මාර්ගය දර්ශනය වීමට සැලැස්වීම, අලි ඝාවිමංරු වන ස්ථාන දර්ශනය කරමින් තිබූ හෑම පුවරු රියදුරු මහතුන්ට හොඳින් දර්ශනය වනසේ පිළිසකර කිරීම හා වන අලි ගැවසෙන ස්ථාන සම්බන්ධයෙන් වනජීවී දෙපාර්තමේන්තුවෙන් සිදු කරනු ලබන දැනුවත් කිරීම් වලට රියදුරන් සහභාගී කරවීම වැනි කෙටි කාලීන ක්‍රියාමාර්ග ද දැනට හඳුන්වා දී ඇති බව ගණන්දීමේ නිලධාරී කාරක සභාව හමුවේ ප්‍රකාශ කර සිටියේය.

ආතර් සී.ක්ලාක් මධ්‍යස්ථානය සමඟ ඒකාබද්ධව දුම්රිය එන්ජින් සඳහා Thermal Camera සවි කිරීමට අමාත්‍යාංශයෙන් ප්‍රසම්පාදනය සඳහා අනුමැතිය ලැබී ඇත.
M Class දුම්රිය එන්ජින් සඳහා Head Light ලෙස LED බල්බ සවි කිරීම.

දුම්රිය මාර්ගය දෙපස වන අලි ගැවසෙන ස්ථානයන්හි වන අලි ගැවසෙන බව දැක්වෙන සංඥා පුවරු සවිකර ඇති අතර, එම සංඥා පුවරු නිරන්තරයෙන්ම නිසි ආකාරයට ඉදිරියට පවත්වාගෙන යනු ඇත.
දුම්රිය මාර්ගය වෙත කළු ගල් යෙදීමේදී, වන අලි දුම්රිය මාර්ගය හරහා ගමන් ගන්නා ස්ථානයන්හි වන අලින්ට පහසුවෙන් මාර්ග හරහා ගමන්කළ හැකි පරිදි, ඒ සඳහා ප්‍රමුඛත්වයක් ලබා දී කළු ගල් යෙදීම සිදුකර ඇත.

එසේම දුම්රිය මාර්ගය දෙපස අඩි 15ක් පමණ ප්‍රමාණයක් දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් කැළෑ එලිපෙහෙලි කිරීම සිදුකර ඇති අතර, ඉදිරියටද එම කටයුතු අඛණ්ඩව සිදුකරගෙන යනු ලබයි. ඉන් ඔබ්බට වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් එම කටයුතු සිදු කරන ඇත.

මේ වන විට රියදුරුට වඩාත් පහසුවෙන් වන අලි ගැවසීම නිරීක්ෂණය කළ හැකිවීමට සහ තිරිංග යෙදීමේ හැකියාව අනුව බලවේග කට්ටල යෙදවීමට කටයුතු කර ඇත.

රියදුරන් සහ සෙසු මෙහෙයුම් නිලධාරීන් සඳහා අමතර දැනුම ලබා දීමේ වැඩසටහන් වන ජීවී දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ.

c. කාරක සභාවේ නිරීක්ෂණ

මෙම අනතුරු ඇලක්වා ගැනීමට ඉක්මින් ක්‍රියාමාර්ග ගතයුතු බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

d. කාරක සභාවේ නිර්දේශ

මෙම විගණනය කරුණු සඳහා කාරක සභාව විසින් නිර්දේශයන් ඉදිරිපත් නොකෙරිණි.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

අදාළ නොවේ.

09) දෙපාර්තමේන්තුවට අයවිය යුතු හිඟ ආදායම් අය කර ගැනීම.

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.05.09

a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

දුම්රියෙන් ග්‍රැෆිටි ප්‍රවාහනය වෙතුවෙන් සියෑම් සිටි සිමෙන්ති (ලංකා) සමාගමෙන් 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ආදායම් රු.2,187,326ක් බවත්, දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම වෙතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට ආයතන 31 කින් රු.169,769,006ක මුදලක් හිඟ වශයෙන් ඇති අතර ඉන් ආයතන 20 කින් ලැබිය යුතු රු.23,457,706ක මුදල් වර්ෂ 07 සිට 44 දක්වා පැරණි ශේෂයන් බවත්, 2024 දෙසැම්බර් 31 දිනට ඇති දුම්රිය බලපත්‍ර හිඟ ආදායම් රු.1,256,596,206කින් අතර දුම්රිය දෙපාර්තමේන්තු බඩු ගබඩා ආදායම්, ස්ථාවර වත්පත්‍රාගෝර, වෙළඳ දැන්වීම්, ප්‍රචාරණය හා සුළු වෙළඳ කැල් සම්බන්ධයෙන් හිඟ ආදායම් රු.519,930,236ක් වන බවත්, දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම වෙතුවෙන් 2021 වර්ෂය අවසාන වන විට ආයතන 47 කින් රු.140,784,351ක් ද, 2020 වර්ෂයේ දුම්රිය බලපත්‍ර හිඟ ආදායම් රු.848,334,880ක් ද, 2020 වර්ෂයේ වෙනත් හිඟ ආදායම් රු.556,205,725ක් සහ කඩ කාමර හා බඩු ගබඩා 03 ක හිඟ කුලිය රු.36,790,032ක් ද වශයෙන් රු.1,582,114,988ක්ද වන බව විගණනය විසින් පෙන්වාදෙන ලදී.

b. ප්‍රධාන ගණුන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණුන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම

2023 රජයේ මිණුම් කාරක සභාවේදී ලබා දුන් නිර්දේශයකට අනුව නරස් සටහන් ක්‍රමය භාවිතා කරමින් මුදල් අය කර ගැනීම දැනට සිදු කරනු ලබන

2024.12.31 දිනට ඇති දුම්රිය බලපත්‍ර හිඟ ආදායමෙන් 2026.03.31 දින වන විට රු.756,855,260.88ක හිඟ මුදලක් නිරවුල් කර ගෙන ඇත. ඉන් 2022 වර්ෂයට අදාළව රු.370,948,611.10ක් ද 2023 වර්ෂයට අදාළව රු.82,905,386.28ක මුදලක් ද 2024 වර්ෂයට අදාළව රු.303,001,263.50ක මුදලක් නිරවුල් කර ඇත. තව දුරටත් 2024.12.31 දිනට පැවැති හිඟ ආදායමෙන් 2026.03.31 දිනට රු.499,740,945.12ක හිඟ මුදලක් නිරවුල් කිරීමට ඇත.

- කාරක සභාවේ නිර්දේශයේ සඳහන් දුම්රිය බලපත්‍ර හිඟ ආදායම්වල වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී (බලපත්‍ර හා වෙළඳ) විසින් කටයුතු කරනු ලබයි.

- එසේ වුවද, විගණන කරුණු සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය පහතින් සඳහන් කරමි.

අතර එමඟින් 2024 වසරේ රු. මිලියන 3283ක් ද (98%ක්) 2023 වසරට අදාළ බලපත්‍ර 2845 අතුරින් 2641ක හිඟ මුදල් ද අයකර ගැනීමට හැකියාව ලැබී ඇති බවත්, පසුගිය වසර කිහිපය තුළ රජයේ ආයතනවලට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් හිඟ බලපත්‍ර ගෙවීම් අයකර ගැනීමට නොහැකි වූ බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරී කාරක සභාව හමුවේ ප්‍රකාශ කර සිටියහ.

එමෙන්ම වෙළඳ දැන්වීම් ප්‍රචාරණය සම්බන්ධයෙන් 2000 වසරේදී යම් ආයතනයක් සමඟ ගිවිසුම් ගත වුවද එම ගිවිසුම් ප්‍රකාරව මුදල් නොගෙවීම් හේතුවෙන් නීතිමය කටයුතු සඳහා යොමු වී ඇති බවත්, දෙපාර්තමේන්තු අවසරයකින් තොරව බදුල්ල දුම්රිය ස්ථානයේ වීදුරු කාමර සඳහා පෙන්ඩර් ලබා දීම සම්බන්ධයෙන් අදාළ නිලධාරියාට එරෙහිව චීනය පියවර ගෙන ඇති බවත් දුම්රිය දෙපාර්තමේන්තු නිලධාරීන් කාරක සභාව හමුවේ ප්‍රකාශ කළහ.

එමෙන්ම දුම්රිය දෙපාර්තමේන්තුවේ ඇති ආදායම් උපයන වත්කම් පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වාගෙන යන බවට ප්‍ර.ග.නි ප්‍රකාශ කර සිටියේය.

c. කාරක සභාවේ නිරීක්ෂණ

දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය, දුම්රිය බලපත්‍ර ගෙවීම්, කඩ කාමර හා බඩු ගබඩා කුලිය හා වෙනත් කටයුතු වෙනුවෙන් දෙපාර්තමේන්තුවට අය විය යුතු හිඟ ආදායම් අයකර ගැනීමේ ක්‍රියාවලියක් පවතින බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

d. කාරක සභාවේ නිර්දේශ

දුම්රිය බලපත්‍ර හිඟ ආදායම්වල වර්තමාන තත්ත්වය පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් විගණකාධිපතිගේ වෙත ලබා දෙන ලෙස දෙපාර්තමේන්තුවේ ප්‍ර.ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළාය.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

දුම්රිය බලපත්‍ර හිඟ ආදායම්වල වර්තමාන තත්ත්වය පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් M/04/14/03/01-2025 හා 2025.06.04 දිනැති ලිපියට අදාළ වාර්තාවේ ඇමුණුම් 07 මඟින් කාරක සභාවට ඉදිරිපත් කර ඇත.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වාණිජ) කාර්යාලයට අදාල ආදායම්වල 2024.12.31 දිනට මුළු හිඟ ආදායමෙන් රු. 18,158,521.81ක මුදලක් 2025 වර්ෂය තුළ අයකර ගෙන ඇත.

ඒ අනුව අයවිය යුතු ඉතිරි මුදලින් වෙළඳ දැන්වීම් ප්‍රචාරණය වෙනුවෙන් 2022.12.31 දිනට අයවිය යුතු හිඟ මුදල රු. 427,746,229.50ක් වන අතර එම හිඟය අයකර ගැනීම සඳහා පහත සඳහන් නීතිමය පියවර ගෙන ඇත.

i. ස්කේලින් හෝල්ඩින්ග් පුද්ගලික සමාගමෙන් අයවීමට ඇති හිඟ මුදල වන රු.425,500,000.00ක මුදල අයකර ගැනීම සඳහා බෙරුම්කරණ මණ්ඩලයක් වෙත යොමු කළ යුතු බව නීතිපතිතුමා විසින් දැනුම් දී ඇත. නීතිපති දෙපාර්තමේන්තුවේ දැනුම් දීම මත මෙම ආයතනය පිලිබඳව සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලද Annual Return යොමු කර ඇත.

ii. ස්ටාර්ගේට් හෝල්ඩින්ග්ස් ආයතනයෙන් අය විය යුතු රු.1,209,000.00ක මුදල අයකර ගැනීම සඳහා ගරු. නීතිපතිතුමා විසින් චිත්තිකරුවන්ට එරෙහිව කොළඹ ගරු. දිසා අධිකරණයේ අංක : DMR/6787/2019 යටතේ නඩුවක් පවරා ඇත.

iii. නේෂන් අවුට්ඩෝ මීඩියා ආයතනයෙන් අයවීමට ඇති රු. 177,600.00ක මුදල අයකර ගැනීම සඳහා චිත්තිකාර පාර්ශ්වය වෙත ගරු. නීතිපතිතුමා විසින් අංක : DMR/2643/2023 යටතේ නඩුවක් පවරා ඇත.

iv. වැනල්සර්ච් ඉනොවේටිව්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයෙන් අයවීමට ඇති රු.499,779.50ක හිඟ මුදල අයකර ගැනීම සඳහා චිත්තිකාර පාර්ශ්වය වෙත ගරු. නීතිපතිතුමා විසින් අංක : DMR/384/2022 යටතේ නඩුවක් පවරා ඇත.

නිව් මීඩියා ඒෂියා හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමෙන් අය විය යුතු රු.362,250.00ක හිඟ බදු මුදල අය කර ගැනීම වෙනුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සහ නීති උපදෙස් සඳහා ගරු. නීතිපතිතුමා වෙත යොමු කර ඇත.

ඉතිරි හිඟ මුදල අයකර ගැනීම සඳහා මෙතෙක් ගනු ලැබූ ක්‍රියාමාර්ග පහත දක්වා ඇත.

01. ආසන්නතම වසරවල හිඟයන් සඳහා ගෙවීම් කරන ලෙස පරිහරණකරුවන් වෙත දන්වා ඇත.

02. හිඟ මුදලෙන් කොටසක් ඇප තැන්පතුවෙන් හිලව් කර ඉතිරි මුදල ගෙවන ලෙස පරිහරණකරුවන් වෙත දන්වා ඇත.

03. ඉහත පරිදි දන්වා ඇතත් පරිහරණකරුවන් හිඟ මුදල් නොගෙවන්නේ නම් අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා අවසන් නිවේදන යොමු කර ඇත.

04. අවසන් නිවේදනයට ප්‍රතිචාර නොදක්වන පරිහරණකරුවන්ට නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීති අංශය වෙත යොමු කිරීම.

මේ වන විට පවත්නා 2024.12.31 දිනට හිඟය අය කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

I. 2024 වර්ෂයට අදාල හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා මසක් ඇතුලත හිඟ මුදල් ගෙවන ලෙස පරිහරණකරුවන් වෙත දැනුම් දීම.

II. 2024 වසරට පෙර හිඟ මුදල් වෙනුවෙන් බදුකරුවන් වෙත අවසන් නිවේදන යැවීම හා අවසන් නිවේදනය ප්‍රතිචාර නොදැක්වුවහොත් අදාල දේපල පවරා ගැනීමට කටයුතු කිරීම.

III. පවරා ගන්නා දේපල වෙනුවෙන් ලැබිය යුතු හිඟ අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට කටයුතු කිරීම

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.11.27</u>

a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

2020 වර්ෂයේ දුම්රිය බලපත්‍ර ගිණුම ආදායම් රු. 848,334,880 ක් අයකර ගෙන නොතිබීම සම්බන්ධයෙන් කමිටුව සාකච්ඡා කළ අතර දුම්රිය බලපත්‍ර ගිණුම ආදායම් වල වර්තමාන පැත්තටය පිළිබඳ කොරතුරු ඇතුළත් වාර්තාව 2025 ජූනි 03 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති බවත්,

දුම්රිය බලපත්‍ර ගිණුම ආදායමට අදාළව, බලපත්‍ර 1 ගිණුම් අනුව 2020 දෙසැම්බර් 31 දිනට පවතින ශේෂය රු.769,194 ක් වූ අතර එය 1987 ට පෙර සිට පවතින ශේෂයක් බවත්, ඒ සම්බන්ධ ලේඛන මේ වන විට සොයා ගැනීමට නොහැකි බවත් දන්වා තිබුණු බවත්,

බලපත්‍ර 2 ගිණුමේ 2025 සැප්තැම්බර් 30 දිනට හිඟ ශේෂය රු.956,110,609ක් බවත්, වාර්තාවේ දක්වා ඇති බව විගණනය වියහින් පෙන්වා දෙන ලදි.

b. ප්‍රධාන ණයගැති දීමේ නිලධාරී (ප්‍ර.ණ.නි.) / ණයගැති දීමේ නිලධාරීගේ (ණ.නි.) කරුණු පැහැදිලි කිරීම්

එදින වන විට හිඟ බලපත්‍ර ආදායම් රුපියල් මිලියන 986ක් වන බවත් වැඩිම ප්‍රතිශතය දකුණු පළාත් අධ්‍යාපන අදහාරාමිකරුවට දැරිය යුතු බවත්, එය රුපියල් මිලියන 103ක් වන බවත්, මේ සම්බන්ධයෙන් අදාළ ආයතන ලිඛිතව දැනුවත් කර ඇති බවත්, පළමුව මෙම වර්ෂයේ හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට ද පසුව පෙර වර්ෂවල හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කිහිකෑදීම් සිදුකරන බවත්, 2025 වර්ෂයට අදාල හිඟ මුදල මෙම වර්ෂය තුළම අය කර ගැනීමට කටයුතු කරන බවත්, මෙම හිඟ මුදල් අයකර ගැනීමට හාණ්ඩාගාරයේ සහාය ද ලබා ගැනීමට අපේක්ෂා කරන බවත් ණ.නි. ප්‍රකාශ කර සිටියේය.

දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරිනිය ප්‍රකාශ කර සිටියේ 2016 වසරේ සිට හිඟ මුදල් පවතින බවත්, සම්භර ආයතනවලින් ලැබුණු චෙක්පත් උපලේඛයි වූවා දැයි බැලීමට කිසිදු පද්ධතියක් දැනට නොමැති බැවින්, නැවත මානවක් ඒවා පරීක්ෂා කොට යාවත්කාලීන කොරතුරු ලබා ගැනීමට දැනට සාකච්ඡා කර ඇති බවත්ය.

c. කාරක සභාවේ නිරීක්ෂණ

හාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර හිඟ මුදල් අය කර ගැනීම් සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර ගත යුතු බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

බලපත්‍ර බිල්පත් ගිණුමේ 2025 සැප්තැම්බර් 30 දිනට පැවැති රු.956,110,609/-ක හිඟ මුදලෙන් 2026.03.31 දින වන විට රු.281,345,602/-ක මුදලක් අය කර ගැනීමට හැකියාව ලැබී ඇති බව පෙන්වා දෙමි.

මේ සම්බන්ධයෙන් 2026.03.31 දිනට ප්‍රගතිය ඇතුළත් වාර්තාව ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත යොමු කිරීමට කටයුතු කර ඇති බව ද දන්වා සිටිමි. (ඇමුණුම 02)

d. කාරක සභාවේ නිර්දේශ

භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර හිඟ මුදල් අය කර ගැනීමට ක්‍රමවේදයක් සකස් කර මසක් ඇතුළත (31.12.2025 වන විට) කාරක සභාවට ඉදිරිපත් කිරීමට ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව සමඟ එකඟ විය.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

MT/04/14/03/01-2025 හා 2026.01.05 දිනැති ලිපිය මඟින් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව පළමුව ආයතන 12ක් තෝරාගෙන එම ආයතනවලට අදාළව 2025/11/27 දිනට පැවති රු.406,830,587.00 ශේෂයෙන් රු.75,833,816.00ක මුදලක් (18.61% ප්‍රතිශතයක්) අයකරගෙන ඇත. අනෙකුත් ආයතනවලට අදාල හිඟ ශේෂයන් රු.105,999,100.00ක් අය කර ගැනීමට හැකිවිය. කාරක සභාව පවත්වා මාසයක කාලයක් තුල හිඟ මුදල රු.181,832,915.87කින් අඩු කර ගැනීමට හැකිවී ඇත.

10) දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්/ දේපල ඇතුළත් දත්ත පද්ධතියක් ස්ථාපිත නොකිරීම්/ දේපල නිසි පරිදි ලේඛනගත නොකිරීම.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.05.09</u>

a. සංකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්/ වත්කම් සිළිඛඳව දත්ත ඇතුළත් කොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම පිළිබඳ වාර්තාවක් 2024 අගෝස්තු 05 දින වනවිට කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත් දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල අනවසර පදිංචිවීම් හා ලියාපදිංචිවීම් සංඛ්‍යාව පිළිබඳව සකස් කළ සම්පූර්ණ වාර්තාවක් 2024 සැප්තැම්බර් 15 දින වන විට කාරක සභාව වෙත යොමු කරන ලෙසත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් 2024 වසරේ පැවති කාරක සභාවේදී නිර්දේශ කර තිබූ අතර, 2024 සැප්තැම්බර් 18 වන දින අදාළ වාර්තාව ඉදිරිපත් කර තිබුණු බව විගණනය විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී. එමෙන්ම අනවසර පදිංචිකරුවන් ලියාපදිංචි කර ගැනීම සඳහා ප්‍රවේශපත් දැන්වීම් පල කර ස්වේච්ඡාවෙන් ලියාපදිංචි වීමට අවස්ථාව ලබාදී තිබුණද, සියලුම අනවසර පදිංචිකරුවන් හඳුනාගැනීමේ ක්‍රමවේදී වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණු බවත්, මාර්ගෙන ක්‍රමය බස්සේ ලියාපදිංචි වී ඇති පරිහරණකරුවන් නියමානුකූල කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර, 2024.09.11 වන විට ලියාපදිංචි වී ඇති සංඛ්‍යාව 2646ක් බවත් විගණනය විසින් පෙන්වා දෙන ලදී.

- කාරක සභා නිර්දේශයේ සඳහන් දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් සම්බන්ධයෙන් ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කර්මාන්ත) විසින් ක්‍රියා කරනු ලබන අතර අනවසර පදිංචිවීම් සහිත ඉඩම් හා එම ඉඩම් අනවසරයෙන් භුක්ති විඳිනුයේ කවුරුන් ද සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලබන්නේ අධිකාරී (දුම්රිය ආරක්ෂක සේවය) විසිනි.
- 2025.12.31 දින වන විට සක්‍රිය බදු ගිවිසුම් සහිතව බදු ලබා දී ඇති දුම්රිය රක්ෂිත ඉඩම් කොටස් සංඛ්‍යාව 63ක් වන අතර දුම්රිය ඉඩම් මඟින් 2025 වර්ෂයේ දී රු.295,200,714.19ක ආදායමක් දුම්රිය දෙපාර්තමේන්තුව විසින් උපයා ගෙන ඇත.

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයට බණිජතෙල් පිරවුම්හල් පවත්වාගෙන යාම සඳහා බදුල්ල, කොටගල, කුරුණෑගල, මාතර, පේරාදෙණිය, හපුතලේ, අනුරාධපුර, සරසවිඋයන යන ස්ථානයන්හි මැනුම් කටයුතු අවසන්කර අදාල සැළසුම් සකස්කර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ) වෙත යොමු කර ඇත.

මධ්‍යකලපුව දුම්රිය රක්ෂිත ඉඩම් කොටසෙහි මැනුම් කටයුතු සිදුකර සතියක් තුළ අදාල සැලසුම් ලබා දීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

b. ප්‍රධාන ඉංජිනේරු (ප්‍ර.ඉ.නි.) / ඉංජිනේරු නිලධාරීන්ගේ (ඉ.නි.) කරුණු පැහැදිලි කිරීම්

පැරණි සිතියමගත කිරීමක් පැවතිය ද නදාසන්න දුම්රිය ස්ථාන ආසන්නයේ පමණක් නව සීමිටල් සිතියම්ගතකරණයක් සිදුකර ඇති බව දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් සිතියම්ගත කිරීම සම්බන්ධව එහි ඉංජිනේරියා ප්‍රකාශ කර සිටියේය.

c. කාරක සභාවේ නිරීක්ෂණ

දෙපාර්තමේන්තුව සතු දේපල/ඉඩම් නිවැරදිව හඳුනාගෙන ලේඛනගත කිරීම් සිදු කළ යුතු බවත් එම දේපල තුලී/බදු පදනමට ලබාදීමෙන් දෙපාර්තමේන්තුවට ලබාදිය අදායමක් උපයා ගැනීමේ හැකියාව පවතින බවත් අපේක්ෂා දුන් කාරක සභාව අනවසරයෙන් භුක්ති විඳිනු ලබන ඉඩම්/දේපල වලින් එම අනවසරකරුවන් ඉවත් කිරීම හෝ බදු අයකිරීම් සිදු කළ යුතු බව නිරීක්ෂණය කරන ලදී.

d. කාරක සභාවේ නිර්දේශ

දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් පිළිබඳ පහත කරුණු ඇතුළත් සවිස්තර වාර්තාවක් මාස 3ක් ඇතුළත (2025.08.11 දින වන විට) කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස අමාත්‍යාංශයේ ප්‍ර.ඉ.නි./ඉ.නි වෙත කාරක සභාව නිර්දේශ කළේය.

- දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් පිළිබඳ තොරතුරු
- ඒ අතුරින් බදු පදනම් මත ලබා දී ඇති ඉඩම් හා ඉන් ලබන ආදායම් පිළිබඳ තොරතුරු
- ඒ අතුරින් අනවසර පදිංචිවීම් සහිත ඉඩම් හා එම ඉඩම් අනවසරයෙන් භුක්ති විඳිනුයේ කවුරුන්ද යන්නාදී තොරතුරු

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්, බදු පදනම් මත ලබා දී ඇති ඉඩම්, අනවසර පදිංචිවීම් සහිත ඉඩම් හා එම ඉඩම් අනවසරයෙන් භුක්ති විඳිනුයේ කවුරුන්ද යන්නාදී තොරතුරු පිළිබඳ වාර්තාව MT / 04 / 14 / 03 / 01-2025 හා 2025.08.12 දිනැති ලිපිය මඟින් කාරක සභාවට ඉදිරිපත් කර ඇත. එහිදී දුම්රිය රක්ෂිතවල සිටින අනවසර පදිංචිකරුවන් කවුරුන්ද යන්න හඳුනාගත හැකි වනුයේ දුම්රිය රක්ෂිත ඉඩම් සියල්ල මැනුම් කටයුතු සිදු කිරීමෙන් පසුවය. මේ සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවේ මැනුම් නිලධාරීන් ප්‍රමාණවත්

- එසේම, අංක:NA.3837/MISC/2026 හා 2026.05.08 දිනැති ලිපිය මඟින් අදාල ඉන්වොයිස් පෙට්‍රෝලියම් ආයතනය වෙත යොමු කර ඇති අතර අදාල ගෙවීම් සිදු කරන ලෙසද දන්වා ඇත. (එම ලිපියේ පිටපතක් මේ සමඟ ඇමුණුම 03 ඇත.)

- කාරක සභා නිර්දේශයේ සඳහන් දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් සම්බන්ධයෙන් ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කර්මාන්ත) විසින් ක්‍රියා කරනු ලබන අතර අනවසර පදිංචිවීම් සහිත ඉඩම් හා එම ඉඩම් අනවසරයෙන් භුක්ති විඳිනුයේ කවුරුන් ද සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලබන්නේ අධිකාරී (දුම්රිය ආරක්ෂක සේවය) විසිනි.

- 2025.12.31 දින වන විට සක්‍රීය බදු ගිවිසුම් සහිතව බදු ලබා දී ඇති දුම්රිය රක්ෂිත ඉඩම් කොටස් සංඛ්‍යාව 63ක් වන අතර දුම්රිය ඉඩම් මඟින් 2025 වර්ෂයේ දී රු.295,200,714.19ක ආදායමක් දුම්රිය දෙපාර්තමේන්තුව විසින් උපයා ගෙන ඇත.

පොරොත්තු බැරීම් මුදල් අමාත්‍යාංශය මඟින් කෘෂිකර්මය, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ මහේක්ෂාදෝරුවරුන් ඉල්ලා ඇති අතර මාස 06ක් ඇතුළත මානව සම්පත් සම්පූර්ණ කර මැතුම් කටයුතු සිදු කරනු ලබන ආකාරය පිළිබඳ සැලැස්මක් සකස් කර ඉදිරිපත් කර ඇත.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

a. සංකවිජා කරන ලද කරුණු (ඒගණකාධිපති නිරීක්ෂණ අනුව)

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් (CPSTL) ආයතනයට බණිජතෙල් පිරවුම්හල් පවත්වාගෙන යාම සඳහා බදුල්ල, කොටගල, කුරුණෑගල, මාතර, පේරාදෙණිය, පලුතරඳ, අනුරාධපුර, සරසවි උයන හා මඩකලපුව යන ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ රක්ෂිත ඉඩම් 09 ක් බදු ගිවිසුම් වලට එළඹීමෙන් තොරව උකහදී තිබුණු අතර 2014 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දිනට අදාල ආයතන වෙතින් අයවිය යුතු රු.125,830,155 ක් වූ හිඟ බදු ආදායම් අයකරගෙන නොතිබුණු බව විගණනය වසින් පෙන්වා දෙන ලදී.

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම

නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව ගණන් දීමේ නිලධාරියා ප්‍රකාශ කළේය.

c. කාරක සභාවේ නිරීක්ෂණ

ඉඩම්/ගොඩනැගිලි බදු දීම මඟින් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම අහිමි කර නොගත යුතු බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

d. කාරක සභාවේ නිර්දේශ

දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් බදු දීම සම්බන්ධව පවතින අකාර්යක්ෂමතාවය සිදුදැකීම් සඳහා ගත හැකි ක්‍රියාමාර්ග ඇතුළත් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස දුම්රිය දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා වෙත නිර්දේශ කරන ලදී.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් (වාණිජ) කාර්යාලය වසින් බදු ලබා දී ඇති සක්‍රීය බදු ගොනු ප්‍රමාණය හඳුනා ගැනීම සඳහා එම ගොනු පරිගණකගත කරන ලද

- <u>කාරක සභාවේ නිර්දේශ අනුව කටයුතු කිරීමේ ප්‍රගතිය</u>

වලංගු බදු ගිවිසුමක් සහිත හා රහිත සියළුම ඉඩම් බදු ලිපි ගොනු පිළිබඳ දත්ත සකස් කරන ලද පරිගණකගත පද්ධතියට ඇතුළත් කිරීම අවසන් කර ඇති අතර මේ වන විට පද්ධතියට ඇතුළත් කරන ලද දත්ත සත්‍යාපනය කරමින් පවතී. එම කටයුතු අවසන් වීමෙන් පසු පරිගණකගත පද්ධතිය හරහා පරිහරණ බිල්පත් නිකුත් කිරීම ඇතුළු කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.

- <u>සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් සමාගමෙන් (CPSTL) අයවිය යුතු හිඟ බදු ආදායම් :-</u>

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් (CPSTL) ආයතනය වෙත ඉන්ධන තොග ගබඩා සඳහා ලබා දී ඇති දුම්රිය රක්ෂිත ඉඩම් සඳහා රජයේ තක්සේරුව මත 2023.12.31 දින දක්වා අයවිය යුතු හිඟ පරිහරණ බදු මුදල ගෙවා අවසන් කර ඇත.

2024.01.01 දින සිට මෙම දුම්රිය රක්ෂිත ඉඩම් වසර 05ක් 05ට වාර්ෂික බදු මුදල් අළුත් කිරීමේ පදනමින් බදු ලබා දී ඇති අතර 2023.12.31 දිනට වසර 05ක තක්සේරු කාලය අවසන් වී ඇත.

CPSTL ආයතනය රජයේ තක්සේරුවෙන් තොරව ගෙවීම් කිරීම ප්‍රතික්ෂේප කරනු ලබයි. ඒ අනුව සියළුම පරිශ්‍ර සඳහා රජයේ තක්සේරු වාර්තා ලබා ගෙන 2025.12.31 වෙනි දින දක්වා බිල්පත් සකස් කර ගෙවීම් කරන ලෙස CPSTL ආයතනය වෙත දන්වා ඇත.

අතර ඒ අනුව හොතු 6500කට ආසන්න ප්‍රමාණයක් පවතින බව සඳහන් හෙන ඇත. MT/04/14/03/01-2025 හා 2025.11.13 දිනැති ලිපිය මඟින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ, ඉඩම් බදුදීම් ක්‍රමවත් කිරීම සඳහා හඳුන්වා දුන් පරිශෝධක මාදුකාංග අනුව ලබාගත් දත්තයන්ද (ඇමුණුම28 - I) එහි විස්තරාත්මක වාර්තාවද (ඇමුණුම28 -II) ඉදිරිපත් කර ඇත.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.11.27</u>

a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

පෙර පැවති කාරක සභා වීසින් ලබාදුන් නිර්දේශ අනුව, දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්, බදු පදනම් මත ලබාදී ඇති ඉඩම් හා එම්ණින් ලබන ආදායම්, අනවසර පදිංචිවීම් සහිත ඉඩම්, අනවසර භුක්ති විඳින්නන් යනාදී තොරතුරු ඇතුළත් වාර්තාවක් ලබා දී ඇති බවත්, එයට අනුව දෙපාර්තමේන්තුව සතු සමස්ත ඉඩම් ප්‍රමාණය අක්කර 14,129ක් වන බවත්, දුම්රිය මාර්ග, දුම්රිය ස්ථාන, ධාවනාගාර හා කාර්යාල සඳහා අක්කර 8,265ක් වෙන්වී තිබූ බවත්, පවිදුරටත් බදු වශයෙන් ලබා දිය හැකි ඉඩම් ප්‍රමාණය අක්කර 4,395ක් බවත්, පෙන්වා දී ඇත. එසේම මහනු දත්ත අනුව බදු ලබාදී තිබූ ප්‍රමාණය අක්කර 1,520ක් වන බවත්, බදු දීමෙන් 2024 වර්ෂය තුළදී රු.මිලියන 220ක් ද 2025 ජූනි වන තෙක් රු.මිලියන 123ක් ආදායම් ලෙස උපයා ගෙන ඇති බවත්, බදු දෙන ලද ඉඩම්වලට අදාලව නඩත්තු කරන ලිපිගොනු 12,562කින් බදු ඉඩම් 6,305කට අදාළ ලිපිගොනු පරීක්ෂණ් කළමිනාකරණ තොරතුරු පද්ධතියට ඇතුළත් කර නිබෙන බවත්, එහි සඳහන් වන බව විගණනය වීසින් පෙන්වා දෙන ලදී. එමෙන්ම, අනවසර පදිංචිවීම් සහිත ඉඩම් හා අනවසර පදිංචිකරුවන් පිළිබඳ තොරතුරු එම වාර්තාවේ ඇතුළත් නොවන බවත්, විගණනය පෙන්වා දෙන ලදී.

පොලොන්නරුව - කදුරුවෙල දුම්රිය ස්ථානයට යාබද ඉඩමේ සාදා ඇති විකාල දෙමහල් ගොඩනැගිල්ල දීර්ඝ කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අතහැර දමා ඇති බව කාරක සභාවේ අවධානයට යොමු වූ අතර මෙවළඳ අමාත්‍යාංශය මෙම ගොඩනැගිල්ල අදාල මාසික ගෙක්තු ගෙවා "සහොස" ආයතනය පවත්වාගෙන යාමට ඉල්ලුම් කිරීම පිළිබඳව විමසන ලදී.

2024.09.18 වන දින පොලොන්නරුව - කදුරුවෙල දුම්රිය ස්ථානය ඉදිරියේ සිණිවා තිබූ ලීටර් 45, 000කට වඩා තෙල් ගබඩා කළ හැකි තෙල් ටැංකි 3න් මතුපිට තිබූ තෙල් ටැංකි 2ක් ඔක්ටෝබර් කැදවා වීතුණතු ලැබුවත්, එම ටැංකි තවත් අවු.100ක් පමණ භාවිතයට ගත හැකිව තිබූ බවත්, ඊට අමතරව අනෙක් භූගත ටැංකිය ද රඳවෙන යාම හේතුවෙන් ප්‍රදේශවාසීන් වීසින් පොලිසියට පැමිණිලි කළ ද තම දේපලක් වූ බවය රඳකගැනීමට දුම්රිය දෙපාර්තමේන්තුව මගින් කිසිදු ක්‍රියාමාර්ගයක් මේ දක්වා ගෙන නොමැති වීම පිළිබඳව කාරක සභාව විමසීය.

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනට බණිජතෙල් පිරවුම්හල් පවත්වාගෙන යාම සඳහා බදුල්ල, කොටගල, කුරුණෑගල, මාතර, පේරාදෙණිය, හපුතලේ, අනුරාධපුර, සරසවිදයන යන ස්ථානයන්හි මැනුම් කටයුතු අවසන්කර අදාල සැළසුම් සකස්කර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ) වෙත යොමු කර ඇත.

මධකලපුව දුම්රිය රක්ෂිත ඉඩම් කොටසෙහි මැනුම් කටයුතු සිදුකර සතියක් තුළ අදාල සැලසුම් ලබා දීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

එසේම, අංක : NA.3837/MISC/2026 හා 2026.05.08 දිනැති ලිපිය මඟින් අදාල ඉන්ධොයිස් පෙට්‍රෝලියම් ආයතනය වෙත යොමු කර ඇති අතර අදාල ගෙවීම් සිදු කරන ලෙසද දන්වා ඇත. (එම ලිපියේ පිටපතක් මේ සමඟ ඇමුණුම 03 ඇත.)

- <u>**කාරක සභාවේ නිර්දේශ අනුව කටයුතු කිරීමේ ප්‍රගතිය**</u>

1. බදු ගිවිසුමේ භාවිතයන්ට අමතරව බදු ඉඩම් වෙනත් පරිභෝජනයකට යොදා ගන්නේ නම් එම ඉඩම නැවත තක්සේරු කර අදාළ නියමිත බදු මුදල් අයකර ගැනීම සඳහා සකස් කරන ලද සැලැස්ම මගේ අංක : දු.දේ/නි.සා(වා)/පොදු05/විගණන/1198/ ර.ගි.කා.ස./2025 හා 2025.12.26 දිනැති ලිපිය සමඟ ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කර ඇත.

ඉදිරිපත් කරන ලද සැලසුම අනුව සක්‍රීය ඉඩම් බදුකර ලේඛනය අධිකාරී - දුම්රිය ආරක්ෂක සේවය වෙත වත්මන් පරිහරණය තහවුරු කර ගැනීම සඳහා 2025.12.31 දිනැතිව යොමු කර ඇති අතර ඒ අනුව මේ වන විට ඉඩම් කොටස් 10ක පරිහරණ වාර්තා ලැබී ඇත. ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කර ගෙන යන අතර මෙතෙක් පරිහරණ වාර්තා නොලද ඉඩම් කොටස් සම්බන්ධයෙන් 2026.06.01 දිනැතිව සිහිකැඳවීමක් යොමු කර ඇත.

	2. වලංගු බදු ගිවිසුමක් නොමැති ඉඩම් සම්බන්ධයෙන් වලංගු බදු ගිවිසුමක් ඇති කර ගැනීම පිළිබඳව සකස් කරන ලද සැලැස්ම මගේ අංක : දු.දෙ/නි.සා(වා)/පොදු05/විගණන/1198/ ර.ගි.කා.ස./2025 හා 2025.12.31 දිනැති ලිපිය සමඟ ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර ඇත. ඉදිරිපත් කරන ලද සැලසුම අනුව වලංගු බදු ගිවිසුමක් නොමැති සියළුම ඉඩම් බදු ලිපි ගොනු පිළිබඳ තොරතුරු පරිගණකගත පද්ධතියට ඇතුළත් කිරීම අවසන් කර ඇති අතර මේ වන විට පද්ධතියට ඇතුළත් කරන ලද දත්ත සත්‍යාපනය කරමින් පවතී. එම කටයුතු අවසන් වීමෙන් පසු පරිගණකගත පද්ධතිය හරහා පරිහරණ බිල්පත් නිකුත් කරනු ලැබේ. 3. පොලොන්නරුව කදුරුවෙල දුම්රිය ස්ථාන පරිශ්‍රයට යාබද ඉඩමේ අළුතින් ඉදි කර ඇති නිසි ලෙස භාවිතයට නොගන්නා මෙම දෙමහල් ගොඩනැගිල්ල රජයේ ආයතනයකට බදු දීම හෝ වෙනත් වඩාත් වාසිදායක ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් සකස් කළ වාර්තාව මගේ අංක : දු.දෙ/නි.සා(වා)/පොදු05/විගණන/1198/ර.ගි.කා.ස./ 2025 හා 2025.12.26 දිනැති ලිපිය සමඟ ඉදිරිපත් කර ඇත. මෙම දෙමහල් ගොඩනැගිල්ල ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කරමින් ටෙන්ඩර් පත් කැඳවා ව්‍යාපාර කටයුත්තක් සඳහා වසර 05ක කාලයකට මාසික බදු පදනම මත පවත්වා ගෙන යාමට අංක 213, වෙලේ කඩේ, පලුගස්දමන, පොළොන්නරුව යන ලිපිනයේ පදිංචි එම්.එච්.කේ. නිමිනාද මහගෙදර මහතාට රු. 290,000.00 + VAT ක මාසික බදු මුදලකට ලබා දීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් අංක : T.03/DPC/21441 හා 2025.07.01 දිනැති ප්‍රසම්පාදන කමිටු වාර්තාව මඟින් අනුමැතිය ලබා දී ඇත. 2025.09.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රදානය කර ඇති මෙම ගොඩනැගිල්ල 2025.10.09 දින බදුකරු වෙත භාර දෙන ලදී. මෙම ගොඩනැගිල්ල භාර ගැනීමෙන් පසු බදුකරු විසින් තම ව්‍යාපාරයට අවශ්‍ය වන පරිදි ගොඩනැගිල්ල නවීකරණය කිරීම හා වර්ණාලේප කිරීමේ නිම කර තම ව්‍යාපාරික කටයුතු මෙම ගොඩනැගිල්ලෙහි ආරම්භ කරන බව බදුකරු විසින් දන්වා තිබුණි.

b. **ප්‍රධාන ගණුන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණුන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

ඉහතින් සඳහන් කරන ලද බදු ඉඩම් 6,305කට අදාළ ලිපිගොනු, බදු කටයුතු සම්බන්ධ ලිපිගොනු බවත්, බදු ඉල්ලුම් කරන ලද තාවකාලික ලිපිගොනු (ඉල්ලුම්කරු පුනිවාර දක්වා නොමැති) රාශියක් මෙහි ඇතුළත් වන බවත් (ආසන්න වශයෙන් 4000ක් පමණ), අක්‍රිය ලිපිගොනු ද මෙයට අයත් බවත්, ආදායම් ලබන බදුගොනු දක්ක සියල්ලම මේ වනවිට පද්ධතියට ඇතුළත් කර ඇති බවත්, දෙපාර්තමේන්තුවේ කළමනාකරණ තොරතුරු පද්ධතිය 2026 පුති පමණ වන විට සඳා නිම කිරීමට බලාපොරොත්තු වන බවත් එවිට මෙම ගැටළු රාශියකට පිළිතුරු ලබාගත හැකි බවත්, එමඟින් දෙපාර්තමේන්තුවේ ඉඩම් බදු දීමේ කටයුතු කාර්යක්ෂමව කරගෙන යාමට බලාපොරොත්තුවන බවත් නිලධාරීහු පුකාශ කර සිටියහ.

පොලොන්නරුව ආශ්‍රිතව කරන ලද සංවර්ධන කටයුත්තකදී එක්තරා අංකාරයක නිලව් කොඩනැගිල්ලක් ගලස මෙම කොඩනැගිල්ල නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සාදා ඇති බවත්, එය මීට පෙර අවස්ථා දෙකකදී වෙන්ඩර් කැඳවා ගැරිකයට ලබා දුන්නද වෙන්ඩර් ගිම්හකරුට එය පවත්වාගෙන යාමට නොහැකි වූ බවත්, වෙනත් රජයේ ආයතනයකට හෝ ලබා දීමේ ගැටළුවක් නොමැති බවත් නිලධාරීහු පුකාශ කළහ.

තෙල් ටැංකි දුම්රිය දෙපාර්තමේන්තු භූමියේ ස්ථාපනය කර තිබුන ද, ඔනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් දේපලක් බව නිලධාරීහු කාරක සභාව හමුවේ පුකාශ කර සිටියහ.

දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල මැනුම් කටයුතු සිදුකිරීම් සම්බන්ධව විමසුම් කිරීමෙදි එහි නිලධාරීන් පුකාශ කර සිටියේ, දෙපාර්තමේන්තුව සතුව දැනට සිටිනුයේ මිනින්දෝරුවන් 05 දෙනෙකු පමණක් බැවින් ඉදිරියේදී මැනුම් කටයුතු කාර්ය පාර්ශ්වයකට ලබා දීමට කළමනාකරණ හා විගණන කමිටුවලදී සාකච්ඡා කර ඇති බවත්, මැනුම් කටයුතු සිදු කරනු ලබන ආකාරය පිළිබඳ සැලැස්මක් මේ වනවිට සකස් කර ඇති බවත්ය.

c. **කාරක සභාවේ නිරීක්ෂණ**

දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් බදු දීමෙදී, බදු නිවැසුමේ සඳහන් කාර්යයට පරිබාහිරව ඉඩම් භාවිතා කරන්නේ නම්, ඊට ඉඳහිටවා ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව දෙපාර්තමේන්තුව නිසි අවධානයක් යොමුකර නොමැති බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

2026.01.24 දිනැති ලිපියෙන් මෙම දෙමහල් වාණිජ ගොඩනැගිල්ලට අදාල බදුකරය අවලංගු කරන බවට බදු ගැනුම්කරු වෙත දැනුම් දුන් නමුත් ඔහු එම ගොඩනැගිල්ල වෙනුවෙන් තමා විසින් සිදු කර ඇති ආයෝජන පිළිබඳව පැහැදිලි කරමින් ලිපි ඉදිරිපත් කර ඇත.

මෙම වාණිජ ගොඩනැගිල්ල බදු ගැනුම්කරු වෙත බදු ලබා දීමේ දී විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කරමින් ඉදිරිපත් වූ ඉල්ලුම්කරුවන් අතරින් වැඩිම මිල දීමනාව ඉදිරිපත් කළ ඉල්ලුම්කරු වශයෙන් ඔහු තෝරා පත්කර ගෙන බදු ලබා දීමට කටයුතු කර ඇත.

ඉහත කරුණු මත මෙම ගොඩනැගිල්ල නැවත පවරා ගැනීම සිදු කළ හැක්කේ රජයේ සංවර්ධන වැඩපිළිවෙලක් සඳහා අවශ්‍ය වන පදනමින් පමණක් බවත්, එබැවින් මෙම ඉල්ලීම පිළිබඳව තවදුරටත් බලාපොරොත්තු වන්නේ නම් තම අවශ්‍යතාවය පැහැදිලි කරමින් ඒ සම්බන්ධයෙන් පාදේශීය හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කම්ටුවල අනුමැතිය සහිතව රේඛීය අමාත්‍යාංශය හරහා පුවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත විධිමත් ඉල්ලීමක් කරන ලෙසත්, එතෙක් මෙම සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීමේ හැකියාවක් නොමැති බවත් 2026.04.16 දිනැති ලිපියෙන් සී/ස. පොලොන්නරුව දිස්ත්‍රික් සමූපකාර ග්‍රාමීය බැංකු සංගමයේ පුධාන කළමනාකරු/ ලේකම් වෙත දැනුම් දී ඇත.

පොලොන්නරුව කදුරුවෙල දුම්රිය ස්ථාන පරිශ්‍රය ඉදිරියේ තිබූ ලීටර් 45,000ක තෙල් ගබඩා කළ හැකි ටැංකි 03ක අයිතිය හා එම ටැංකි සම්බන්ධයෙන් ගෙන ඇති/ ගැනීමට ඇති ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මගේ අංක : දු.දෙ/නි.සා(වා)/පොදු05/විගණන/1198/ ර.ගි.කා.ස./2025 හා 2025.12.26 දිනැති ලිපිය සමඟ ඉදිරිපත් කර ඇත.

මෙම ඉඩම 1975.05.27 දින අංක 30875 බදු ගිවිසුම මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට (CPC) බදු ලබා දී ඇත. එම ඉඩම කොටස් දෙකකින් සමන්විත වන අතර දුම්රිය මාර්ගය හා පුධාන මාර්ගය අතර කොටස ඉන්ධන පිරවුම් හලක් ලෙස ද දුම්රිය මාර්ගයේ අනෙක් පස ඉඩම ඉන්ධන ගබඩාවක් ලෙස ද පවත්වා ගෙන ගොස් ඇත.

4. මෙම ඉන්ධන ටැංකි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු වත්කමක් වන අතර ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග එම සංස්ථාව විසින් ගනු ලබයි.
5. නිර්දේශ අංක 5 යටතේ සඳහන් කර ඇත්තේ නිර්දේශ අංක 04 හි සඳහන් කරුණම බව දන්වා සිටිමි.

d. කාරක සභාවේ නිර්දේශ

1. බදු ගිවිසුමේ සඳහන්වන භාවිතයන්ට අමතරව බදු ඉඩම් වෙනත් පරිභෝජනයකට යොදා ගන්නේ නම්, එම ඉඩම් නැවත තක්සේරුකර අදාළ නියමිත බදු මුදල් අයකර ගැනීමට සැලැස්මක් පිළියෙළකර මසක් ඇතුළත (31.12.2025 වන විට) කාරක සභාවට ඉදිරිපත් කිරීමට ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව සමඟ එකඟ විය.

2. වලංගු බදු ගිවිසුමක් නොමැති ඉඩම් සම්බන්ධයෙන් වලංගු බදු ගිවිසුමක් ඇතිකර ගැනීම පිළිබඳ සැලැස්මක් මාසයක් ඇතුළත (31.12.2025 වන විට) කාරක සභාවට ඉදිරිපත් කිරීමට ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව සමඟ එකඟ විය.

3. පොලොන්නරුව - කදුරුවෙල දුම්රිය ස්ථාන පරිශ්‍රයට යාබද ඉඩමේ අලුතින් ඉදි කර ඇති, දැනට නිසි බලය භාවිතයට නොගන්නා දෙමහල් ගොඩනැගිල්ල රජයේ ආයතනයකට බදු දීම හෝ වෙනත් වඩාත් වාසිදායක ක්‍රියාමාර්ගයක් සම්බන්ධව සාකච්ඡාකර මසක් ඇතුළත (31.12.2025 වන විට) කාරක සභාවට වාර්තා කිරීමට ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව සමඟ එකඟ විය.

4. පොලොන්නරුව - කදුරුවෙල දුම්රිය ස්ථාන පරිශ්‍රය ඉදිරියේ තිබූ ලීටර් 45,000ක තෙල් ගබඩා කළ හැකි ටැංකි 3හි ඉයිනිය හා එම ටැංකි සම්බන්ධයෙන් ගෙන ඇති/ගැනීමට ඇති ක්‍රියාමාර්ග පිළිබඳව වාර්තාවක් මසක් ඇතුළත (31.12.2025 වන විට) කාරක සභාවට ඉදිරිපත් කිරීමට ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව සමඟ එකඟ විය.

5. පොලොන්නරුව - කදුරුවෙල දුම්රිය ස්ථාන පරිශ්‍රය ඉදිරියේ තිබූ ලීටර් 45,000ක තෙල් ගබඩා කළ හැකි ටැංකි 3හි ඉයිනිය හා එම ටැංකි සම්බන්ධයෙන් ගෙන ඇති/ගැනීමට ඇති ක්‍රියාමාර්ග පිළිබඳව වාර්තාවක් මසක් ඇතුළත (31.12.2025 වන විට) කාරක සභාවට ඉදිරිපත් කිරීමට ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව සමඟ එකඟ විය.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

MT/04/14/03/01-2025 හා 2026.01.05 දිනැති ලිපිය මඟින් වලංගු බදු ගිවිසුමක් නොමැති ඉඩම් සම්බන්ධයෙන් වලංගු බදු ගිවිසුමක් ඇති කර ගැනීමේ සැලසුම් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

11) **හච්සන් ටෙලිකොම්යුනිකේෂන් ලංකා පුද්ගලික සමාගම හා දුම්රිය දෙපාර්තමේන්තුව එක්ව දුම්රිය මාර්ගයේ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.**

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.05.09</u>

a. සාකච්ඡා කරන ලද කරුණු (වීගණකාධිපති නිරීක්ෂණ අනුව)

හච්සන් කොම්යුනිකේෂන් ලංකා පුද්ගලික සමාගමේ යෝජනාවක් මත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ව්‍යාපෘතියකට හවුල්කරු ලෙස සම්බන්ධ වෙමින්, කොම්පඤ්ඤවීදිය දුම්රිය ස්ථානයේ සිට පේරාදෙණිය දුම්රිය ස්ථානය දක්වා (පුත්තලම මාර්ගය කිලෝමීටර් 20 දක්වා) සහ මරදාන දුම්රිය ස්ථානයේ සිට පහතරවඩු දුම්රිය ස්ථානය (කෑගල්ලවැලි මාර්ගය කිලෝමීටර් 30 දක්වා) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග ඔස්සේ Fiber Cables එළීමේ ව්‍යාපෘතියේ කක්ෂගණ, පාරිසරික සහ මූල්‍ය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නිසි ක්‍රමානුකූල අධ්‍යයනයක් සිදු කර නොතිබීම විධිමත් පරිදි මෙතෙනික අනුමැතීන් ද ලබාගෙන ලිඛිත නිර්සුම් වලට එළඹීමට පෙර කාර්යයන් ආරම්භ කර තිබීම, මෙම ව්‍යාපෘතිය යටතේ කේබල් එළීමේ කටයුතු සඳහා කැණීම් කටයුතු සිදු කිරීමේදී පවතින දුම්රිය මාර්ගයේ කේබල් පද්ධතියට හානි සිදුවී තිබීම මත සංඥා පද්ධතියට හානි සිදුවීම, එම හානියට අදාළ අදාහයන් මේ දක්වාත් නක්සේරු කර අදාළ ආයතනයෙන් අයකර ගෙන නොතිබීම හා මේ දක්වා ව්‍යාපෘති ප්‍රගතිය වාර්තා වී නොතිබීම ආදී අඩුපාඩු පවතින බව විගණනය වීසින් පෙන්වා දෙන ලදී.

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

ව්‍යාපෘතියට විධිමත් ලෙස අනුමැතිය ලැබීමට පූර්ව එහි කටයුතු ආරම්භ කර ඇති බව මේ සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයකින් අනාවරණය වූ බවත් එම නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියා කරමින් ඇති බවත් එයට අමතරව මරදාන දුම්රිය ස්ථානයේ සිට සිට පහතරවඩු දුම්රිය ස්ථානය දක්වා වූ දෘශ්‍ය තන්තු (Fiber Cables) එළීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කමිටුවක් පත්කර විමර්ශනයක් සිදුකර සුදුසු තීරණයකට එළඹීමට නියමිත බවත් දුම්රිය සාමාන්‍යාධිකාරී කාරක සභාව හමුවේ අනාවරණය කල අතර, මෙම නීත්‍යානුකූල සත්ත්වය පැහැදිලි කළ එහි ප්‍රධාන සංඥා ඉංජිනේරු ප්‍රකාශ කර සිටියේ කේබල් එළීම සඳහා අවශ්‍යතා ලේකම් වෙතින් අනුමැතිය ලබා ගෙන ඇති බවයි.

කේබල් පවරාගෙන යාමේ නාවුක්කු සේවා ගිවිසුම් නීතිපති වෙත යොමු කර අනුමැතිය ලබාගැනීමට යම් කාලයක් ගත වූ බවත් එම ගිවිසුම් අදාළ වනුයේ

2025.06.27 දින පැවති කාරක සභාවේදී මේ සම්බන්ධයෙන් නැවත සමාලෝචනය කර පුත්තලම මාර්ගයේ කොටස ඉතා ඉක්මනින් නිමා කරන ලෙස දන්වන ලදී.

ඒ අනුව ක්‍රියා කර එම මාර්ගයේ කේබල් එලීමේ කටයුතු නිමා කර ඇත. ගිවිසුමට එළැඹීමට ආසන්නව පවතී.

කේබල් හාවිතය ආරම්භ කළ පසු බැවින් හා කේබල් එලීමට එය අදාළ නොවන බැවින් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත කේබල් එලීම සිදු කළ බවත් ප්‍රකාශ කළ ප්‍රධාන සංඥා ඉංජිනේරු කේබල් නවත්වා කිරීමේ සේවා ගිවිසුම් සඳහා මේ වන විට නීතිපති අනුමැතිය ලැබී ඇති බවත් ප්‍රකාශ කළේය. තවද කැණීම් සිදු කිරීමේදී හානි වී ඇති සංඥා කේබල් සඳහා පාඩුව අයකර ගැනීමට කටයුතු කරන බවත් ඒ සඳහා අදාළ ආයතනය ඒකාබද්ධව පළ කර ඇති බව වැඩිදුරටත් සඳහන් විය.

තවද දුම්රිය දෙපාර්තමේන්තුව සතුව පැවති දෘෂ්‍ය රහැන් පද්ධතිය වසර 50 කට වඩා පැරණි වූ බැවින් නිරන්තර බිඳවැටීම් වැළැක්වීම සඳහා එය නවීකරණය කිරීමේ දැඩි අවශ්‍යතාවයක් දුම්රිය දෙපාර්තමේන්තුවට පැවති බවයිත් හා සවීසත් සමාගම දෘෂ්‍ය තන්තු කේබල ලබාදීමට හා දුම්රිය දෙපාර්තමේන්තුවට අදාළ කේබල් ද ස්ථාපනයට එකඟ වූ බැවින් දෙපාර්තමේන්තුවට විශේෂඥයින් නොවැ එම කාර්ය ඉටු කර ගැනීමට මේමඟින් අවස්ථාව සැලසුණ බවද ප්‍රධාන සංඥා ඉංජිනේරු ප්‍රකාශ කළේය.

c. කාරක සභාවේ නිරීක්ෂණ

ව්‍යාපෘතිය විධිමත් සැලසුම්ගතින් කොරව ක්‍රියාත්මක කර නිමිම සියලුම ගැටළු වලට හේතු වී ඇති බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

d. කාරක සභාවේ නිර්දේශ

සවීසත් ටෙලිකොම්යුනිකේෂන් ලංකා පුද්ගලික සමාගම හා දුම්රිය දෙපාර්තමේන්තුව අතර ඇති කර ගැනීමට නියමිත ගිවිසුම් සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කර කාරක සභාවට වාර්තා කරන ලෙස අමාත්‍යාංශයේ ප්‍ර.ගැ.නි වෙත කාරක සභාව නිර්දේශ කළේය.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

මාගේ අංක ඒ.4373/12/2025(දු.සා.කා) හා 2025/05/27 දිනැති ලිපිය මඟින් අදාළ මූලික විමර්ශන වාර්තාව හා වෙන්දෙසා කෙටුම්පත්‍රය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීම සඳහා ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත්, සවීසත් ටෙලිකොම්යුනිකේෂන් ලංකා පුද්ගලික සමාගම විසින් දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් තුළ එළා ඇති Fiber Optic Cables වලින් තන්තු 4ක් බදු පදනම් මත සවීසත් ටෙලිකොම්යුනිකේෂන් ලංකා පුද්ගලික සමාගම වෙත ලබාදීමට බලාපොරොත්තු වන බවත්,

රාජ්‍ය මිණුම් කාරක සභාව විසින් ලබා දුන් නිර්දේශ සම්බන්ධයෙන් වාර්තා ලබාදීම සඳහා MT/04/14/03/01-2025 හා 2025/05/30 දිනැති ලිපියෙන්

ප්‍රධානත්ව, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ලේකම් වීසින් ප්‍රධානත්ව, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ අතිරේක ලේකම් (සංවර්ධන), අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) හා නීති නිලධාරී ඇතුළත් කමිටුවක් පත් කර ඇති බවත් MT/04/14/03/01-2025 හා 2025/06/04 දිනැති ලිපියෙන් කාරක සභාව දැනුවත් කර ඇත

12) **එන්ජින් සහ බලගැන්වීම කට්ටල අවුරුදු 01 සිට අවුරුදු 08 කට ආසන්න කාලයක් රක්මලාන ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාල පරිශ්‍රයේ හා දුම්රිය නැවතුම්පළ වල නවතා තිබීම.**

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.05.09</u>

a. සංකේතවත් කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

දෙපාර්තමේන්තුවේ සම්බන්ධ දුම්රිය එන්ජින් සහ බලගැන්වීම කට්ටල 267 ක් පවතින අතර ඒවායින් අවුරුදු 40ට වැඩි 90 ක් ද, අවුරුදු 20 ත් 30 ත් අතර 69 ක් ද, අවුරුදු 10 ත් 20 ත් අතර 62 ක් ද අවුරුදු 10 ට අඩු 46 ක් ද වශයෙන් සමන්විත වන අතර එයින් දුම්රිය එන්ජින් 63 ක් සහ බලගැන්වීම කට්ටල 40 ක් අවුරුදු 01 සිට අවුරුදු 08 කට ආසන්න කාලයක් රක්මලාන ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාල පරිශ්‍රයේ හා දුම්රිය නැවතුම්පළ වල නවතා ඇති බවත්, පසුගිය මැදිරි 1662 කින් 2024 වර්ෂයේදී මෙහි මැදිරි 1475 ක් ධාවනයට යොදාගෙන තිබුණු බවත්, ගැල් 1705 කින් ගැල් 816 ක් ධාවනයේ යොදවා තිබුණු බවත් විගණනය වීසින් හෙළිදරව් කරන ලදී.

b. ප්‍රධාන ඉංජිනේ දිනම නිලධාරී (ප්‍ර.ඉ.නි.) / ඉංජිනේ දිනම නිලධාරීන්ගේ (ඉ.නි.) කරුණු පැහැදිලි කිරීම

තාක්ෂණික කාර්ය මණ්ඩලයේ හිඟකම හේතුවෙන් දෙපාර්තමේන්තුව ඉහත අපහසුතාවයට පත්ව ඇති බවත් එළඹෙන සැප්තැම්බර් මස වන විට කාර්ය මණ්ඩල හිඟය අවම කර ගැනීමට කටයුතු කරහු ලබන බවත් ඉංජිනේරිමේ නිලධාරී කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී.

c. කාරක සභාවේ නිරීක්ෂණ

කාර්ය මණ්ඩලයේ හිඟකම අවම කර ගැනීමට ගෙන ඇති පියවර සම්බන්ධයෙන් කාරක සභාව නිලධාරීන්ගෙන් විමසූ අතර, අදාල පියවර හැකි ඉක්මනින් සම්පූර්ණ කළ යුතු බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

එන්ජින් රියදුරන් 103ක් බඳවා ගෙන පුහුණුවට අනුයුක්ත කර ඇත.
අධීක්ෂණ කළමනාකරුවන් 08 දෙනෙකුද, ඉංජිනේරුවන් දෙදෙනෙකු ද , මේ වන විට බඳවාගෙන ඇත.
2025.10.01 දින දුම්රිය කාර්ය සහායක තනතුරු 65ක් කාර්මික අභ්‍යාස ආයතන මඟින් වසර 01ක පුහුණුවට බඳවාගෙන ඇත.
දැනට සිටින දුම්රිය කාර්ය සහායකයින් 662ක් වන අතර, ඉන් 135ක් මේ වන විට රියදුරු සහායක තනතුර සඳහා විභාගයෙන් සමත්ව ඇත. ඉන් තනතුරු 100ක් බඳවා ගැනීමට නියමිතව ඇත.
ඔවුන් එම තනතුරට අනුයුක්ත කළ පසු දුම්රිය කාර්ය සහායක තනතුරු 123ක පුරප්පාඩු සංඛ්‍යාවක් පවතී.

මේ වන විට දුම්රිය දෙපාර්තමේන්තුව සතු දුම්රිය ඇණිය එන්ජින් 267කින් සමන්විත වේ. එය M, W, Y පන්තියේ සමන්විත වන අතර එහි සංයුතිය පහත පරිදි වේ.

Class	Over - 30	20 years – 30 years	10 years – 20 years	Below 10 years
S	20	15	57	38
M	63	16	9	10
W	12			
Y	27			
Total	122	31	66	48

මෙම දුම්රිය ඇණියෙන් 45%කට අධික ප්‍රමාණයක් වසර 30ට වඩා පැරණි වන අතර 18% පමණක් වසර 10ක් පමණ පැරණි එන්ජින් වේ. එබැවින් එතරම් පැරණි එන්ජින් සහිත ඇණියක් නඩත්තු කිරීම විශේෂිත වූ අභියෝගවලින් යුක්ත වූවක් බව සඳහන් කරමි.
තවද වසර 1 සිට 8 දක්වා කාලයක් එන්ජින් 63ක් රක්මලාන අංගනයේ නවතා තිබෙන බවට සඳහන් කළද මේ වන විට පහත දක්වා ඇති පරිදි නවතා ඇති එන්ජින් සංඛ්‍යාව 46කි

S Class				
Chief Mechanical Engineer Sub Department Yard				
Engine NO		Received Date	Repair	
S8	822	2021.12.01	Schedule Repair	
S8	827	2025.07.03	Schedule Repair	
S8	828	2023.01.24	Schedule Repair	
S8	831	2024.06.25	Schedule Repair	
S8	832	2022.05.27	Schedule Repair	
S8	834	2024.04.18	Schedule Repair	W6
S9	850	2023.03.10	Schedule Repair	
S9	853	2023.12.19	Schedule Repair	W6
S10	885	2024.11.20	Schedule Repair	QL 04
S10	893	2024.02.20	Schedule Repair	
S11	907	2025.04.24	Schedule Repair / 12000	
S12	921	2024.07.17	QL 04	
S12	922	2025.05.08	QL 04	
S12	925	2025.05.28	QL 04	

Running Shed			
Engine NO		Received Date	Repair
S10	883	2025.01.06	Heavy Black Smoke /OD for SR
S10	887	2023.09.18	OD for SR
S11	906	2025.05.29	After derailment /Car body repair at HLS
S13	960	2023.05.31	Deficiencies to be fixed
S13	968	2025.02.26	Main fuel suction pipe line gate value to fix rectifier unit defective

M Class			
Engine NO		**Received Date**	**Repair**
M2	628	2024.12.16	Engine Noise Crank shaft defect
M4	745	2024.02.02	Schedule repair
M4	748	2024.04.09	Engine defect Crank shaft defect
M5B	777	2021.12.11	Schedule repair Crank shaft /Engine Block damage
M5C	771	2024.02.07	Schedule repair 30000h (W/S19)
M7	799	2025.07.19	Schedule repair
M8	841	2024.06.18	Engine Defect Main bearing
M8	847	2025.05.07	Engine Defect

ELS MDA & R/Shed DMA			
Engine NO		**Received Date**	**Repair**
M4	743	2025.05.20 (At ELS MDA)	T/motor, Turbo Charger defect Cab modification
M4	744	2024.01.31 (At ELS MDA)	HR Due /Radiator Required
M4	751	2023.04.26 (At ELS MDA)	HR Due
M7	804	2024.10.25 R/Shed DMA	T/motor defect

M9	864	2024.03.12 (At ELS MDA)	Engine Defect
M9	870	2023.08.20 (At ELS MDA)	Mechanical /EL repair
M10A	940	2024.04.30 (At ELS MDA)	Sharp wheel thin tire A/W wheels
M10A	941	2026.03.27 (At ELS MDA)	HR Due
M11	955	2025.03.03 (At ELS MDA)	Sharp wheel thin tire A/W wheels

Stopped for the rehabilitation		
Engine NO		Received Date
S5	717	2021.03.15
S5	718	2021.03.18
S5	719	2021.03.18
M7	800	2023.12.02
M7	809	2017.03.09
M9	865	2022.07.25
M9	871	2009.11.03
M9	873	2017.03.27
M8	842	2020.09.23
M8	844	2023.09.26

d. කාරක සභාවේ නිර්දේශ

මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ලබා නොදෙන ලදී.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

අදාළ නොවේ.

13) දුම්රිය තුළ හා දුම්රිය අංගනවල සිදුවන සොරකම්.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.05.09</u>

a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

අනුරාධපුර වව්නියාව මාර්ගයේ ධාවනය වූ අධි සුඛෝපභෝගී ඉන්දියානු දුම්රිය ද්විත්වය අනුරාධපුර දුම්රිය ස්ථානයට අයත් අංගනයේ නවතා තිබියදී එහි බැටරි, මෝටර් ටයර් වැනි ඉලෙක්ට්‍රොනික උපාංග සොරකම් කරගෙන යාමට කටයුතු කර ඇති බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

b. ප්‍රධාන ගණුන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණුන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම

එක් දුම්රියක් දැනට ධාවනයේ පවතින බවත්, අනෙක් දුම්රිය නැවත ධාවනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටින බවත්, මෙවැනි සිදුවීම් නිරන්තරයෙන් සිදු වන අතර ආරක්ෂක කාර්ය මණ්ඩලය අවම වීම් හේතුවෙන් මෙම කත්තව්‍ය ඉටු වී ඇති බවත්, දුම්රිය ආරක්ෂක සේවයේ කාර්ය මණ්ඩලය අවනීන් බැඳවා ගැනීමට අවසර ලැබී ඇති බැවින් ඉදිරියේදී මෙම තත්ත්වය යම් දුරකට පාලනය කර ගත හැකි වන බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීහු ප්‍රකාශ කළහ.

c. කාරක සභාවේ නිරීක්ෂණ

මෙම සිදුවීම් සිදු වී වසර 3 ක පමණ කාලයක් ගත වුවද අදාළ විමර්ශනයේදී මෙයට වගකිවයුතු පුද්ගලයන් මේ වන තෙක් හඳුනාගෙන නොමැති බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

දුම්රිය තුළ හා දුම්රිය අංගනවල සිදුවන සොරකම් යන ශරීෂය යටතේ 2025.05.09 වන දින විමර්ශනයට ලක් කර ඇති අනුරාධපුරය වව්නියාව මාර්ගයේ ධාවනය වූ අධි සුඛෝපභෝගී ඉන්දියානු දුම්රිය ද්විත්වය අනුරාධපුරයට අයත් අංගනයේ නවතා තිබිය දී එහි බැටරි, මෝටර් ටයර් වැනි ඉලෙක්ට්‍රොනික උපාංග සොරකම් කරගෙන යාමට කටයුතු කර ඇති බව විගණනයට විසින් පෙන්වා දී ඇති නමුත් මෙවැනි සිදුවීමක් පිළිබඳව දුම්රිය ආරක්ෂක සේවයට වාර්තා වී නැත.

2023.01.05 දින සිට 2023.03.08 දින දක්වා අනුරාධපුරය - වව්නියාව මාර්ගය වසා දමා පැවතීම.

2024 වර්ෂයේ ද්විත්ව දුම්රියක් වෙන් කර වායු සමීකරණ පෙට්ටි 02ක් සහිතව වේලාවන් 02ක් යටතේ අංක 4017/4018 ලෙස අනුරාධපුර - කන්කසන්තුරේ දක්වා සේවා වාර පවත්වාගෙන යන ලදි.

අධිසුඛෝපභෝගී ඉන්දියානු දුම්රිය ද්විත්වයක උපාංග සොරා ගැනීම සම්බන්ධ තොරතුරක් අනාවරණය නොවේ.

d. කාරක සභාවේ නිර්දේශ

විමර්ශනය සම්බන්ධ වාර්තාවක් හැකි ඉක්මනින් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කාරක සභාව අමාත්‍යාංශයේ ප්‍ර.ග.නී. වෙත නිර්දේශ කළාය.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

- මේ සඳහා විමර්ශනයට පත්කර තිබූ කමිටුවට විරෝධතා මතුවීම හේතුවෙන් නව විමර්ශන කමිටුවක් පත් කර ඇති බවත්

- මේ වන විට අදාළ දුම්රිය නවත්තු කටයුතු අවසන් කර ඇති අතර මෙම සත්‍ය තුළ පරීක්ෂණ ධාවනයකට කටයුතු සූදානම් කර ඇති බවත්

MT/04/14/03/01-2025 හා 2025/06/04 දිනැති ලිපියෙන් කාරක සභාව දැනුවත් කර ඇත.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.11.27</u>

a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

විමර්ශනය සම්බන්ධව වාර්තාවක් 2025 නොවැම්බර් 14 දින වන විටක් කාරක සභාවට යොමු කර නොතිබුණු බවත්,

මාලිගාවත්ත පෝන් භොදුන්වි අංගනයේ ගැල් කර තිබූ S-13A හා S-5 වර්ගයේ තිපාළු දුම්රිය මැදිරි කවිවල දිරාපත් වීමට ඉඩ හැරීම හා එම මැදිරි කවිවල උපාංග සොරා ගැනීම සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පවත්වා නිර්දේශ ඉදිරිපත් කිරීමට ත්‍රිපුද්ගල කමිටුවක් 2025 මැයි 30 දින පත්කර තිබුණු බවත්,

එම කමිටුව මගින් එම විමර්ශනය සම්බන්ධයෙන් 2025 නොවැම්බර් 07 දින අතුරු වාර්තාවක් ඉදිරිපත් කර තිබූ අතර ඒ අනුව පහත කරුණු දක්වා තිබුණු බවත්,

S-13A මැදිරිවල අවතර කොටස් සොරකම් කර ඇති බවට 2023 පෙබරවාරි 10 දින එහි අධීක්ෂණ කළමනාකරු වාර්තා කර තිබුණ ද පොලිස් පැමිණිල්ලක් කර නොතිබූ බවත්,

මෙම දුම්රිය මැදිරි නවත්තු කරන ඉන්දියානු රයිට්ස් සමාගමේ ඊදුලි ඉංජිනේරුවෙකු වර්ෂ 05 කට අදාළ අයිතමයන් 35 ක් අස්ථානගතවී ඇති

මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීමේ කිසියම් ප්‍රමාදයක් පවතින බව පිළිගනිමි. එයට හේතු වී ඇත්තේ අදාළ සොරකම සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කිරීමේ දී අලාභයට අදාළ ඇස්තමේන්තුව නිවැරදිව සපයා නොතිබීම සහ සැකකරුවා නිදහස් කිරීම නිසා මෙම විමර්ශන කාර්යය ඉදිරියට කරගෙන නොයෑමයි.

මේ සියලු ප්‍රමාදයන් සම්බන්ධයෙන් මූලික විමර්ශන කටයුතු සිදු කරමින් පවතී. ඒ අනුව මේ වන විට අලාභය හඳුනාගෙන ඇති නමුත් ඊට වගකිව යුත්තන් හඳුනා ගැනීම පිණිස මූලික විමර්ශන කමිටුව, කමිටු සාමාජිකයින්ගේ ස්ථාන මාරුවීම් හේතුවෙන් සහ විශ්‍රාම යෑම් හේතුවෙන් අවස්ථා කිහිපයකදීම කමිටුව අහෝසි කිරීමට සහ කමිටුව යළි නම් කිරීමට හා සංශෝධනය කිරීමට සිදුවීම තුළ මෙතෙක් විමර්ශන කටයුතු අවසන් වී නොමැති බැවින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වීමට හේතු විය. මේ වන විට මූලික විමර්ශන කටයුතු අවසන් අදියරේ පවතී. එම විමර්ශන කටයුතු අවසන් වීමෙන් පසු එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දන්වමි.

බවට දැන්වීමෙන් පසු ඒ සම්බන්ධ ස්ථානය පරීක්ෂාවක් කර 2023 මැයි 02 දින දෙමටගොඩ පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් කර තිබූ බවත්,

අධීක්ෂණ කළමනාකරු විසින් 2023 මැයි 19 දින ඉහත අස්ථානගතවීම් වලට අමතරව වර්ෂ 05 කට අදාළ අයිතමයන් 20 ක් අස්ථානගතවී ඇති බවට දක්වා තිබූ අතර ඒ සම්බන්ධයෙන් එදිනම පොලිස් පැමිණිල්ලක් කර තිබුණි. මෙම අයිතමයන්හි අලාභය රු.11,983,404 ක් ලෙසට ඇස්තමේන්තු කර තිබූ බවත්,

අස්ථානගතවූ අයිතමයන්ට අදාළ අලාභයන් සිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් මෙම වන විටත් සකස් කර නොතිබූ බවත්,

අලාභ හානි සම්බන්ධයෙන් මු.රෙ. 101 සිට 110 ප්‍රකාරව හා අභ්‍යන්තර වක්‍රලේඛ අනුව කටයුතු කර නොතිබූ බව, විමණ්ඩනය විසින් පෙන්වා දෙන ලදී.

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම

මෙම දුම්රිය ආගන හැමවිටම වීවෘතව පවතින බවත්, කාර්ය මණ්ඩලය විශාල වශයෙන් සිටීම හේතුවෙන් බොහෝවිට එකිනෙකා හඳුනාගැනීම පවා අපහසු බවත්, එවැනි තත්ත්වයන් යටතේ විශාල වශයෙන් මෙවැනි සොරකම් සිදුවීමට බොහෝ ඉඩකඩ ඇති බවත්, අමාත්‍යාංශය සමඟ කළ සාකච්ඡාවේදී මෙහි ආරක්ෂාවට අභ්‍යන්තර ආරක්ෂක අංශයට අමතරව බාහිර පර්ශ්වයක ද සහභාගිත්ව අවශ්‍ය වන බව අවධාරණය කෙරුණු බවත් ඒ අනුව යම් වැඩපිළිවෙලක් දැනට සකස් කරමින් පවතින බවත්, ග.නි. ප්‍රකාශ කළේය.

c. කාරක සභාවේ නිරීක්ෂණ

දුම්රිය ආගනය විශාල වුවද, ආරක්ෂාවට ප්‍රමුඛතාවය දියයුතු අංශ සඳහා ආරක්ෂාව දැඩි කිරීමේ ක්‍රමවේදයක් සාදා ගත යුතු බවට කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

d. කාරක සභාවේ නිර්දේශ

සමස්ත දිවයින පුරාම ඇති දුම්රිය ආගනවල අභ්‍යන්තර හා බාහිර ආරක්ෂාව සම්බන්ධයෙන් විධිමත් සැලැස්මක් සකස් කර මසක් ඇතුළත (31.12.2025 වන විට) කාරක සභාවට වාර්තා කිරීමට ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව සමඟ එකඟ විය.

මේ සම්බන්ධයෙන් සිදු කරන ලද මූලික විමර්ශන කටයුතු අවසන් අදියරේ පවතින බවත්, විමර්ශන කටයුතු සඳහා පත් කළකමිටුව අවස්ථා කිහිපයක දී සංශෝධන කිරීමට සිදුවීම තුළ මෙතෙක් විමර්ශන කටයුතු අවසන් වී නොමැති බැවින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාදවීමට හේතුවිය.

මාලිගාවත්ත ජෝන් හෝල්ලන්ඩ් අංගනයේ මෙම සොරා ගැනීම් වළක්වා ගැනීම සඳහා 2025.05.19 වන දින 1600 පැයේ සිට ජෝන් හෝල්ලන්ඩ් අංගනයේ ආරක්ෂාව සඳහා දුම්රිය ආරක්ෂක සේවා කාර්යාලයක් ස්ථාපිත කිරීමට පියවර ගන්නා ලදි. එම නව ඒකකය සඳහා දුම්රිය ආරක්ෂක සේවා අපරාධ නිවාරණ ඒකකයේ දුම්රිය ආරක්ෂක නිලධාරීන් 05 දෙනෙකු යෙදවීමට පියවර ගෙන ඇති අතර, දුම්රිය ආරක්ෂක සේවයේ පවතින නිලධාරි ඌනතාවය හේතුවෙන් ඒ සඳහා යොදවන ලද එම නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බැවින් දුම්රිය කාර්ය සහායක සේවක මහතුන් 10ක් ද එම අංගනයේ ආරක්ෂක නිලධාරීන්ගේ සහාය සඳහා රාජකාරි යොදවා ගනිමින් මෙම අංගනයේ ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගෙන ඇති බව දන්වා සිටිමි.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

MT/04/14/03/01-2025 (Vol-ii) හා 2026.02.16 දිනැති ලිපිය මඟින් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

14) දුම්රිය සේවාවන් නිරන්තරයෙන් බිඳ වැටීම හා දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂමතාවය.

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.05.09

a. සංනිවේදන කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ මත්දෘව්‍ය සහ අකාර්යක්ෂම ස්වභාවය එම දෙපාර්තමේන්තුවේ පරිහානියට හා සේවාවන් බිඳ වැටීමට මූලික වී ඇති බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

ප්‍ර.ග.නි./ග.නි වෙතින් මේ සම්බන්ධව කිසිදු පැහැදිලි කිරීමක් නොවීය.

c. කාරක සභාවේ නිරීක්ෂණ

මේ හේතුවෙන් මිහිජනයා විශාල ලෙස අපහසුතාවයට ලක්වීමත්, රජයට විශාල මූල්‍යමය හානියක් ඇති කිරීමටත් බලපා ඇති බව කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

d. කාරක සභාවේ නිර්දේශ

මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

අදාළ නොවේ.

දුම්රිය කට්ටල, දුම්රිය එන්ජින් ලබා දීමෙන් පසු දුම්රිය නියාමකයින් යොදවා උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව දුම්රිය මෙහෙයුම් කටයුතු සිදුකරවනු ලබයි.

මේ වන විට නවක දුම්රිය ස්ථානාධිපතිවරුන් , නියාමකයින් සහ අභ්‍යන්තර උසස්වීම් මගින් කනිෂ්ඨ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කර ඇති අතර, එමගින් සාපේක්ෂව කාර්යක්ෂම දුම්රිය සේවා කටයුතු පවත්වා ගැනීමට කටයුතු කර ඇත.

විමර්ශන නිලධාරීන් (මෙහෙයුම්/වාණිජ) තිදෙනෙකු පමණක් සේවයේ යෙදෙන අතර, මෙම තනතුර සඳහා නවක නිලධාරීන් බඳවා ගැනීමේ කටයුතු අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට සම්මුඛ පරීක්ෂණයේ අවසන්වාර්තාව යොමු කර ඇත. එම නිලධාරීන් බඳවා ගැනීමෙන් පසු මෙම කටයුතු වඩාත් කාර්යක්ෂමව කිරීමේ හැකියාව ඇත.

උපදෙපාර්තමේන්තු අතර, යහපත් අන්‍යෝන්‍ය සබඳතාවයන් නොපැවතීම සහ යම් තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීමේ දී තවදුරටත් ලිපි හුවමාරුව වැනි යල්පැනගිය ක්‍රමවේද තුළ කටයුතු කිරීමට සිදු වේ.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

2017 වසරේ සිට 2024 දක්වා කාලය තුළ, දුම්රිය ප්‍රමාද වී ධාවනය කළ වාර ගණන සැලසුම් කළ වාර ගණනෙන් ප්‍රතිශතය, 46% සිට 64% ක පරාසයක පවතින බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම

පස් කඳු කඩා වැටීම්, ගස් කඩා වැටීම් හා තාක්ෂණික දෝෂ වැනි දෙපාර්තමේන්තුවට පාලනය කළ නොහැකි මිටවලේ හේතූන් ද ඇතැම් අවස්ථාවලදී දුම්රිය ප්‍රමාදයට හේතුවී ඇති බවත්, දුම්රිය එන්ජින් හා මාර්ග පද්ධතීය හා බැඳුනු තාක්ෂණික කරුණු හේතුවෙන් දුම්රිය පරිපාලනය ඉතා අසීරු වන බවත්, දුම්රිය රියදුරු ඇතුලු අනෙකුත් සේවකයන්ගේ හිඟය වැනි හේතු බලපාන බවත්, දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීහු ප්‍රකාශ කළහ.

c. කාරක සභාවේ නිරීක්ෂණ

දුම්රිය වාර අවලංගු කිරීම හා ප්‍රමාද වී ධාවනය කිරීම, සේවා ඵලදායීතාවයට සෘජු බලපෑමක් ඇති කරන බැවින් එම අඩුපාඩු නිවැරදි කර ගැනීමෙන් ඉදිරියේදී වඩාත් කාර්යක්ෂම දුම්රිය සේවයක් ඇති කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව කාරක සභාවේ මතය වීය.

d. කාරක සභාවේ නිර්දේශ

1. දුම්රිය ධාවන කාර්යසාධනය (දුම්රිය ධාවන වාර අවලංගු වීම හා ප්‍රමාද වී ධාවනය කිරීම) සම්බන්ධයෙන් පහත වාර්තා ලබා දෙන ලෙස කාරක සභාව විසින් දුම්රිය දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරී වෙත නිර්දේශ කරන ලදී.

   - දෛනිකව සිදුවන දුම්රිය අවලංගුවීම් හා ප්‍රමාදවීම් පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට

   - මේවැනි සිදුවීම්වලදී ඊට හේතු සාධක වූ කරුණු හා නැවත එවැනි සිදුවීම් ඇතිවීම වළක්වා ගැනීමට ගත හැකි ඉදිරි ක්‍රියාමාර්ග ඇතුළත් වාර්තාවක් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට.

දුම්රිය ප්‍රමාද පිළිබඳ වාර්තා අමාත්‍යාංශය වෙත යොමු කිරීමට දුම්රිය පාලන කාර්යාලය මගින් කටයුතු කර ඇත.

දුම්රිය අවලංගුවීම් සහ ප්‍රමාදවීම් සඳහා ප්‍රධානව බලපා ඇත්තේ දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල නොමැතිවීම සහ මාර්ග සම්බන්ධ ගැටළු වේ.

- දුම්රිය පෙළඟැවීම හා ප්‍රමාදවීම නිසා සිදුවන මෙදෙනික පාසුව පිළිබඳව ඒගණනයක් සිදුකර ඊට අදාළ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට.

2. දුම්රිය පරිපාලනය පිළිබඳව අධ්‍යනයක් සිදු කර අවශ්‍ය ප්‍රතිව්‍යුහගත කිරීම් සිදු කිරීමට පියවර ගත්නා ලෙස ප්‍රධාන ගණකාදිපති නිලධාරියා වෙත සහ ගණකාදිපති නිලධාරී වෙත නිර්දේශ කරන ලදී.

3. පසුගිය වසර 5ක තුළ ඇත්කර ගත් මූලික ප්‍රගතිය පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් කාරක සභාවට ලැබීමට සලස්වන ලෙස දුම්රිය දෙපාර්තමේන්තුවේ ගණකාදිපති නිලධාරී වෙත නිර්දේශ කරන ලදී.

ඉ. **නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

- මෙදෙනිකව සිදුවන දුම්රිය අවලංගුවීම් හා ප්‍රමාදවීම් පිළිබඳව වාර්තාවක් අමාත්‍යාංශයට ඉදිරිපත් කර එහි පිටපතක්,

- වර්තමානයේ ප්‍රමාදයන් හා අවලංගුවීම් අවම කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය තනතුරුවලට අදාළ බඳවා ගැනීම් දැනටමත් සිදුකර ඇති බවත්, ඉදිරියටත් ප්‍රමාදයන් හා අවලංගුවීම් අවම කර ගැනීමට දුම්රිය නියාමක, දුම්රිය රියදුරු සහ ඉංජිනේරුවරුන් බඳවා ගැනීමට කටයුතු කරමින් පවතින බවත්,

- දුම්රිය ඇණිය වැඩි කිරීම සඳහා පෞද්ගලික අංශය සමඟ සම්බන්ධව කටයුතු කර ඇති බවත්,

- මෙදෙනික පාසුව ගණනය කිරීමට අදාළව පරිගණක මෘදුකාංගයක් මේ වන විට සකස් කර ඇති අතර, එහි වැඩිදියුණු කිරීම් කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතින බවත්,

- දුම්රිය පරිපාලනය පිළිබඳව අධ්‍යනයක් සිදු කර අවශ්‍ය ප්‍රතිව්‍යුහගත කිරීම් සම්බන්ධයෙන් 2025/07/14 දින දුම්රිය දෙපාර්තමේන්තුව විසින් පත් කරන ලද කමිටුව විසින් කෙටුම්පත් වාර්තාව සකසා ඉදිරි කටයුතු සඳහා ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කිරීමට නියමිතව ඇති බවත්,

- පසුගිය වසර 5ක තුළ අත්කර ගත් මූලික ප්‍රගතිය පිළිබඳ වාර්තාවත්,

MT/04/14/03/01-2025 හා 2025/11/13 දිනැති ලිපිය මඟින් කාරක සභාවට ඉදිරිපත් කර ඇත.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.11.27</u>

a. සංකලිත කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

මෙදෙනික පාඩුව ගණනය කිරීම සඳහා Estimation of Financial Losses Due to Train Delays & Cancelation. A Methodological Approach for Sri Lanka Railways නමින් වාර්තාවක් සකස් කර තිබුණි. දිනක දුම්රිය ප්‍රමාද කාලය මිනිත්තු 1000ක් ලෙස සලකා දිනක දුම්රිය ප්‍රමාදයේ පාඩුව රු.738,560ක් බවට ගණනය කර තිබුණු බව විගණනය වීසින් කාරක සභාවට දන්වන ලදී.

මෙදෙනිකව සිදුවන දුම්රිය අවලංගුවීම් හා ප්‍රමාදවීම් වලට හේතු සාධක වූ කරුණු හා නැවත එවැනි සිදුවීම් ඇතිවීම වළක්වා ගැනීමට ගත හැකි ඉදිරි ක්‍රියාමාර්ග වාර්තාවේ ඇතුළත් නොවුණු බව විගණනය අපහැදිලි කරන ලදී.

b. ප්‍රධාන ගණුන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණුන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

- දුම්රිය දෙපාර්තමේන්තුවට 911 දෙනෙකු අලුතින් බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලැබී තිබුන ද, ඒ සඳහා ක්ෂණිකව පියවර ගැනීම් අපහසු බවක්, අවුරුදු 2-3ක් ඇතුළත බඳවා ගැනීම් සිදුකළ හැකි බවත්, ප්‍රකාශ කළ ප්‍ර.ග.නි වීහාග දෙපාර්තමේන්තුව මඟින් පැවැත්වූ වීභාගයේදී ප්‍රමාණවත් ලකුණු ලබාගෙන නිවූ පිරිස අවම වීමත්, තාක්ෂණික කිල්ලීන් ඔබතෝ ප්‍රමාණයක් රට හැර දමා ගොස් තිබීමත්, වැනි හේතූන් නිසා බඳවා ගැනීම් ඉතාම අපහසු වී ඇති බවත්,

- බඳවා ගන්නා පිරිස්වල තාක්ෂණික දැනුම වර්ධනය කිරීම සඳහා දීර්ඝ කාලීන පුහුණු වැඩසටහන්වලට යොමු කළ යුතු බවත්, ඒ සඳහා අවුරුදු 2-3ක් පමණ ගත වන බවත්, දෙමටගොඩ සහ රත්මලාන දුම්රිය අංගනයන් මූලික කරගෙන විශේෂ කාර්යසාධන මූලකාංයක් පත් කර ඉදිරි අවුරුදු 5,10 හා 20 වශයෙන් සැලසුම් දැනටමත් සකස් කරන බවත්,

- කට දුම්රිය එන්ජින් ඕලඳි ගැනීම, පවතින දුම්රිය එන්ජින් අලුත්වැඩියාව ඉක්මන් කිරීම වැනි කෙටි කාලීන ක්‍රියාමාර්ග සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇති බවත්,

දුම්රිය ප්‍රමාද පිළිබඳ වාර්තා අමාත්‍යාංශය වෙත යොමු කිරීමට දුම්රිය පාලන කාර්යාලය මගින් කටයුතු කර ඇත.

දුම්රිය අවලංගුවීම් සහ ප්‍රමාදවීම් සඳහා ප්‍රධානව බලපා ඇත්තේ දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල නොමැතිවීම සහ මාර්ග සම්බන්ධ ගැටළු වේ.

දුම්රිය දෙපාර්තමේන්තුවේ 909ක් අලුතින් බඳවා ගැනීම සඳහා ලද අනුමැතිය අනුව එහි ප්‍රගතිය ඇමුණුම් අංක 04 මඟින් දක්වා ඇත.

- 1954 සිට මේ දක්වා දේශපාලන පක්ෂ වලට ආනයනය කරන ලද මුළු දුම්රිය එන්ජින් ප්‍රමාණය 286ක් බවත්, දැනට 277ක් දෙපාර්තමේන්තුව සතුව පවතින බවත්, 12ක් අපහරණය කර ඇති බවත්, එයින් ද ධාවනයට යොදාගත හැකි මට්ටමේ පවතිනුයේ 163ක් බවත්, සාමාන්‍ය දුම්රිය ධාවනයට එන්ජින් 100කට අඩුවන්න ප්‍රමාණයක් අවශ්‍ය බවත්, කටවල 53ක විශාල ප්‍රමාණයේ නවීකරණ පවතින බවත්, සුළු පරිමාණයේ නවීකරණ 58ක් වශයෙන් එන්ජින් 111ක් ධාවනය නොකරන බවත්,

- රියදුරන් 92ක් බඳවා ගැනීමට අනුමැතිය ලැබුණු බවත්, එමඟින් 85ක් දෙසැම්බර් 01 වැනිදා පත්වීම් භාර ගැනීමට නියමිත බවත්,

- දුම්රිය නියාමක පුරප්පාඩු 227ක් සඳහා පැවති විභාගයෙන් 57දෙනෙකු සමත් වූවද, බඳවා ගැනීමේ පරීක්ෂාවට අදාළ අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇත්තේ 12 දෙනෙකු පමණක් බව සම්මුඛ පරීක්ෂණයේදී හඳුනා ගන්නා ලද බවත්,

- දුම්රිය ධාවන ප්‍රමාදවීම් ක්ෂණිකව දුම්රිය මගීන්ට දැන ගැනීම සඳහා සුදුසු ජංගම යෙදවුමක් (Mobile Application) නිසියම් පුද්ගලික කණ්ඩායමක් විසින් RDMNS App නැමැති යෙදවුම් සඳා ඇති බවත්, නමුත් මේ පිළිබඳව වැඩිදුර ඔවුන් සමඟ සංසන්දනය කිරීමට නොහැකි වූ බවත්, ප්‍ර.ඉ.නි/ඉ.නි. ප්‍රකාශ කරන ලදී.

c. කාරක සභාවේ නිරීක්ෂණ

නව නාක්ෂණය සමඟ ගැලපීමේදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට යටත් ජංගම යෙදවුමක් නොමැති වීම ඉතාම පසුගාමී තත්ත්වයක් බවත්, පුද්ගලික කණ්ඩායමක මෙහෙයවීමේවලට යටත්ව මෙය සිදු නොකර දුම්රිය දෙපාර්තමේන්තුව විසින්ම මෙවැනි කාර්යක්ෂම යෙදවුමක් සාදාගත යුතු බවත්, කාරක සභාවේ මතය විය.

d. කාරක සභාවේ නිර්දේශ

දුම්රිය ධාවන ප්‍රමාදවීම් ඉක්මනින් දුම්රිය මගීන්ට දැන ගැනීම සඳහා සුදුසු ජංගම යෙදවුමක් (Mobile Application) සැදීමට අවශ්‍ය මූලික පියවර ගෙන දුම්රිය දෙපාර්තමේන්තුව විසින් නව ජංගම යෙදවුමක් සකස්කර ගන්නේ ද, මෙහෙයවීකල්ප පවතින්නේ ද යන්න සම්බන්ධව විමර්ශනවක් මසක් ඇතුළත (31.12.2025 වන විට) කාරක සභාවට ලබා දීමට ප්‍ර.ඉ.නි./ ඉ.නි. කාරක සභාව සමඟ එකඟ විය.

c. **නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**

"ප්‍රවේශ" Smart Ticketing and Seat Reservation (STSR) පද්ධතිය යටතේ මේ වන විට යෙදවුම් 3ක් සංවර්ධනය කරමින් පවතින බවත්, දුම්රිය කාලසටහන සජීවීව දැක බලා ගත හැකි වන පරිදි තොරතුරු ලබා ගත හැකි වන පරිදි එක සංවර්ධනයට කටයුතු කර ඇති බවත්, MT/04/14/03/01-2025 (Vol-ii) හා 2026.02.16 දිනැති ලිපිය මඟින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

15) **දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සංයුතිය.**

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.05.09</u>

a. **සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

2024 දෙසැම්බර් 31 දිනට දුම්රිය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටම, තාක්ෂණික මට්ටම, ද්විතියික මට්ටම, ප්‍රාථමික මට්ටම, අනියම් හා කොන්ත්‍රාත් යන සේවක කාණ්ඩවලට අයත් මුළු පුරප්පාඩු සංඛ්‍යාව 5943ක් වන බව විගණනය වීසින් පෙන්වා දෙන ලදී.

b. **ප්‍රධාන ගෙණෙන් දීමේ නිලධාරී (ප්‍ර.ගෙ.නි.) / ගෙණෙන් දීමේ නිලධාරීගේ (ගෙ.නි.) කරුණු පැහැදිලි කිරීම්**

දුම්රිය රියදුරු වැනි තනතුරුවල බඳවා ගැනීම් සිදු කළ ද එම නවක සේවකයන් සේවයේ යොදවනු ලබන්නේ වසර 3ක පුහුණු කාලයකට පසුව බවත්, ඒ හේතුවෙන් දැනට දුම්රිය රියදුරු සේවයේ පුරප්පාඩු ද විශාල සංඛ්‍යාවක් පවතින බවත් ඇතැම් සේවාවල සේවක හිඟයක් සඳහා අවම සනීපාරක්ෂක පහසුකම් පවා නොමැතිව දැඩි අපහසුතා මධ්‍යයේ සේවය කරනු ලබන බවත් ප්‍රධාන ගෙණෙන්දීමේ නිලධාරියා කාරක සභාව හමුවේ ඉදිරිපත් කළේය.

c. **කාරක සභාවේ නිරීක්ෂණ**

ප්‍රාමික මට්ටමේ තනතුරුවල 1474 ක සේවක අනිරීක්ෂයක් පැවතිය ද ඉහළ ශ්‍රේණිවල හා තාක්ෂණික සේවාවල පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පවතින බවත්, ඉක්මනින් සේවකයන් බඳවාගෙන පුහුණුකිරීම්වලට යොමු කරවිය යුතු බවත් කාරක සභාවේ නිරීක්ෂණය විය.

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සංයුතියට අදාළ තොරතුරු ඇමුණුම -05

d. කාරක සභාවේ නිර්දේශ මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි. **e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම** අදාළ නොවේ. **16) දුම්රිය මාර්ගයේ පවතින ගැටලු** ❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.05.09</u> **a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)** ඉදුරුව, ගිංතොට, දොඩන්දුව යන පාලම් තුනම වසර 15 - 16ක් පමණ කාලයක් තිස්සේ ගැටලුවකින් කොරව භාවිතා කළද, 2024 වසරේ දී එම පාලම් තුනම නඩත්තු කිරීමට නොහැකි තත්ත්වයට පත්ව ඇති බවත්, කොළඹ කොටුවේ සිට ගාල්ල දුම්රිය මාර්ගයේ M-11, M-10 එන්ජින් සහිත දුම්රිය ඉදුරුව දුම්රිය ස්ථානයේ සිට ධාවනය නාවකාලිකව නවතා ඇති බවත් අනාවරණය විය. **b. ප්‍රධාන ඉංජිනේරු (ප්‍ර.ඉ.නි.) / ඉංජිනේරු (ඉ.නි.) කරුණු පැහැදිලි කිරීම** පාලම් සම්බන්ධයෙන් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සිවිල් ඉංජිනේරු පීඨය මඟින් දැනටමත් පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින බවත්, ප්‍රධාන මාර්ගයේ එම කටයුතු සිදු කර ගෙන යන බවත් හරස් මාර්ගවල පවතින ගැටළු හේතුවෙන් දුම්රිය රියදුරන් අවධානයෙන් යුතින් කිරීම හේතුවෙන් වෙග පාලනයක් සිදු කිරීමට කටයුතු කර ඇති බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු ප්‍රකාශ කර සිටියේය. **c. කාරක සභාවේ නිරීක්ෂණ** සාමාන්‍යයෙන් පාලම් නිර්මාණය කරනු ලබන්නේ වසර 100 ක කාලයකට වන නමුත් ඉහත කී පාලම් අවුරුදු 24 ක වැනි කාලයක් තුළ දිරාපත් වීම යම් අක්‍රමිකතාවයන් හේතුවෙන් සිදු වූවක් ද යන්න සොයා බැලිය යුතු බව කාරක සභාවේ නිරීක්ෂණය විය.	මුහුදුබඩ දුම්රිය මාර්ගයේ කොම්පඤ්ඤවීදිය , පින්වත්ත, ඉදුරුව, අලුත්ගම, ගිංතොට, දොඩන්දුව යන පාලම් ආශ්‍රිතව දැනට වෙග සීමා යොදා ඇති අතර, මෙම පාලම් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් අදාල ඉංජිනේරු සැලසුම් හා ටෙන්ඩර්පත් සකස්කර අවසන් කරමින් පවතී. එසේම ලංසු ඇගයීම් කමිටුව මඟින් දැනට අවසන්කර ඇති පාලම්වල ඇගයීම් කටයුතු සිදුකරමින් පවතී. මෙම වසර තුළ කොම්පඤ්ඤවීදිය, පින්වත්ත, ඉදුරුව, අලුත්ගම යන පාලම් සඳහා කොන්ත්‍රාත් ප්‍රධානය සඳහා කටයුතු සිදුකරමින් පවතින අතර, දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් පානදුර, දොඩන්දුව, වැල්ලවත්ත, හික්කඩුව, යන පාලම් සඳහා ඉංජිනේරු සැලසුම් සකස් කරමින් පවතී. මග්ගොන පාලම සඳහා ටෙන්ඩර් කැඳවා ඇති අතර, ඉදිරි මාසය තුළ කොන්ත්‍රාත් ප්‍රධානය කිරීමට කටයුතු කරනු ඇත මේ වන විට කොළඹ කොටුවේ සිට ගාල්ල දක්වා M 10, M 11 එන්ජින් වෙග සීමා සහිතව ධාවනය වේ.

d. **කාරක සභාවේ නිර්දේශ**

මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි.

e. **නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම**
අදාළ නොවේ.

17) **පැරණි කැලණිය දුම්රිය පාලම ඉදිකිරීමේ හා ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය.**

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.05.09

a. **සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

ඔස්ට්‍රියානු අධිකාර යටතේ යුරෝ. 16,600,000ක් වූ කැලණිය පැරණි දුම්රිය පාලම ඉදි කිරීමේ හා සියලු කාර්යය නිමවා (Turnkey) ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියට අනුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය මඟින් 2002 වර්ෂයේදී සිදු කරන ලද සෙසුතා අධ්‍යයන වාර්තාව පරිදි මෙම පාලම 2022 වර්ෂය වන තෙක් භාවිතා කළ හැකි ලෙස වාර්තා කර තිබුණි. පාලම ඉදිරි වසරකින් හෝ දෙකකින් අනිවාර්යයෙන් ඉවත් කළ යුතු වුවත් ඒ සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව හෝ ප්‍රවාහන අමාත්‍යාංශය මඟින් සිදු කළ යුතු ක්‍රියාමාර්ග පිළිබන්ධයෙන් පෙර සූදානමක් හෝ නොමැති අතර සකසනා අධ්‍යයනයක් ද සිදු කර නොතිබුණු බව විගණනයේ නිරීක්ෂණය විය.

b. **ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

මෙම ප්‍රතිස්ථාපනය සඳහා රජයෙන් මුදල් වෙන් වී ඇති බවත්, ඉදිරි මාස 3 ඇතුලත CECB ආයතනයෙන් ලබා දෙන සැලැස්ම හා අනෙකුත් ලේඛන සකස් කර ටෙන්ඩර් කැඳවීමට කටයුතු සැලසුම් කර ඇති බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු ඇතුළු දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ මතය විය.

c. **කාරක සභාවේ නිරීක්ෂණ**

හැකි ඉක්මනින් මෙහි වැඩ කටයුතු ආරම්භ කර අවසානම අවම කර ගැනීමට කටයුතු බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

කැළණි පාලම නවීකරණ ව්‍යාපෘතිය දේශීය මූල්‍ය ප්‍රතිපාදන මත සිදු කිරීමට අවශ්‍ය මූලික සැලසුම්, ටෙන්ඩර් පත්‍රිකා පිළියෙල කිරීම ආදී කටයුතු සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය මඟින් මිලකැඳවුම් ලබා ගැනීමට කටයුතු සිදු කර තිබුනද, ගරු ප්‍රවාහන අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි එම කටයුතු සිදු කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා ඇත.

ඒ අනුව ඉංජිනේරු සැලසුම් හා ටෙන්ඩර් ලියකියවිලි තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කර ඇති අතර, එම කමිටුව මඟින් නිරීක්ෂණ සිදු කිරීමෙන් අනතුරුව, ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

d. කාරක සභාවේ නිර්දේශ

මෙම විගණනය කරුණු සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

අදාළ නොවේ.

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.06.05

a. සංකල්පිත කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

කැලණිය පැරණි දුම්රිය පාලම ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියට අනුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු කණ්ඩායමක් මඟින් 2002 වර්ෂයේදී සිදු කරන ලද ගණනය අධ්‍යයන වාර්තාව පරීදි මෙම පාලම 2022 වර්ෂය වන තෙක් භාවිතා කළ හැකි ලෙස වාර්තා කර තිබුණු අතර, ඒ අනුව මෙම පාලම ඉදිරි වසරකින් හෝ දෙකකින් අනිවාර්යයෙන් ඉවත් කළ යුතු වුවත් ඒ සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව හෝ ප්‍රවාහන අමාත්‍යාංශය හෝ සිදු කළ යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පෙර සූදානමක් හෝ නොමැති අතර, ගණනය අධ්‍යයනයක් ද සිදු කර නොමැති බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

b. ප්‍රධාන ඉංජිනේ දීමේ නිලධාරී (ප්‍ර.ඉ.නි.) / ඉංජිනේ දීමේ නිලධාරීගේ (ඉ.නි.) කරුණු පැහැදිලි කිරීම්

මේ සඳහා දේශීය අවශ්‍යතා වෙත් කර ඇති බව නිලධාරීන් ප්‍රකාශ කළහ. Central Engineering Consultancy Bureau (CECB) ආයතනය මඟින් මිල කැඳවුමක් දැනට ලබා ගෙන ඇති බවත්, සැලසුම්, ටෙන්ඩර් ලියකියවිලි හා ඉංජිනේරු ඇස්තමේන්තුව මේ වන විට ලැබී ඇති බවත් ඊට අදාළ කැබිනට් පත්‍රිකාව දැනටමත් පිළියෙල කර අවසන් බවත් එය එළඹෙන සතිය තුළ කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට හැකි බවත් නිලධාරීහු ප්‍රකාශ කර සිටියහ.

c. කාරක සභාවේ නිරීක්ෂණ

2023 හා 2024 යන වර්ෂ 2 සඳහාම භාණ්ඩාගාර මඟින් ප්‍රතිපාදන වෙත් කර තිබියදීත් දුම්රිය දෙපාර්තමේන්තුව මේ සඳහා සැලැස්මක් හෝ සාදා නොනිබීම ඉදපාර්තමේන්තුවේ අකාර්යක්ෂමතාවය බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

කැළණි පාලම නවීකරණ ව්‍යාපෘතිය දේශීය මූල්‍ය ප්‍රතිපාදන මත සිදු කිරීමට අවශ්‍ය මූලික සැලසුම්, ටෙන්ඩර් පත්‍රිකා පිළියෙල කිරීම ආදී කටයුතු සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය මඟින් මිල කැඳවුම් ලබා ගැනීමට කටයුතු සිදු කර තිබුණද, ගරු ප්‍රවාහන අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි එම කටයුතු සිදු කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා ඇත.

ඒ අනුව ඉංජිනේරු සැලසුම් හා ටෙන්ඩර් ලියකියවිලි තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කර ඇති අතර, එම කමිටුව මඟින් නිරීක්ෂණ සිදුකිරීමෙන් අනතුරුව, ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

d. කාරක සභාවේ නිර්දේශ

මෙදින මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් කිසිදු නිර්දේශයක් ඉදිරිපත් නොකරන ලදී.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

අදාළ නොවේ.

18) රත්මලාන ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාල පරිශ්‍රයෙහි ඌන උපයෝජිත යන්ත්‍ර සූත්‍ර හා අබලි ද්‍රව්‍ය ගොඩගැසී පැවතීම.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

i.ජපන් ආධාර යටතේ ඉදි කරන ලද එන්ජින් අලුත්වැඩියාව සහ පරීක්ෂා කිරීම සඳහා යොදා ගනු ලබන Testing Room
ii.රෑමේනියන් ආධාර යටතේ ඉදි කරන ලද කැන්ත ඉවත් කිරීම සඳහා යොදා ගනු ලබන Shot Blasting Room
iii.ෂීරස් අතට පවී කර ඇති Press Machine

වැනි දුම්රිය දෙපාර්තමේන්තුව සතු යන්ත්‍ර හා යන්ත්‍රාගාර ඌන උපයෝජනය වන බව නිරීක්ෂණය වන බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම

වාර්ෂික අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් දෙපාර්තමේන්තුවට අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගෙන ඇති බව නිලධාරිනු ප්‍රකාශ කළහ.

c. කාරක සභාවේ නිරීක්ෂණ

ඉවත් කළ යුතු තොගවේ පැරණි යන්ත්‍ර සූත්‍ර හා අබලි ද්‍රව්‍ය දුම්රිය වැඩ අංගනවල ගොඩගැසී තිබීම හේතුවෙන් සේවකයන්ට දෛනික සේවා කටයුතු පවත්වා ගෙන යාමට අවශ්‍ය ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම, සුදුසු සේවා පරිසරයක් නොපැවතීම, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දුර්වලතා පැවතීම, අනවශ්‍ය ලෙස අතිරික්ත තොගයක් පවත්වාගෙන යාම මෙන්ම ඇතැම් යන්ත්‍ර, වගකීම් කාලය (warranty period) ඉක්මී යාමෙන් පසුව භාවිතා කිරීම ආරම්භ කිරීම

a යටතේ ඇති සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

i. ඉතා පැරණි යන්ත්‍රයක් වන අතර, දැනට භාවිතා කළ හැකි තත්ත්වයේ නොමැත. මේ පිළිබඳ ගත යුතු ඉදිරි පියවර අධ්‍යයනය කර වාර්තා කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත.

ii. මැදරි සහ එන්ජින් බොඩි අළුත්වැඩියාවට යොදා ගෙන ඇත.

iii. දැනට එම අළුත්වැඩියා කර කර්මාන්තශාලා 39 වැඩ සඳහා යොදවා ඇත.

c. රත්මලාන දුම්රිය අංගනය තුළ ඉවත් කරනු ලබන අබලි ද්‍රව්‍ය ටෙන්ඩර් පටිපාටිය ඔස්සේ විකිණීම සිදු කරනු ලබයි. පසුගිය කාලයේ ඇති වූ කොවිඩ් වසංගතයෙන් පසු අබලි ද්‍රව්‍ය ටෙන්ඩර් කිරීම නවතා තිබූ අතර, එම අබලි ද්‍රව්‍ය ටෙන්ඩර් පටිපාටිය ඔස්සේ විකුණා දැමීම සඳහා පසුගිය වසරෙහි අනුමැතිය හිමි වුණි. ඒ අනුව ටෙන්ඩර් පටිපාටිය ඔස්සේ එම අබලි ද්‍රව්‍ය ඉවත් කිරීමේ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී.

ප්‍රධාන යාන්ත්‍රික උපදෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය EGP හා 2024 නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව සිදු කෙරෙමින් පවතී. පැවති දුර්වලතා මහහරවා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියට අවශ්‍ය වෙනස්කම් සිදුකර යාවත්කාලීන කර ඇත. එමෙන්ම මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සිදු කරන ලද වෙනස් කිරීම් හේතුවෙන් අනවශ්‍ය තොග පවත්වාගෙන යාම හා ප්‍රසම්පදාන ක්‍රියාවලියේ පැවති දුර්වලතා මහහරවා ගැනීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

හේතුවෙන් ගෙවීමකින් තොරව දෝෂ /අඩුපාඩු නිවැරදි කර ගැනීමට නිමූ අවස්ථාව අහිමිවීම වැනි කරුණු කාරක සභාවට නිරීක්ෂණය විය.

d. කාරක සභාවේ නිර්දේශ

මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

අදාළ නොවේ.

19) M – 11 දුම්රිය එන්ජින් මිලදී ගැනීම හා නඩත්තුව

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.06.05

a. සංකේතීය කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

නිසි සැලැස්මකින් තොරව මෙම M - 11 එන්ජින් මිලදී ගැනීමට කටයුතු කර ඇති බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

b. ප්‍රධාන ඉංජිනේ දිනම නිලධාරී (ප්‍ර.ඉ.නි.) / ඉංජිනේ දිනම නිලධාරීගේ (ඉ.නි.) කරුණු පැහැදිලි කිරීම

i. 2019 වර්ෂයේ දී M - 11 එන්ජින් 10 ක් මෙරටට ගෙන්වූ බවත් 2020 වසර අවසන් වන විට මෙම එන්ජින් සියල්ල ආනයනය කර අවසන් කළ බවත්,

ii. එක් එන්ජිමක මිල ඇ.ඩො.මි. 4.2 පමණ වන බවත්,

iii. යම් කාලයක් භාවිතා කිරීමෙන් පසු එම එන්ජින් 10 අක්‍රිය තත්ත්වයට පත් වුවද මේ වනවිට එන්ජින් 8 ක් යථාවත් කර ඇති බවත්, ඉතිරි එන්ජින් 2 ද යථාවත් කිරීමට කටයුතු කරමින් පවතින් බවත්,

iv. එහිදී නඩත්තු අත්පොතෙහි (Maintenance Manual) දක්වා ඇති උපදෙස් අනුව Starter Motor 40 ක් ඇණවුම් කරන ලද බවත්, Starter Motor භාවිතා නොකළේ නම් එන්ජිමට වන හානිය හා ඒ හේතුවෙන් අදාළ සමාගම එකී එන්ජින්වල වගකීමෙන් නිදහස් වීමත් සලකා එම ඇණවුම් සිදු කරන ලද බවත්,

එක් එන්ජිමක් බැර අලුත්වැඩියාන් සඳහා රත්මලාන වෙත යවා ඇත.
මේ වන විට එන්ජින් 04ක් ධාවන තත්ත්වයේ පවතී.

එන්ජින් 04ක රෝද ගෙවී යාම නිසා රෝද මාරු කිරීමට අංගනයේ නවතා ඇත.
එක් එන්ජිමක වායු සමීකරණ පද්ධතිය අලුත්වැඩියා කරමින් පවතී.

එන්ජින් නඩත්තුව සඳහා ගෙන්වන ලද උපාංගවලට වැය වූ මුදල (සේවක ගෙවීම් නොමැතිව) ඉදිරිපත් කරමි.

Cost Of Spares of M 11 Locomotives		
Motive Power Sub Department		
1	2020	Rs. 21,537,890.90
2	2021	Rs. 1,217,125.00
3	2022	Rs. 4,497,345.00
4	2023	Rs. 119,722,541.76
5	2024	Rs. 15,794,665.20

v. අත්තනෝමතික සඳහන් ක්‍රමවේදයට නඩත්තු කටයුතු සිදු කිරීමෙන් M - 11 එන්ජින් අවුරුදු 18 ක් පමණ භාවිතා කළ හැකි අතර එවැනි නඩත්තු කිරීම, අලුතින් එන්ජින් මිලදී ගැනීමට වඩා ලාභදායී බවත්,

නීලධාරීහු ප්‍රකාශ කර සිටියහ.

c. කාරක සභාවේ නිරීක්ෂණ

දුම්රිය උපාංග/යන්ත්‍ර සූත්‍ර පිළිබඳ දක්ෂ ඇතුළත් යාවත්කාලීන නොරතුරු පද්ධතියක් නොතිබීම හේතුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවේ ගබඩාවල පවතින භාණ්ඩ නිවැරදි ලෙස වාර්තාවීමක් සිදු නොවන බවත් එය නිවැරදි තීරණ ගැනීමට විශාල බාධාවක් වී ඇති බව කාරක සභාවේ නිරීක්ෂණය වීය.

d. කාරක සභාවේ නිර්දේශ

i. M-එන්ජින් 11ක් මිලදී ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව විමර්ශනයක් සිදුකර වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරීයා වෙත නිර්දේශ කරන ලදි

ii. මෙම එන්ජින් මිලදී ගැනීමට පෙර වූ මුදල් හා නඩත්තුව සඳහා මේ වනවිට දරා ඇති වියදම් පිළිබඳව පරීක්ෂා කර බලා කාරක සභාව වෙත වාර්තා කිරීමට දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරීයා වෙත නිර්දේශ කරන ලදි.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම.

i. දුම්රිය දෙපාර්තමේන්තුවේ 05 අවුරුදු සැලැස්ම යටතේ හදුනාගත් අවශ්‍යතාවයක් වන අශ්වබල 2300 – 3200 වියුලි ඩීසල් එන්ජින් 10ක් මිලදිගැනීම් ඉන්දියානු ණය පහසුකම (Indian credit line) යටතේ සිදු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවත්,

ii. තරඟකාරී ක්‍රමය යටතේ ලංසු කැඳවීමට ලංසු ලේඛණ පිළියෙල කර ඇති අතර, ඉන්දියානු ණය පහසුකම යටතේ මිල ගණන් ඉදිරිපත් කරන්නේ ඩී/ස රයිට් සමාගම විසින් පමණක් බව ඉන්දියානු රජය විසින් දැනුම්දීමත් සමඟ එම ආයතනයෙන් ඉදිරිපත් කළ මිල ගණන් සහ පිරිවිතර දුම්රිය දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි සකසා ගැනීම සඳහා පැහැදිලිකිරීම් ලබා ගැනීමෙන් පසු ව්‍යාපෘති කමිටුවේ නිර්දේශය සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවේ නිරීක්ෂය අමාත්‍ය

මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසුව අග්වබල 2300 – 3200 දීදුලි ඩීසල් ජන්සීන් (M 11) 10ක් මිලදී ගැනීමට කටයුතු කර ඇති බවත්,

iii. ජන්සීන් මිලදී ගැනීමට වැය වූ මුදල හා නඩත්තුව සඳහා මේ වනවිට දරා ඇති වියදම්ත්,

MT/04/14/03/01-2025 හා 2025.11.13 දිනැති ලිපිය මඟින් ඉදිරිපත් කර ඇති විෂ්තරවලට, ඇමුණුම 09 යටතේ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

20) **දුම්රිය ආසන වෙන් කර ගැනීම හා සම්බන්ධ මොෂිටෙල් ආයතනය සමඟ පැවති ගිවිසුම.**

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

M පාසන වෙන් කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සිමා සමින සමාගමේ (පෞද්ගලික) සමාගම සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව අතර එළඹ තිබූ ගිවිසුම 2023 දෙසැම්බර් 31 දින අවසන් වී තිබූ නමුත් අදාල ගිවිසුම යාවත්කාලීන කිරීමට හෝ නව ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබීයදී M ආසන වෙන් කිරීමට අදාල ගාස්තු සමාගමේ ආයතනයේ ගිණුමකට බැර වන බව විගණනය වීසින් පෙන්වා දෙන ලදී.

b. ප්‍රධාන ගණුන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණුන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම

නව ගිවිසුම් සඳහා නීතිපති අනුමැතිය ලැබී ඇති බවත්, අදාළ ආයතනයට ගිවිසුම් ගත වීමට රුපියල් මිලියන 18ක පෙන්පතුවක් අවශ්‍ය බව දන්වා ඇති බවත්, ඔවුන්ගේ එකඟත්වය ලැබුණු වහාම ගිවිසුම් අත්සන් කිරීමට සුදුසුකම් කර ඇති බවත්ය. එම ආයතනයෙන් මේ දක්වා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතු සියලු මුදල් ලැබී ඇති බවත් ගණුන් දීමේ නිලධාරියා ප්‍රකාශ කළේය.

c. කාරක සභාවේ නිරීක්ෂණ

දුම්රිය දෙපාර්තමේන්තුව හැකි ඉක්මනින් මේ සම්බන්ධ ගැටලුව විසඳා ගත යුතු බව කාරක සභාවේ නිරීක්ෂණය වීය.

- මෙම විගණන කරුණ සම්බන්ධයෙන් කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් කර නොමැති බව දන්වා සිටිමි.

- එසේ වුවද, විගණන කරුණ සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය පහතින් සඳහන් කරමි.

මොබිටෙල් ආයතනය හා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව අතර M දුම්රිය ආසන වෙන් කිරීම සම්බන්ධයෙන් අත්සන් කළ යුතු නව ගිවිසුම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද අතර බදු කොන්දේසි සම්බන්ධයෙන් දෙපාර්ශ්වය එකඟතාවයට පැමිණීමෙන් අනතුරුව 2025.10.01 දින සිට 2027.12.31 දින දක්වා කාලයට බල පැවැත්වෙන පරිදි සකස් කර ලද නව ගිවිසුමට 2026.01.19 දින දෙපාර්ශ්වය විසින් අත්සන් තබන ලදී.

එහිදී මොබිටෙල් ආයතනය විසින් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත තැබිය යුතු ඇප තැන්පතු මුදල රු. මිලියන 02 සිට රු. මිලියන 06 දක්වා වැඩි කරන ලද අතර මෙතෙක් මොබිටෙල් ආයතනය ''එකතු කරන ලද මුදල් සතිපතා දුම්රිය දෙපාර්තමේන්තුවට බැර කළ යුතුය'' වූ කොන්දේසිය, ''එකතු කරන ලද මුදල් සතියේ වැඩ කරන බැංකු දින දෙකක් තුළ දුම්රිය දෙපාර්තමේන්තුවට බැර කළ යුතුය'' ලෙස සංශෝධනය කරන ලදී. 2025 ඔක්තෝබර් මස සිට එලෙස මුදල් දෙපාර්තමේන්තුවට බැර කිරීම ආරම්භ කරන ලදී.
M ආසන වෙන් කිරීමට අදාල ගාස්තු දුම්රිය දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුමට බැර කිරීමේ කටයුතු නිසි ලෙස සිදු වන්නේ දැයි අධීක්ෂණය කිරීම ප්‍රධාන මූල්‍ය නිලධාරි විසින් සිදුකෙරෙන බව දන්වමි.

d. කාරක සභාවේ නිර්දේශ

මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

අදාළ නොවේ.

21) දුම්රිය මඟින් ගුණුගල් ප්‍රවාහනය සඳහා දුම්රිය එන්ජින් හා රියදුරන් ලබා දීම වෙනුවෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීම.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

a. සංකේතිය කරන ලද කරුණු (මූල්‍යකළමනාකරණ නිරීක්ෂණ අනුව)

දුම්රියෙන් ගුණුගල් ප්‍රවාහනය වෙනුවෙන් සියයුම සීට් සිමෙන්ති (ලංකා) සමාගමෙන් 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බව හිඟ ආදායම රු.2,187,326ක් වන බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

b. ප්‍රධාන ගණුන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණුන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

පුත්තලම, කුරුවිත්තාරු ප්‍රදේශයේ පෞද්ගලික සීමෙන්ති නිෂ්පාදනාගාරයකට ගුණුගල් ප්‍රවාහනය සඳහා දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් හා රියදුරන් කුලී පදනම මත ලබා දුන් බවත්, එයට අදාල ගෙවීම් සඳහා ඉන්වොයිස්පත් ඉදිරිපත් කිරීමෙදී දුම්රිය එන්ජින් ප්‍රයෝජනයට ගත්තේ කාල සීමාවන් ද නගරීම සඳහා ඇතුළත් කර තිබීම හේතුවෙන් අදාල සමාගම විසින් එකී මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කර තිබූ බවත් පසුව වැඩිපුර අයකර නිබූ මුදල් අඩු කර සංශෝධිත ඉන්වොයිස්පත ලැබීමෙන් අනතුරුව එම මුදල් මේ වනවිට ගෙවා අවසන් කර ඇති බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ නීලධාරීන් විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී.

c. කාරක සභාවේ නිරීක්ෂණ

සමාගම වෙත ලබා දෙන දුම්රිය එන්ජින් ආපසු භාරදීමේදී සටහන්කළ නොකිරීම හා නිසි අධීක්ෂණයක් සිදු නොකිරීම මෙම තත්ත්වයට හේතු වී ඇති බව කාරක සභාවේ මතය වීය. එමෙන්ම කාලය වාර්තා වන ක්‍රමවේදයක්

- මෙම විගණන කරුණ සම්බන්ධයෙන් කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් කර නොමැති බව දන්වා සිටිමි.
- එසේ වුවද, විගණන කරුණ සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය පහතින් සඳහන් කරමි.

INSEE ආයතනය විසින් දෙපාර්තමේන්තු දුම්රිය එන්ජින් අවශ්‍ය වූ විට දී ඒ සඳහා ඉල්ලීම් කරන අතර ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් දුම්රිය එන්ජින් ලබා දීම සිදු කරයි. දුම්රිය එන්ජිම අදාල අංගණයෙන් පිටත් වූ වෙලාවේ සිට නැවත පැමිණීම දක්වා ගතවන කාලය සඳහා ගාස්තු ගණනය කරනු ලබයි. දුම්රිය එන්ජිම සඳහා දිනකට කුලී මුදලක් නියම වන බැවින්, ආයතනය විසින් INSEE දුම්රිය එන්ජිමෙහි නඩත්තුවට ගත වන කාල සීමා හැර අනෙක් කාලය භාවිතයට ගැනීම අපේක්ෂා කරයි.

දෙපාර්තමේන්තුව මඟින් දුම්රිය එන්ජිම සඳහා දෛනික ගාස්තු මත බිල්පත් ඉදිරිපත් කිරීමෙන් පසුව INSEE ආයතනය විසින් ගාස්තු ගණනයට යටත් වන කාල සීමා තුළ දුම්රිය එන්ජිම භාවිතා නොකළ කාල සීමා පවතින බව දැනුම් දීම හිඟ මුදල් නිර්මාණය වීම සඳහා හේතු වී ඇත.

මෙම ගැටළුව නිරාකරණය සඳහා දුම්රිය එන්ජිමක් කුලී පදනම මත INSEE ආයතනය වෙත ලබා දීමෙන් පසුව දුම්රිය එන්ජිම භාවිතයට නොගත් කාල සීමා පවතී නම් දෛනිකව INSEE ආයතනය මඟින් එම කාල සීමා ලබා ගැනීමට කටයුතු කරනු ලබයි. එම කාල සීමා ප්‍රධාන ඉංජිනේරු (ධාවනබල)ගේ නිර්දේශය වෙත යොමු කරන අතර ප්‍රධාන ඉංජිනේරු (ධාවනබල)ගේ නිර්දේශය අනුව කටයුතු කිරීමට INSEE ආයතනය එකඟතාවයකට පැමිණ ඇත.

2022.10.12 වෙනි දිනෙන් පසුව INSEE ආයතනය විසින් දුම්රිය එන්ජින් කුලී පදනම මත ලබා ගෙන නොමැති බව දන්වමි.

සහසා නිවැරදි කාලයන් ඇතුළත් ඉන්වොයිස්පත් අදාළ සම්භාරම වෙත යැවීමේ අවශ්‍යතාවය අවධාරණය කළේය.

d. කාරක සභාවේ නිර්දේශ

මෙම විගණන කරුණු පදනම් කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

අදාළ නොවේ.

❖ <u>විමර්ශනය කරන ලද දිනය 24.11.27</u>

a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

අරුවක්කාරු දුම්රිය ස්ථානයේ සිට දුම්රියෙන් ගුණුගල් ප්‍රවාහනය වෙතුවෙන් සියලුම සිටී සිමෙන්ති (ලංකා) සමාගමෙන් අයවිය යුතු බව හිතා ආදායම් පිළිබඳව ගත ක්‍රියාමාර්ග හා එහි ප්‍රගතිය පිළිබඳව විගණනය ප්‍රශ්න කරන ලදී.

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

සිමෙන්ති සංස්ථාව පුද්ගලීකරණය කිරීමත් සමඟම රිට අයත් දේපල සියල්ල පුද්ගලික ආයතනයන් සතු වූ බවත්, කැණීනට මණ්ඩල සිරණයකට අනුව දුම්රිය දෙපාර්තමේන්තුව හා පුද්ගලික සිමෙන්ති සමාගම (සියලු සිටී) ගිවිසුම්ගතව ප්‍රවාහනය කරන ගුණුගල් වටෙන් 01කට නොඅඩු පාරිභෝගික මිල දර්ශකයට අනුරූපව මිල ගණන් නියම කරගෙන අදාළ මුදල්, දුම්රිය දෙපාර්තමේන්තුව වීසින් අයකර ගත්තා බවත්, දුම්රිය එන්ජින් එම ආයතනයට කුලී පදනම් මත ලබා දී එම්ඒන් ද දෙපාර්තමේන්තුව මුදල් උපයා ගත්තා බවත්, දැනට පැහැර හැරීමකින් තොරව එම ආයතනය වීසින් දෙපාර්තමේන්තුවට මුදල් ගෙවීම් කර ඇති බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීහු ප්‍රකාශ කළහ.

c. කාරක සභාවේ නිරීක්ෂණ

දුම්රිය එන්ජින් හා රියදුරන් බදුදීම හා එයින් අදායම් ලබා ගැනීම පැහැදිලි සැලසුමක් අනුව ක්‍රියාත්මක නොවන බව කාරක සභාව වීසින් නිරීක්ෂණය කරන ලදී.

අරුවක්කාරු දුම්රිය ස්ථානයේ මෙහෙයුම් සිදුවන ආකාරය සම්බන්ධයෙන් වාර්තාවක් යොමු අංක : දු.දෙ/නි.සා(වා)/පොදු05/ විගණන/1198/ර.ගි.කා.ස./2025 හා 2025.12.15 දිනැති ලිපිය සමඟ ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර ඇත.

01. අරුවක්කාරු දුම්රිය ස්ථානයේ මෙහෙයුම් සිදු වන ආකාරය.

i. දුම්රිය එංජින් බදු දීම

දුම්රිය එංජින් දෛනික කුලී පදනම් මත ලබා දීමේදී දුම්රිය භාවිතයට නොගත් කාලසීමා සම්බන්ධයෙන් ගාස්තු සැකසීමේදී සිදුවන ගැටළු සහගත තත්ත්වය නිරාකරණය ගැනීම සඳහා පහත පරිදි කටයුතු කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දී ඇත.

- දුම්රිය එංජිම භාවිතයට නොගත් කාලයක් පවතී නම් සියාම් සිටී සිමෙන්ට් ලංකා ආයතනය විසින් වහාම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ) දැනුවත් කිරීමට කටයුතු කිරීම.

- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ) විසින් ප්‍රධාන ඉංජිනේරු (ධාවනබල) වෙත එම කාල සීමා යොමු කර නිර්දේශය ලබා ගැනීමට කටයුතු කිරීම. (කුලී මුදල් අය කිරීම හෝ කුලී මුදල් අය නොකිරීම සඳහා)

- ප්‍රධාන ඉංජිනේරු (ධාවනබල)ගේ නිර්දේශය ගාස්තු අය කිරීමට කටයුතු කිරීම.

- කෙසේ වෙතත් සියාම් සිටි සිමෙන්ට් ලංකා ආයතනය විසින් 2022 වර්ෂයෙන් පසුව දුම්රිය දෙපාර්තමේන්තුවෙන් කුලී පදනම මත දුම්රිය දුම්රිය එංජින් ලබා ගැනීමට කටයුතු කර නොමැත.

ii. මෙහෙයුම්වලට අදාළ අය කිරීම් හා ආදායම.

කොළඹ පාරිභෝගික මිළ දර්ශකය හා උද්ධමන අනුපාතය අනුව ගාස්තුව වාර්ෂිකව ගලපන අතර වර්ෂ 05කට වරක් සංශෝධිත ගාස්තුව ක්‍රියාත්මක කරනු ලබයි. අවසන් වරට 2024 මැයි මාසයෙන් ආරම්භක වර්ෂයේ දී ප්‍රවාහන ගාස්තුව සංශෝධනය කළ අතර ඒ අනුව වාර්ෂිකව ප්‍රවාහනය කරන පළමු මෙ.ටො. 500,000ට වාර්ෂිකව අය කරනු ලබන ගාස්තුව රු. 52,351,445.58ක් වේ.

ඒ අනුව 2024 මැයි මාසයේ සිට පළමු මෙ.ටො. 500,000ට වැඩියෙන් ප්‍රවාහනය කරන මෙ.ටො. ප්‍රමාණය අනුව ගාස්තු අයකර ගන්නා ආකාරය පහත දැක්වේ.

- මෙ.ටො. 500,000 සිට 900,000 දක්වා මෙ.ටො. 01ට - රු. රු. 157.05
- මෙ.ටො. 900,000 සිට 1,100,000 දක්වා මෙ.ටො. 01ට - රු. රු. 125.14
- මෙ.ටො. 1,100,000 සිට 1,300,000 දක්වා මෙ.ටො. 01ට - රු. රු. 104.70
- මෙ.ටො. 1,300,000 ට වැඩි මෙ.ටො. 01ට - රු. රු. 83.76

2026 වර්ෂයේ පෙබරවාරි මස සිට අප්‍රේල් මස දක්වා ප්‍රවාහනය කරන ලද මෙ.ටො. 230,015ක් සඳහා රු. 34,801,180.65ක මුදලක් අයකර ගෙන ඇති අතර 2026 මැයි මාසයේදී එම මාසයෙන් ආරම්භ වන වර්ෂය සඳහා ප්‍රවාහනය කරනු ලබන පළමු මෙ.ටො. 500,000ට වාර්ෂිකව අය කරනු ලබන ගාස්තුව වන රු. 52,351,445.58ක් මුදල අයකර ගෙන ඇත.

	දිවිවා සුලි කුණාටුව හේතුවෙන් දුම්රිය තූර්නගර්වලින් ඉදිරියට දුම්රිය මාර්ගවල සිදු වී ඇති හානිය හේතුවෙන් 2025 දෙසැම්බර් සහ 2026 ජනවාරි මාසවලදී හුණුගල් ප්‍රවාහනය සිදු කිරීමට නොහැකි වී ඇති අතර ආයතනය විසින් ඔවුන්ගේ පිරිවැයෙන් දුම්රිය මාර්ග නැවත සකසා ඇත. **iii. රේලිසීලි එලීම සහ නඩත්තු කටයුතු** ගිවිසුමෙහි අංක 06 අනුව තූර්නගර් හා පෙරියනාගවිල්ලු අතර දුම්රිය මාර්ග නඩත්තු කිරීම සඳහා පුත්තලම සිමෙන්ති සමාගම වෙත පවරා ඇත. ඒ අනුව සියාම් සිටි සිමෙන්ට් ලංකා ආයතනය විසින් එම දුම්රිය කොටස ආයතනයේ වියදමින් නඩත්තු කරනු ලබයි. **iv. සාමාන්‍ය මෙහෙයුම් සිදු වන ආකරය** හුණුගල් ප්‍රවාහනය සඳහා සියාම් සිටි සිමෙන්ට් ලංකා ආයතනය සතුව දුම්රිය එංජින් 02ක් පවතින අතර අවශ්‍ය දුම්රිය ගැල් ද ආයතනය සතුව ඇත. දුම්රිය දෙපාර්තමේන්තුව විසින් හුණුගල් ප්‍රවාහන දුම්රිය ආරක්ෂිතව ධාවනය සඳහා අවශ්‍ය මෙහෙයුම් පහසුකම් සපයනු ලබයි.

d. කාරක සභාවේ නිර්දේශ

දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් දුම්රිය/එන්ජින් බදු දීම, එහි මෙහෙයුම්වලට අදාළ අයකිරීම් හා ආදායම්, රේල්පිලි එළීම් හා හඬික්කු කටයුතු සිදු කිරීම, සාමාන්‍ය මෙහෙයුම් සිදුවන ආකාරය හා පාලනය සම්බන්ධයෙන් වාර්තාවක් සති 2ක් ඇතුළත (17.12.2025 වන විට) කාරක සභාවට ලබා දීමට ප්‍ර.ඇ.නි./ඇ.නි. කාරක සභාව සමඟ එකඟ විය.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

MT/04/14/03/01-2025 හා 2025.12.31 දිනැති ලිපිය මඟින් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

22) **ඇණවුම් කරන ලද භාණ්ඩ නිසි ප්‍රමිතියෙන් හා ඉල්ලුම් කරන ලද ප්‍රමාණ වලින් ලැබී නිමෙඩැයි සහතික කිරීමකින් තොරව සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම හා අඩුවෙන් ලැබී ඇති භාණ්ඩ සඳහා අයකර ගත යුතු මුදල් අය කර නොගැනීම.**

❖ <u>විමර්ශනය කරනු ලද දිනය - 2025.06.05</u>

a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

භාණ්ඩ නිසි ප්‍රමිතියෙන් හා නිවැරදි ප්‍රමාණයන්ගෙන් ලද බවට ගෙවීම් පහසුකම් සලසා දෙන නිලධාරියා විසින් සහතිකවීමෙන් අනතුරුව ගෙවිය යුතු සැපයුම් සඳහා ගෙවීම් කළ යුතු වුවද, එසේ නිසිදු සහතිකවීමකින් තොරව සපයා නොමැති භාණ්ඩ සඳහා රු. 95,763,117 ක් සැපයුම්කරුවන් හට ගෙවා තිබුණු බවත්, 1980 සිට 2022 දක්වා වූ කාලයට අයත් රු. 84,079,198 ක් ද, 2023 වර්ෂය සඳහා රු. 2,184,279 ක්ද, 2024 වර්ෂය සඳහා රු. 26,138 ක්ද වශයෙන් සපයා නොමැති භාණ්ඩ සඳහා ගෙවා තිබූ රු. 86,289,615 ක් අයකරගෙන නොතිබුණු බව විගණනය විසින් පෙන්වා දෙන ලදි.

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ඇ.නි.) / ගණන් දීමේ නිලධාරිගේ (ඇ.නි.) කරුණු පැහැදිලි කිරීම

අදාළ සැපයුම්කරුවන් සමඟ සාකච්ඡා කරමින් පෙර සිදු කරන ලද මෙවැනි මිලදී ගැනීම් සඳහා මුදල් අයකර ගැනීම හෝ භාණ්ඩ මඟින් පියවා ගැනීම් ආරම්භ කර ඇති බව නිලධාරීන් විසින් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම මැත කාලීන සැපයුම්කරුවන් සම්බන්ධ කර ගැනීම් පහසු වුවත්, 1980 වැනි අතීත කාලවලදී සිදු කරනු ලැබූ මිලදී ගැනීම් සැලකීමේදී ඇතැම් සැපයුම් ආයතන

මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රවාහන, මහා මාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන් හා දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් අංක MT/07/02/04/65 හා 2026.04.22 දිනැති ලිපිය මඟින් ප්‍රවාහන, මහා මාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විසින් පත්කර ඇති අතර, අදාල කමිටුවේ නිර්දේශ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කෙරේ.

පවා නොපවතින බැවින්, මෙම කාර්යයේ අපහසුතාවය ජිල්ලාධිරීන් විසින් පෙන්වා දෙන ලදී.

c. කාරක සභාවේ නිරීක්ෂණ

නීති ප්‍රතිපාදන ක්‍රමානුවිදයන් නොපැවතීම මෙයට හේතු වී ඇති බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

d. කාරක සභාවේ නිර්දේශ

මෙම විගණන කරුණු සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

අදාළ නොවේ.

23) දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

a. සංක්ෂිප්ත කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම වෙතුවෙන් 2021 වර්ෂය අවසාන වන විට ආයතන 47 කින් රු.140,784,351 ක් ද, 2020 වර්ෂයේ දුම්රිය බලපත්‍ර ඖෂ ආදායම් රු.848,334,880 ක් ද, 2020 වර්ෂයේ වෙනත් ඖෂ ආදායම් රු.556,205,725 ක් සහ කඩ කාමර හා බඩු ගබඩා 03 ක ඖෂ කුලිය රු.36,790,032 ක් ද වශයෙන් රු.1,582,114,988 ක් වූ ඖෂ ආදායම් අයකරගෙන නොතිබුණු බවත්, දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම වෙතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට ආයතන 31 කින් රු.169,769,006 ක මුදලක් ඖෂ වශයෙන් ඇති අතර ඉන් ආයතන 20 කින් ලැබිය යුතු රු.23,457,706 ක මුදල් වර්ෂ 07 සිට 44 දක්වා පැරණි ශේෂයන් වන බවක් විගණනය වීසින් පෙන්වාදෙන ලදී.

b. ප්‍රධාන ගණුන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නී.) / ගණුන් දීමේ නිලධාරීගේ (ග.නී.) කරුණු පැහැදිලි කිරීම

දුම්රිය දෙපාර්තමේන්තුව මීට වසර 160 පෙර ආරම්භ කරන ලද්දේ භාණ්ඩ ප්‍රවාහනය අරමුණු කරගෙන වුවද 2025 වන විට රටේ සමස්ත භාණ්ඩ ප්‍රවාහනයෙන්, දුම්රිය මඟින් සිදු කරනු ලබන්නේ 0.6% ක් පමණක් බවත් කාරක සභාවේදී අනාවරණය කෙරිණි. භාණ්ඩ ප්‍රවාහනයේ ඒකාධිකාරයක්

කාරක සභාවේ නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය :-

- භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධව සැලසුමට (Master Plan) අදාල මූලික පදනම් වාර්තාවක් ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.
- වෙයන්ගොඩ බහුවිධ මාධ්‍ය භාණ්ඩ ප්‍රවාහන මධ්‍යස්ථානය හා තඹුත්තේගම සිට කොළඹට එළවළු ප්‍රවාහනය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට මූලික පියවර අරඹා ඇති බවත්, එහි ඉදිරි කටයුතු ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන බවත් දන්වමි.
- කාරක සභා නිර්දේශ අංක 3 මෙම අංශයට අදාල නොවන බව දන්වා සිටිමි.

පවත්වා ගැනීමට අනිකයේදී දුම්රිය දෙපාර්තමේන්තුවට හැකි වූ හමුන් වර්තමානයේදී මාර්ග පද්ධති වල දියුණුව, ගලාවිරථ වැනි කාර්යක්ෂම හාණ්ඩ ප්‍රවාහන මාධ්‍ය පැවතීම, දුම්රිය මාර්ග ස්ථාපිතකර ගැනීම නම දෙපාර්තමේන්තුවට සිදු කර ගැනීමට සිදු වීම නිසා එක් ප්‍රවාහන වාරයක් සඳහා අධික මිලක් නියම කිරීමට සිදු වීම වැනි කරුණු හේතුවෙන් දුම්රිය මඟින් හාණ්ඩ ප්‍රවාහනය අවම වී ඇති බව දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීහු ප්‍රකාශ කර සිටියහ.

එමෙන්ම, "ප්‍රීමා" සමාගම මෙන්ම "ඉන්සි සිමෙන්ති" සමාගම සමඟ දැනටමත් හිවීසුම් ගසව කටයුතු කරන අකර දැනට ප්‍රවාහනය කරන ඉන්ධන ප්‍රමාණය 40% කින් වර්ධනය කර ගැනීමට ද පියවර ගෙන ඇති බවත්, කන්කසන්තුරය දක්වා ඉන්ධන ප්‍රවාහනයට ද, කඹුරුපේගම සිට කොළඹට කෘෂි ද්‍රව්‍ය ප්‍රවාහනයට ද එම දුම්රියේම කොළඹ සිට කඹුරුපේගම දක්වා පාර්සල් ප්‍රවාහනයට ද අදාළ ව්‍යාපෘතිය මෙතුවෙත් දැනටමත් හිවීසුම් සකස් කර ඇති බව නිලධාරීහු පැහැදිලි කළහ.

c. කාරක සභාවේ නිරීක්ෂණ

දුම්රිය මඟින් සිදු කරන හාණ්ඩ ප්‍රවාහනය කාර්යක්ෂම කර ගත යුතු බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

d. කාරක සභාවේ නිර්දේශ

හාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධව සැලසුමක් (Master Plan) සකස් කර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා වෙත නිර්දේශ කරන ලදි.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

- හාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධව සැලසුමට (Master Plan) අදාල මූලික පදනම් වාර්තාවක්,
- දැනට වෙයන්ගොඩ බහුවිධ මාධ්‍ය හාණ්ඩ ප්‍රවාහන මධ්‍යස්ථානය හා කඹුරුපේගම සිට කොළඹට එළවළු ප්‍රවාහනය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට මූලික පියවර අරඹා ඇති බවත්,
- පවතින එන්ජින් තිහතාවය නිසා දුම්රියෙන් හාණ්ඩ ප්‍රවාහනයට ලැබෙන ඉල්ලීම් පිළිබඳව ඔවුන්ගේ විශ්වාසය රැකෙන පරිදි ප්‍රවාහන කටයුතු හාර ගැනීම අසීරු වී ඇති බවත්, සඳහන් කරමින්,

MT/04/14/03/01-2025 හා 2025.11.13 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ, ඇමුණුම් 19 යටතේ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

24) දුම්රිය අනතුරු.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

a. සංකේතය කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

දුම්රිය මාර්ග පද්ධතිය ආශ්‍රිතව ප්‍රධාන හා අප්‍රධාන හරස් මාර්ග 1362 ක් පවතින අතර එයින් 185 පෞද්ගලික හරස් මාර්ග ලෙසත් 1177 දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ආරක්ෂා කළ යුතු හරස් මාර්ගයන් ලෙසත් වන අතර, මෙම දුම්රිය හරස් මාර්ගයන් 1177 න් දුම්රිය මඟට්ටු ක්‍රියාත්මක වන හරස් මාර්ග සංඛ්‍යාව 300 ක් ද, දුම්රිය මාර්ග සංඥා ක්‍රියාත්මක වන හරස් මාර්ග සංඛ්‍යාව 438 ක් ද, ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයන් යොදවා ඇති හරස් මාර්ග සංඛ්‍යාව 439 ක් ද වේ. මෙම හරස් මාර්ග 439 න් 200 සඳහා අනිත් ක්‍රියාත්මක වන මඟට්ටු සවිකර ඇති අතර ඉතිරි 239 අනාරක්ෂිත තත්ත්වයේ පැවතිය ද ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. මෙම අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග පැවතීමත්, හරස් මාර්ග සඳහා යොදවා ඇති ආරක්ෂණ ක්‍රමවේදයන් නිසි පරිදි ක්‍රියාත්මක නොවීමත් හේතුවෙන් 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වූ වර්ෂ 05 ක කාලය තුළ හරස් මාර්ග අනතුරු 385 ක් සිදුවී තිබූ අතර එයින් පුද්ගල මරණ 37 ක් හා තුවාල වීම් 105 ක් වාර්තා වී තිබුණු බව විගණනය වේසින් පෙන්වා දෙන ලදී.

b. ප්‍රධාන ඉංජිනේරු දිනම නිලධාරී (ප්‍ර.ඉ.නි.) / ඉංජිනේරු දිනම නිලධාරීගේ (ඉ.නි.) කරුණු පැහැදිලි කිරීම්

2025 වසර අවසන් වන විට හරස් මාර්ග 75 ක් ආරක්ෂිත තත්ත්වයට පත් කිරීමට නියමිත බවත් දුම්රිය මාර්ග බාධක, මඟට්ටු හා ලයිට් පද්ධති ස්ථාපිත කිරීම හා දුම්රිය සංඥා පද්ධති මඟින් එම හරස් මාර්ග ආරක්ෂා කිරීමට කටයුතු යොදා ඇති බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ප්‍රකාශ කළහ.

c. කාරක සභාවේ නිරීක්ෂණ

සියදිවි නැති කර ගැනීම් හා දුම්රිය මාර්ගයේ ගමන් කිරීමේදී සිදුවන අනතුරු නිසා වසරකට මරණ 300 ක් පමණ සිදුවන බවත්, අපරීක්ෂාකාරී දුම්රිය ධාවනය නිසා සිදු වී ඇති අනතුරු සඳහා වගකිවයුතු පුද්ගලයන් හට අධිකාර පනවා ඇති බවත් ඉංජිනේරු දිනම නිලධාරියා ප්‍රකාශ කළේය.

ප්‍රජා පොලිස් සේවාව මගින් ආරම්භ කරන ලද දුම්රිය හරස් මාර්ග ගේට්ටු සඳහා යෙදවූ සේවකයින් වෙත අදාළ වැටුප් ගෙවීම දුම්රිය දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබයි. ඒ අනුව දුම්රිය හරස් මාර්ග ගේට්ටු 381ක් සඳහා ගෙවීම් කරනු ලබන අතර, ම ගේට්ටු ආරක්ෂිත මට්ටමට ලක් කර ඇත. ඒ අනුව මෙම හරස් මාර්ගවල සිදුවන අනතුරු අවම කර ගැනීමට හැකි වී ඇත.
එයට අමතරව සංඥා උපදෙපාර්තමේන්තුව මගින් බෙල් ඇන්ඩ් ලයිට් සංඥා පද්ධති සවි කිරීම ද සිදු කරනු ලබයි.

මේ වන විට දෙපාර්තමේන්තු ව්‍යාපෘති මගින් නව පද්ධති 15ක් වැඩ කටයුතු නිම කර ස්ථාපනය කර ඇත. ඒ අනුව ඉතිරි අනාරක්ෂිත දුම්රිය හරස්මාර්ග ගණන 414 කි. එයින් මහව /අනුරාධපුර සංඥා ව්‍යාපෘතිය යටතේ නව පද්ධති 46ක් ස්ථාපනය කිරීම සඳහා ගිවිසුම් අත්සන් කර ඇත.

ඉතිරි අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සඳහා ප්‍රමුඛතා අනුව දුම්රිය ධාවන සනත්වය, හරස් මාර්ගයේ වාහන සනත්වය, දුම්රිය ධාවන වේගය, මෙතෙක් අනතුරු ප්‍රවණතාව හා දෘෂ්ටිකතව වැනි නිර්ණායක යොදා ගෙන ස්ථාන 134ක් ප්‍රමුඛ ලෙස හඳුනා ගෙන ඒ සඳහා පහත වැඩ පිළිවෙල 2026/2027 වසර තුළදී අනුගමනය කිරීමට කටයුතු යොදා ඇත.

1. දෙපාර්තමේන්තුව මගින් පද්ධති ස්ථාපනය කිරීම මගින් පවතින ස්ථාන 34ක් සඳහා පද්ධති ලබා දීම.

2. කොන්ත්‍රාත් ලබා දීම මගින් පද්ධති 100ක් ස්ථාපනය කිරීම.

d. කාරක සභාවේ නිර්දේශ

1. අනාරක්ෂිත වේල් හේවටු සියල්ලම ආරක්ෂිත තත්ත්වයට පත් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළ කාරක සභාව හදුනාගත් අනාරක්ෂිත දුම්රිය හේවටු පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනයක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස දුම්රිය දෙපාර්තමේන්තුවේ ගණුන්දීමේ නිලධාරී වෙත නිර්දේශ කරන ලදී.
2. හදිසි අනතුරු ඇති තුන්වන පාර්ශවයක් මඟින් විමර්ශනයක් සිදුකර දුම්රිය අනතුරු අවම කර ගැනීම සඳහා නිර්දේශ සහිත වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තුවේ ගණුන් දීමේ නිලධාරියා වෙත නිර්දේශ කරන ලදී.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

- අනාරක්ෂිත දුම්රිය හරස්මාර්ග ප්‍රමාණය අඩු වන විට 429 දක්වා අඩු වී ඇති බවත්,
- මහාව /අනුරාධපුර සංඥා ව්‍යාපෘතිය යටතේ නව පද්ධති 46ක් ස්ථාපනය කිරීම සඳහා ගිවිසුම් අත්සන් කර ඇති බවත්,
- දෙපාර්තමේන්තු ව්‍යාපෘති මඟින් නව පද්ධති 15ක් නිම කර ඇති බවත්,
- හරස් මාර්ග සඳහා ප්‍රතිස්ථාපනා කැනීම් සඳහා පත් කරන ලද කමිටුව මඟින් අත්‍යාවශ්‍ය ස්ථාන හඳුනා ගන්නා ලද අතර ඉන් ස්ථාන 134ක් 2026/2027 වසර තුලදී ස්ථාපනය කිරීමට කටයුතු කරගෙන ඇති බවත්,
- මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභාපතිතුමා සම්බන්ධ කර ගනිමින් 2025/07/28 දින දුම්රිය සාමාන්‍යාධිකාරී සමඟ සංකල්පාවක් පවත්වා ඇති අතර එහිදී එම අදාළ කැලඋම් සකස් කිරීම පිළිබඳ නියාමන අදාළ සභාව වෙත පවරා ඇති බවත්, මේ පිළිබඳව දෙපාර්තමේන්තුව නියාමනය කිරීමට පියවර ගන්නා බවට විශ්වාස දැනුම් දුන් බවත්,

MT/04/14/03/01-2025 හා 2025.11.13 දිනැති ලිපිය මඟින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ, ඇමුණුම 20 හා 21 යටතේ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

25) දුම්රිය දෙපාර්තමේන්තුවේ බදවා ගැනීම් හා උසස් කිරීම්.

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.06.05

a. සංක්ෂිප්ත කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

ජොෂ්ඨ මට්ටමේ 210 ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් නතය සේවක සංඛ්‍යාව 128 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 82 ක් හෙවත් සියයට 39 ක් බවත්, කණ්ඩිය මට්ටමේ අනුමත තනතුරු සංඛ්‍යාව 450 ක් වූ අතර නතය සේවක සංඛ්‍යාව 67 ක් වීමෙන් එම සේවක පුරප්පාඩු සංඛ්‍යාව 383 ක් හෙවත් සියයට 85 ක ඉතා ඉහළ අගයක් බවත්, ද්විතියික මට්ටමේ 11,339 ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් නතය සේවක සංඛ්‍යාව 5,928 ක් වීමෙන් පුරප්පාඩු 5,411 ක් හෙවත් සියයට 47 ක් බවත් විගණනය වීසින් පෙන්වා දෙන ලදී.

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්

සේවකයන් බදවා ගැනීමට පෙර ඉල්ලීම් කර තිබුණද, මෙම වසරේ මාර්තු මාසය වන තෙක් එයට අනුමැතිය නොලැබුණු බවත්, මේ වන විට තනතුරු මොහොමයක් සඳහා අයදුම්පත් කැඳවා ඇති බවත්, විභාග දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වී, ප්‍රශ්න හා ප්‍රශ්ලි මාප වලදී එම විභාග පැවැත්වීමට කටයුතු සලසා ඇති බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීහු ප්‍රකාශ කළහ.

c. කාරක සභාවේ නිරීක්ෂණ

නිසි කලට තනතුරු සඳහා බඳවා ගැනීම් නොකිරීම දුම්රිය දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂමතාවයට ප්‍රධානතම හේතුවක් වන බව කාරක සභාවේ මතය වීය.

d. කාරක සභාවේ නිර්දේශ

1. බඳවා ගැනීම් හා උසස් වීම් නිසිකලට ලබා නොදීම නිසා ඇතිව ඇති ගැටලු නිරාකරණය කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙත හා ගණන් දීමේ නිලධාරී වෙත නිර්දේශ කෙරිණි

2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් ලබා දී ඇති නිර්දේශ වීනය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙත හා ගණන් දීමේ නිලධාරියා වෙත නිර්දේශ කෙරිණි.

දුම්රිය දෙපාර්තමේන්තුවේ බදවා ගැනීම් හා උසස් කිරීම් සම්බන්ධ වත්මන් ප්‍රගතිය ඇමුණුම 06

ඇ. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

- 2025.09.30 වන විට පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කොරකුරු, MT/04/14/03/01-2025 හා 2025.11.13 දිනැති ලිපිය මඟින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ, ඇමුණුම 19 යටතේ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් ලබා දී ඇති තීරණ ක්‍රියාත්මක නොකරන ලද විනය ලිපිගොනු නොමැති බවද දන්වා ඇත.

26) අන්තර්ජාලය හරහා දුම්රිය ආසන වෙන්කර ගැනීම.

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

අ. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

කොළඹ කොටුව - බදුල්ල දුම්රිය සඳහා විශාල මෙහි ඉල්ලුමක් පවතින අතර ඒ සඳහා දිනපතා දුම්රිය 04 ක් ධාවනය කරනු ලබන බවත්, මේ සඳහා සෑම දිනකම අන්තර්ජාලය මඟින් ආසන වෙන් කිරීම් ඖෂයකට පෙර දින පෙ.ව. 10.00 ට විවෘත වන අතර තත්පර 01 ක් තුළ ආසන වලින් සියයට 58 කට වැඩි ප්‍රමාණයක් ද පැයක කාලයක් තුළ ආසන සියල්ලම ද වෙන්කර අවසන් වුවද වැඩිවන ඉල්ලුම සපුරාලීමට අදාල ශෝප්තාවලියක් සකසන්කර බලධාරීන්ගේ අවධානයට යොමුකර තොතිබුණු බවත්, එමෙන්ම අන්තර්ජාලය මඟින් ආසන වෙන් කිරීමෙදී අනුගමනය කළ යුතු කොන්දේසි හා නියමයන්වල 01 වන වගන්තිය අනුව අන්තර්ජාලය මඟින් ආසන වෙන් කිරීමෙදී එක් හැඳුනුම්පතකට ආසන 05 ක් වෙන් කළ හැකි වුවද නියැදි විගණන පරීක්ෂාවෙදී එක් හැඳුනුම්පතකට ආසන 24 සිට ආසන 182 ක් දක්වා ආසන වෙන්කර තිබුණි. එමෙන්ම 1041 ඇල්ල ඔඩිසි දුම්රියේ 2024 නොවැම්බර් මස නියැදි පරීක්ෂාවට ලක් කළ දින 09 ක් තුළ කොටුව සිට මහනුවර දක්වා පළමු පන්තියේ ආසන 1184 ක් ද, දෙවන පන්තියේ ආසන 1036 ක් ද, තෙවන පන්තියේ ආසන 285 ක් ද වශයෙන් ආසන 2500 ක් පිරිව ගමන් කර තිබුණු බව විගණනය වීසින් පෙන්වා දෙන ලදී.

එමෙන්ම M ආසන වෙන් කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සීමාසහිත මොබිටෙල් (පෞද්ගලික) සමාගම් සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව අතර එළඹ තිබූ ගිවිසුම් 2023 දෙසැම්බර් 31 දින අවසන් වී තිබූ නමුත් අදාල ගිවිසුම් යාවත්කාලීන කිරීමට හෝ නව ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබියදී M ආසන වෙන් කිරීමට අදාල හැඳුනුම්පත් මොබිටෙල් ආයතනයේ ජිනුම්මනට බැර වන බව නිරීක්ෂණය වන බවද විගණනය මඟින් වාර්තා කර ඇත.

- මෙම විගණන කරුණු සම්බන්ධයෙන් කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් කර නොමැති බව දන්වා සිටිමි.
- එසේ වුවද, විගණන කරුණු සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය පහතින් සඳහන් කරමි.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් දුර ගමන් සේවා ගමනාන්ත කිහිපයක් පවත්නා ගෙන ගියද මඟීන්ගේ හා සංචාරකයන්ගේ වැඩි ආකර්ශණයක් හා ඉල්ලුමක් ඇත්තේ කොළඹ කොටුව සිට බදුල්ල දක්වා ධාවනය වන දුම්රියන්ට වේ.

අදාල විගණන වාර්තාවේ සඳහන් පෙ.ව. 10 සිට පෙ.ව. 10 තත්පර 01 අවසන් වීමට පෙර වෙන් වූ ආසන ප්‍රතිශතය සමඟ එකඟ නොවෙමි. එහි සඳහන් ආසන ප්‍රතිශතයන් පෙ.ව. 10 සිට පෙ.ව. 10 විනාඩි 01 කාලය තුළ වෙන් වී ඇති ආසන ප්‍රමාණය ලෙස සැලකිය හැක. සමස්තයක් ලෙස පවතින අධික මඟී ඉල්ලුම හේතුවෙන් විනාඩි කිහිපයක් තුළ ආසන වෙන් වී අවසන් වන බව

පිළිගනිමි. එසේ ඉතා ඉක්මණින් පද්ධතිය හරහා ආසන වෙන් කර ගැනීම වැළැක්වීම සඳහා ස්වයංක්‍රීය වැඩසටහන්වලට බාධා වන ආකාරයේ පරිගණක යෙදුම් (Robot) පද්ධතියට එක් කිරීමට කටයුතු යොදා ඇත.

අදාල විගණන වාර්තාවට අනුව නියැදි විගණන පරීක්ෂාවේ දී එක් හැඳුනුම්පතකට ආසන 24 සිට ආසන 182 දක්වා ආසන වෙන් කර තිබුණු බවට අනාවරණය වී ඇත්තේ එක් ජාතික හැඳුනුම්පත් අංකයකට 2024 සැප්තැම්බර් මාසය තුළ වෙන් කරවා ගත් ආසන සංඛ්‍යාව වේ. එක් ජාතික හැඳුනුම්පත් අංකයකට මසකට වෙන් කරවා ගත හැකි ආසන සංඛ්‍යාව සීමා කර නොමැති නිසා එලෙස වෙන් කරවා ගැනීමක් සිදුවිය හැක.

ඕනෑම අයෙකුට එක් අවස්ථාවක දී වෙන් කර ගත හැකි උපරිම ආසන සංඛ්‍යාව 05කි. නැවත වරක් එම අයටම පද්ධතියට ප්‍රවිෂ්ඨ වී ආසන වෙන් කර ගැනීමේ හැකියාව අවහිර කර නොතිබුණි. මේ වන විට එක් ජාතික හැඳුනුම්පත් අංකයකින්/ එක් විදේශ ගමන් බලපත්‍ර අංකයකින් එක් දිනක් තුළ එක් දිශාවකට ධාවනය වන එක් දුම්රියකට වැඩියෙන් ආසන වෙන් කරවා ගත නොහැකි වන පරිදි පද්ධතිය සංවර්ධනය කිරීමට කටයුතු කරමින් පවතී. එසේම යම් පුද්ගලයෙකු වෙන් කර ගන්නා ආසන සංඛ්‍යාව සීමා කිරීම සඳහා ආසන වෙන් කර ගැනීමේ දී ගමන් ගන්නා සියළුම වැඩිහිටි මගීන්ගේ ජාතික හැඳුනුම්පත්/ විදේශ ගමන් බලපත්‍ර අංක ප්‍රවේශ පත්‍රයේ මුද්‍රණය කිරීමට මේ වන විට කටයුතු කර ඇති අතර භෞතිකව දුම්රිය ස්ථාන තුළදී හා දුම්රිය තුළදී ප්‍රවේශ පත්‍රය, ජාතික හැඳුනුම්පත් අංකය සමඟ සැසඳේ දැයි පරීක්ෂා කිරීම ද සිදු කරමින් මෙම තත්ත්වය පාලනය කිරීමට කටයුතු යොදා ඇත.

	1041 ඇල්ල ඔඩිසි දුම්රිය සඳහා වැඩිම ඉල්ලුමක් ඇත්තේ විදෙස් සංචාරකයින්ගෙන් වන අතර ඔවුන් වැඩි වශයෙන්ම මෙම දුම්රියට ගොඩ වන්නේ මහනුවර හා නානුඔය දුම්රිය ස්ථානවල දීය. මෙම දුම්රියට මහනුවර දක්වා ගමන් ගන්නා මගීන්ගේ වැඩි ඉල්ලුමක් නොමැති බැවින් කොළඹ කොටුව සිට මහනුවර දක්වා විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි වැඩි ආසන සංඛ්‍යාවක් හිස්ව ගමන් කරනු ලබන අවස්ථා දක්නට ලැබේ. එසේ වුවද, සංචාරකයින් මෙරටට වැඩි වශයෙන් ගෙන්වා ගැනීමේ ජාතික අවශ්‍යතාවය මත ධාවනයට එක්කරන ලද මෙම දුම්රියේ මෙහෙයුම් අවශ්‍යතාවයන් මත කොළඹ කොටුව දුම්රිය ස්ථානයේ සිට ධාවනය කිරීමට සිදුව ඇත. මෙය විශේෂ දුම්රියක් ලෙස හඳුන්වා දීමේ දී ගාස්තු තීරණය කර ඇත්තේ වැඩිම ඉල්ලුමක් පවතින කොටියාශ හා වෙන් කරවා ගත හැකි ආසන ප්‍රමාණය පිළිබඳ අවධානය යොමු කර වැඩි ආදායමක් ලැබෙන පරිදි වේ. විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු අනුව යම් පමණකට වියදම අඩු කර ගැනීම සඳහා මෙම දුම්රිය සතියේ දිනවල මහනුවර දුම්රිය ස්ථානයේ සිට ද සති අන්ත දිනවල කොළඹ කොටුව දුම්රිය ස්ථානයේ සිට ද ධාවනයට එක් කර ඇත. මොබිටෙල් ආයතනය හා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව අතර දුම්රිය ආසන වෙන් කිරීම සම්බන්ධයෙන් අත්සන් කළ යුතු නව ගිවිසුම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද අතර බදු කොන්දේසි සම්බන්ධයෙන් දෙපාර්ශ්වය එකඟතාවයට පැමිණීමෙන් අනතුරුව 2025.10.01 දින සිට 2027.12.31 දින දක්වා කාලයට බල පැවැත්වෙන පරිදි සකස් කර ලද නව ගිවිසුමට 2026.01.19 දින දෙපාර්ශ්වය විසින් අත්සන් තබන ලදී. එහිදී මොබිටෙල් ආයතනය විසින් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු ඇප තැන්පතු මුදල රු. මිලියන 02 සිට රු. මිලියන 06 දක්වා වැඩි කරන ලද අතර මෙතෙක් මොබිටෙල් ආයතනය ''එකතු කරන ලද මුදල් සතිපතා දුම්රිය දෙපාර්තමේන්තුවට බැර කළ යුතුය'' වූ කොන්දේසිය, ''එකතු කරන ලද මුදල් සතියේ වැඩ කරන බැංකු දින දෙකක් තුළ දුම්රිය දෙපාර්තමේන්තුවට බැර කළ යුතුය'' ලෙස සංශෝධනය කරන ලදී. 2025 ඔක්තෝබර් මස සිට එලෙස මුදල් දෙපාර්තමේන්තුවට බැර කිරීම ආරම්භ කරන ලදී.

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම

ඇතැම් සංවිධානාත්මක පුද්ගලයන් හා ආයතන විසින් මෙම ටිකටපත් මිලදී ගෙන නැවත වැඩි මිලදාමට අලෙවි කිරීම සිදු කරන බව හඳුනාගැනීමෙන් පසු ඒ සම්බන්ධයෙන් පොලිස්පතිට පැමිණිලි කර ඇති බව ගණන් දීමේ නිලධාරියා ප්‍රකාශ කළේය.

එමෙන්ම අධික ඉල්ලුමක් ඇති දුම්රිය ගමන් වාරිය සඳහා අමතර දුම්රිය ගමන් වාර හඳුන්වා දීම දැනටමත් සිදු කර ඇති බවත්, දුම්රිය දෙපාර්තමේන්තු නිලධාරීහු ප්‍රකාශ කළහ. ටිකටපත් සඳහා refund policy වෙනස් කිරීමට කටයුතු කිරීම, එක් හැඳුනුම්පත් අංකයකින් වෙන් කළ හැකි ආසන සංඛ්‍යාව සීමා කිරීම, OTP ක්‍රමයක් හඳුන්වා දීම මගින් වෙන් කරවාගත හැකි ආසන සීමා කිරීම, ඇල්ල-ඔඩිසි දුම්රියේ ආසනයක මිල නිර්ණය කිරීමේදී, ප්‍රධාන මෙහෙයුම්කරුවාට යාම සහ නැවත පැමිණීම යන ගමන් වාර දෙකම සලකා බලා මිල නියමකිරීම වැනි ක්‍රියාමාර්ග හේතුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට පාඩුවක් සිදු වී නොමැති බව නිලධාරීහු ප්‍රකාශ කර සිටියහ.

c. කාරක සභාවේ නිරීක්ෂණ

දෙපාර්තමේන්තුව මගින් ගන්නා ක්‍රියාමාර්ග සාධනීය බවත්, මේමගින් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත පාඩුවක් සිදුවී නැති බවත් කාරක සභාවේ නිරීක්ෂණය විය.

d. කාරක සභාවේ නිර්දේශ

මෙම විගණන කරුණු සඳහා කාරක සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණි.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

අදාළ නොවේ.

27) **හවිසන් කොමියුනිකේෂන් ලංකා පුද්ගලික සමාගම හා දුම්රිය දෙපාර්තමේන්තුව එක්ව දුම්රිය මාර්ගයේ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.**

❖ <u>විමර්ශනය කරන ලද දිනය - 2025.06.05</u>

a. **සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)**

හවිසන් කොමියුනිකේෂන් ලංකා පුද්ගලික සමාගමේ අරමුණ වන්නේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ව්‍යාපෘතියකට හවුල්කරු ලෙස සම්බන්ධ වෙමින්, කොළඹ කෝට්ටේ දුම්රිය ස්ථානයේ සිට පේරාදෙණිය දුම්රිය ස්ථානය දක්වා (ප්‍රධාන මාර්ගය කිලෝමීටර් 20 දක්වා) සහ මිරිස්සන දුම්රිය ස්ථානයේ සිට පනාගොඩ දුම්රිය ස්ථානය (කැළණිවැලි මාර්ගය කිලෝමීටර් 30 දක්වා) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග ඔස්සේ Fiber Cables එළිමහ ව්‍යාපෘතියේ නාක්ෂණික, පාරිසරික සහ මූල්‍ය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නිසි ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබීම වීසීමක් පරිදි නෛතික අනුමැතීන් ද ලබාගෙන ලිඛිත ගිවිසුම්වලට එළඹීමට පෙර කාර්යයන් ආරම්භ කර තිබීම. මෙම ව්‍යාපෘතිය යටතේ ඔක්බල් එළිමහ කටයුතු සඳහා කැණීම් කටයුතු සිදු කිරීමේදී පවතින දුම්රිය මාර්ගයේ කේබල් සද්ධතියට හානි සිදුවී නිබීම මත සංඥා පද්ධතියට හානි සිදුවීම, එම හානියට අදාළ අලාභයන් මේ දක්වාත් නක්ශේරු කර අදාළ ආයතනයෙන් අයකර ගෙන නොතිබීම හා මේ දක්වා ව්‍යාපෘති ප්‍රගතිය වාර්තා වී නොතිබීම ආදී අඩුපාඩු නිරීක්ෂණය වන බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.

b. **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**

එකී ව්‍යාපෘති මීටපු ලේකම්වරුන්ගේ අනුමැතිය සහිතව නිවැරදි ක්‍රියාපටිපාටියකට අනුව ක්‍රියාත්මක කර ඇති බවත්, කැළණිවැලි මාර්ගයේ ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කරගෙන්ද නැද්ද යන්න සම්බන්ධයෙන් කඩිනමින් තීරණයකට එළඹිය යුතු බවත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ප්‍රකාශ කළේය.

c. **කාරක සභාවේ නිරීක්ෂණ**

මෙම ව්‍යාපෘතියෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට ලබාගත හැකි ප්‍රතිලාභ රාශියක් ඇති බව කාරක සභාවේ නිරීක්ෂණය විය.

ඒ අනුව ක්‍රියා කර එම මාර්ගයේ කේබල් එලීමේ කටයුතු නිමා කර ඇත. ගිවිසුමට එළැඹීමට ආසන්නව පවතී.

d. කාරක සභාවේ නිර්දේශ

පුත්තලම මාර්ගයේ වාහනයිය හැකි ඉක්මනින් අවසන් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වන හා ගණන් දීමේ නිලධාරියා වෙත නිර්දේශ කෙරේනි

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම්

- කිලෝමීටර 50 වූ මුළු වාහනයියෙන් පුත්තලම මාර්ග කොටස ලෙස කොම්පඤ්ඤවීදිය සිට පේරලන්ද දක්වා කිලෝමීටර් 20 ක්ද මරදාන සිට පහාගොඩ දක්වා කැලණිවැලි මාර්ග කොටස ලෙස කිලෝමීටර් 30ක්ද කේබල් එළිය යුතු අතර එහි පුත්තලම මාර්ග කොටස පේරලන්ද සිට දෙමටගොඩ දක්වා සිදුකර නිමිණු ඔවන්,

- ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ අංක: MT/04/14/03/01-2025 හා 2025/10/07 දිනැති ලිපියෙන් (ඇමුණුම 25 - I) පුත්තලම මාර්ග කොටස පේරලන්ද සිට දෙමටගොඩ දක්වා කොටස අවසන් කිරීමට අනුමැතිය ලැබී ඇති බවත්, ඒ අනුව එම කොටස අවසන් කරන ලෙස හවිසන් ටෙලිකොම්යුනිකේෂන් ලංකා පුද්ගලික සමාගම වෙත අංක: T.03/DPC/Misc/2025 හා 2025/10/27 දිනැති ලිපිය (ඇමුණුම 25 - II) මගින් දන්වා ඇති බවත්,

MT/04/14/03/01-2025 හා 2025.11.13 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ, ඇමුණුම 19 යටතේ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

28) දුම්රිය ගමනාගමනය හා දුම්රිය ඇතුළත පහසුකම්.

❖ විමර්ශනය කරන ලද දිනය - 2025.06.05

a. සාකච්ඡා කරන ලද කරුණු (විගණකාධිපති නිරීක්ෂණ අනුව)

2025 ජනවාරි 25 දින නියමිත කාල සටහන අනුව මධ්‍යකලපුවේ සිට කොළඹ බලා ධාවනය වීමට තිබූ දුම්රිය, දුම්රිය නියාමකවරුන් දෙදෙනාට නවාතැන් පහසුකම් ප්‍රමාණවත් නොවීම මත දුම්රිය ධාවනය කර නොතිබුණු බවත්, නියාමිකවරුන් දෙදෙනෙකුට එක් කාමරයක් ලෙස ඔවුන්ට නවාතැන් පහසුකම් සපයා තිබුණු බවත්, එමෙන්ම නියමිත කාල සටහනක් නොමැතිව ජනවාරි 26 දින එම දුම්රිය මඟින් රණිසව කොළඹට ධාවනය කර තිබුණු බවත්, දුම්රිය අවලංගු කිරීම මත රු.600,000 ක අදායමක් අහිමිවී තිබූ අතර නියමිත දින නියමිත කාලසටහන අනුව දුම්රිය ධාවනය නොවීම හේතුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට, මඟින් හා අනෙකුත් පාර්ශවයන්ට සිදුවී ඇති

❖ කාරක සභා නිර්දේශ අංක 01 :-

1. අවන්හල් (භෝජනාගාර/ ආපන ශාලා) :-

- දැනට පවත්නා ක්‍රමවේදය :-

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වාණිජ) කාර්යාලයේ වෙළඳ හා අලෙවි අංශය විසින් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් බාහිර පාර්ශ්වයන්ගෙන් ටෙන්ඩර් කැඳවා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියෙන් සුදුසුකම්ලත්

කැනීයා/ගිලපැම් අධ්‍යයනය කර ඊට අදාළව ගත යුතු ක්‍රියාමාර්ග දෙපාර්තමේන්තුව විසින් ගැනීමටත්, ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තහවුරු බව වීගණනය විසින් නිරීක්ෂණය කරන ලදී.

b. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම

නව දුම්රිය කවිටවල මීලඟදී ගැනීමෙදී වැසිකිලි පද්ධති සහිත කවිටවල ඇතවුම් කර ඇති බවත්, දැනට පවතින දුම්රිය වැසිකිලි පද්ධති මහනුවර, හාතුඔය, මිහව, අනුරාධපුර යන දුම්රිය ස්ථාන වලදී පිරිසිදු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන දැනටමත් ලබා දී ඇති බවත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ප්‍රකාශ කරන ලදී.

c. කාරක සභාවේ නිරීක්ෂණ

පහසුකම් සැලසීම කුලීන් වැඩි මඟින් ප්‍රමාණයක් දුම්රිය මඟි ප්‍රවාහන ක්‍රමවේදයට ආකර්ෂණය කර ගැනීමට හැකි බවත්, එමඟින් ආදායම් වැඩි කර ගත හැකි බවත් කාරක සභාවේ මතය විය.

d. කාරක සභාවේ නිර්දේශ

1. අවන්හල්, නවාතැන්, සනීපාරක්ෂක පහසුකම් විධිමත් ආකාරයට සංවර්ධනය කළ හැකි පරිදි ටෙන්ඩර් පටිපාටිය ක්‍රියාත්මක කිරීම හා එම පටිපාටිය අධීක්ෂණය කිරීමට ක්‍රමවේදයක් සකස් කර ඉදිරිපත් කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා වෙත නිර්දේශ කරන ලදී.

2. වැසිකිලි අපද්‍රව්‍ය මාර්ගයට මනාවැටෙන ලෙස එක්රැස් කර බැහැර කරවීමට, ක්‍රමවේදයක් හැකි ඉක්මනින් සකස් කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා වෙත නිර්දේශ කරන ලදී.

3. දුම්රිය දෙපාර්තමේන්තුව සතුව ඇති සම්පූර්ණ එන්ජින් ගණන සහ ඒවායේ වර්තමාන තත්ත්වය, නැවත භාවිතා කිරීමේ හැකියාව ආදී කොරතුරු ඇතුළත් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා වෙත නිර්දේශ කරන ලදී.

e. නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම

- අවන්හල්, නවාතැන් පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් සම්බන්ධ වාර්තාවක් MT/04/14/03/01-2025 හා 2025.11.13 දිනැති ලිපිය මඟින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ, ඇමුණුම 19 යටතේ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත

අයදුම්කරුවන්ට බදු පදනම් යටතේ ලබා දීම මඟින් දුම්රිය ස්ථානවල දැනට පවත්නා අවන්හල් දුම්රිය මඟින්ගේ ප්‍රයෝජනය සඳහා සඳහා පවත්වා ගෙන යනු ලබයි.

- <u>පවතින ගැටළු හා ඊට යෝජිත විසඳුම්:-</u>

I. ටෙන්ඩරයට අදාල විස්තරයට අදාල ලංසුව සඳහා ඉහල මිල ගණන් ඉදිරිපත් කිරීමෙන් අදාල ටෙන්ඩරය ලබා ගත් බදුකරුවන් ගුණාත්මකභාවයෙන් අඩු ආහාර සැපයීමට හෝ ඉතා ඉහළ මිල ගණන්වලට ආහාර සැපයීමට කටයුතු කිරීම මඟින් මඟීන් අපහසුතාවයට පත්වේ.

II. මෙම ක්‍රියාවන් වැළැක්වීම සඳහා පරීක්ෂා කිරීමේ නිලධාරීන් යෙදවීමට සිදුවීමෙන් දෙපාර්තමේන්තු වියදම වැඩි වන අතර ඒ සඳහා අවශ්‍ය තරම් නිලධාරීන් නොමැතිකම බලපායි.

III. ඉහත තත්ත්වය මහහරවා ගැනීම සඳහා මඟීන් අපහසුතාවයට පත් නොවන පරිදි උපායමාර්ගික ටෙන්ඩර් ක්‍රමවේදයක් සකස් කරමින් පවතින අතර ඒ සඳහා පවතින නීතිරීති බාධාවක් වේ නම් ඊට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට බලාපොරොත්තු වේ.

- <u>වර්තමාන ප්‍රගතිය :-</u>

බෙලිඅත්ත, නානුඔය, දකුණු කළුතර, රඹුක්කන, පොල්ගහවෙල (වේදිකා), බණ්ඩාරවෙල, බදුල්ල හා ගාල්ල යන දුම්රිය ස්ථාන භෝජනාගාර 08 වසර පහක කාලයකට බදු දීම සඳහා ටෙන්ඩර්පත් කැඳවන ලද අතර ඊට අදාල පුවත්පත් දැන්වීම 2026.04.10 වෙනි දින දිනමිණ, ඩෙලි නිවස් හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද අතර ඒ අනුව ඉදිරිපත් කරන ලද ලංසු 2026.05.19 වෙනි දින ප.ව. 1.00ට විවෘත කරන ලදී. ටෙන්ඩරය සඳහා ලද ලංසු පිළිබඳ විස්තරය තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමු කර ඇති අතර එම කමිටුවේ වාර්තාව ලැබීමෙන් අනතුරුව අනුමැතිය සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවට යොමු කරනු ලැබේ. ඊට අනුමැතිය ලද පසු අදාල ඉල්ලුම්කරුවන්ට බදු ලබාදීමට කටයුතු කරනු ලැබේ.

<u>නවාතැන් පහසුකම් (විවේක කාමර) :-</u>

දැනට විවේක කාමර පවතින දුම්රිය ස්ථාන මඟින් දුම්රිය මඟීන්ට නවාතැන් පහසුකම් සපයා ඇත. දුම්රිය මඟීන්ට ප්‍රමුඛතාවය ලැබෙන අයුරින්

දෙපාර්තමේන්තුව විසින් මෙම සේවාව සපයනු ලබන අතර එමඟින් ආදායමක් ලබන අතර නඩත්තුව හා සේවක වැටුප් සඳහා වියදමක් දැරීමට ද දෙපාර්තමේන්තුවට සිදුව ඇත.

දැනට දුම්රිය දෙපාර්තමේන්තුව සතු විවේක කාමර පවතින්නේ යාපනය, මහනුවර, අනුරාධපුරය, මිහින්තලය, නානුඔය, පොළොන්නරුව, මඩකලපුව, බදුල්ල, ගාල්ල හා ත්‍රිකුණාමලය යන දුම්රිය ස්ථානවල පමණි. මේ අතුරින් අඩුම ආදායමක් ලැබූ ගාල්ල දුම්රිය ස්ථානයේ විවේක කාමර නියමු ව්‍යාපෘතියක් ලෙස ටෙන්ඩර් කර බාහිර පාර්ශ්වයකට ලබා දී ඇති අතර ඉන් ස්ථීර ආදායමක් ලැබේ.

මෙම සේවාව වැඩිදියුණු කිරීම සඳහා අමතර වියදමක් දැරීමට සිදුවේ. ඊට විසඳුමක් ලෙස අදාල දුම්රිය ස්ථානයේ පවතින අවන්හල හා විවේක කාමර ඒකාබද්ධ කර බාහිර පාර්ශ්වයක් මඟින් පවත්වා ගෙන යාම සඳහා ටෙන්ඩර් ක්‍රමවේදය අනුව ලබා දීම සඳහා දැනට අඩු ආදායමක් ලබන පොළොන්නරුව, මඩකලපුව, ත්‍රිකුණාමලය හා මිහින්තලය යන දුම්රිය ස්ථානවල පවත්වා ගෙන විවේක කාමර හා අවන්හල් තෝරා ගන්නා ලදී. ඒ අනුව පොළොන්නරුව, මඩකලපුව හා ත්‍රිකුණාමලය යන දුම්රිය ස්ථාන භෝජනාගාර හා විවේක කාමර ඒකාබද්ධ කර වසර පහක කාලයකට බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද අතර ඊට අදාල පුවත්පත් දැන්වීම 2026.04.10 වෙනි දින දිනමිණ, ඩේලි නිව්ස් හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලදී. ඒ අනුව ඉදිරිපත් වූ ලංසු 2026.05.05 වෙනි දින ප.ව. 1.00ට විවෘත කරන ලද අතර ලංසු පිළිබඳ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවට අනුමැතිය සඳහා යොමු කර ඇත.

මීට අමතරව ගාල්ල දුම්රිය ස්ථාන උඩුමහල විවේක කාමර හා ලොබි කොටස ආපන ශාලාව සහ මිහින්තලය දුම්රිය ස්ථාන විවේක කාමර වසර පහක කාලයකට බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද අතර ඊට අදාල පුවත්පත් දැන්වීම 2026.04.10 වෙනි දින දිනමිණ, ඩේලි නිව්ස් හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලදී. ඒ අනුව ඉදිරිපත් කරන ලද ලංසු 2026.05.26 වෙනි දින ප.ව. 2.00ට විවෘත කරන ලදී . ටෙන්ඩරය සඳහා ලද

	ලංසු පිළිබඳ විස්තරය තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමු කර ඇති අතර එම කමිටුවේ වාර්තාව ලැබීමෙන් අනතුරුව අනුමැතිය සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවට යොමු කරනු ලැබේ. ඉහත ටෙන්ඩර් සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලද පසුව බාහිර පාර්ශ්වයකට බදු පදනම් මත ලබා දීමට කටයුතු කරනු ලැබේ. **3. සනීපාරක්ෂක පහසුකම් :-** දැනට සියළුම දුම්රිය ස්ථාන විසින් මගීන්ට සනීපාරක්ෂක පහසුකම් නොමිලේ ලබා දෙනු ලබන අතර ඊට අමතරව ඇතැම් දුම්රිය ස්ථාන මඟින් දෙපාර්තමේන්තු වියදමින් නඩත්තු කර මඟින්ගෙන් සුළු මුදලක් අය කර සනීපාරක්ෂක පහසුකම් ලබා දීමට කටයුතු කර ඇත. තවද නවීන පහසුකම් සහිතව ගුණාත්මක සේවාවක් ලබා දීමේ මූලික අරමුණින් දුම්රිය ස්ථානයන්හි පවතින සනීපාරක්ෂක ගොඩනැගිලි තමන් විසින් නඩත්තු කර මුදල් අය කර සනීපාරක්ෂක පහසුකම් සැපයීම සඳහා බාහිර පාර්ශ්වයන්ට බදු ලබා දීමට කටයුතු කර ඇත. ඒ අනුව හපුතලේ, හැටන්. මරදාන, පොල්ගහවෙල, ගම්පහ හා රාගම යන දුම්රිය ස්ථාන පවතින සනීපාරක්ෂක ගොඩනැගිලි වසර දෙකක කාලයකට බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද අතර ඊට අදාල ප්‍රවත්පත් දැන්වීම 2026.04.10 වෙනි දින දිනමිණ, ඩේලි නිව්ස් හා තිනකරන් යන ප්‍රවත්පත්වල පළ කරන ලදී. ඒ අනුව ඉදිරිපත් කරන ලද ලංසු 2026.05.19 වෙනි දින ප.ව. 1.00ට විවෘත කරන ලදී. ඉහත ටෙන්ඩර් සඳහා ලද ලංසු පිළිබඳ විස්තරය තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමු කර ඇති අතර එම කමිටුවේ වාර්තාව ලැබීමෙන් අනතුරුව අනුමැතිය සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවට යොමු කරනු ලැබේ. ඊට අනුමැතිය ලද පසුව බාහිර පාර්ශ්වයකට බදු පදනම් මත ලබා දීමට කටයුතු කරනු ලැබේ. ❖ කාරක සභා නිර්දේශ අංක 2 හා 3 මෙම අංශයට අදාල නොවන බව දන්වා සිටිමි. දුර ගමන් සේවා දුම්රියයන් සියල්ලම ආවරණය වන පරිදි පිරිසිදු කිරීම හා සනීපාරක්ෂක පහසුකම් නිසි ලෙස පවත්වාගෙන යාම, බාහිර ආයතනයකට ලබා දීමට ප්‍රසම්පාදනය කිරීම සඳහා කටයුතු යොදා ඇත.

D කාරක සභාවේ නිර්දේශ

3.

1 මූල එන්ජින් පිළිබඳ තොරතුරු

එන්ජින් වර්ගය	පවතින මූල එන්ජින් ප්‍රමාණය	ධාවනය කළ හැකි ප්‍රමාණය (Maintainable)		ධාවනය කළ නොහැකි ප්‍රමාණය
		ධාවනය වන ප්‍රමාණය	අලුත්වැඩියාව සඳහා තාවකාලිකව ඉවත් කළ ප්‍රමාණය	
M2	13	10	3	
M4	14	7	7	
M5B	4	1	3	
M5C	7	4	3	
M6	14	10	4	
M7	13	6	5	2
M8	8	3	5	
* M8A	2	1	1	
M9	9	1	5	3
M10	3	2	1	
M10A	6	3	3	
M11	10	4	6	
W1	3	*1	-	2
W2	2	1	-	1
W3	10	6	4	
Y	27	13	14	

එන්ජින් වර්ගය	පවතින මූල එන්ජින් ප්‍රමාණය	ධාවනය කළ හැකි ප්‍රමාණය (Maintainable)		ධාවනය කළ නොහැකි ප්‍රමාණය
		ධාවනය වන ප්‍රමාණය	අලුත්වැඩියාව සඳහා තාවකාලිකව ඉවත් කළ ප්‍රමාණය	
S8	20	11	9	
S9	15	10	5	
S10	15	9	6	
S11	19	10	9	
S12	19	15	4	
S12 AC	4	4	-	
S13	12	6	6	
S13A	4	4	-	
S14	18	16	2	
S14A	4	4	4	

*W1-650 එන්ජිම සම්මාන්න කලා 26 අංශයෙන් පුර පුළු "Shunting" කාර්යයන් සඳහා පමණක් භාවිතා කරනු ලබයි.

RTB SMW-49-11 MELP MELH MELE

බිමල් නිරෝෂන් රත්නායක (පා.ම)
ප්‍රවාහන, මහාමාර්ග සහ සාගරික සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය : ජීඩී/1604/වීවී(මා/ක)/COPA/2026,
ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කර්මාන්ත) කාර්යාලය,
ඩී.ආර්.විජේවර්ධන මාවත,
කොළඹ 10.
2026.02.02.

දුම්රිය සාමාන්‍යාධිකාරී,

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ 2023 මුදල් වර්ෂයට අදාළ විගණකාධිපති වාර්තාව, වර්තමාන කාර්යසාධනය සහ 2025/05/09 හා 2025/06/05 දිනයන්වල පැවති රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීම්වලදී ලබා දුන් නිර්දේශ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග නැවත පරීක්ෂාව පිළිබඳ කාරක සභා රැස්වීම - තෙවැනි දිනය.

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් මා අමතා ඇති අංක:CAR/GNS/06/GA/රාගිකාස හා 2026.01.13 දිනැති ලිපිය හා බැඳේ.

මහව හා අනුරාධපුර අතර දුම්රිය මාර්ගය අලුතින් ඉදිකිරීමේදී දුම්රිය මාර්ගයෙන් ගලවා ඉවත් කරන ලද රේල් පීලි හා කොන්ක්‍රීට් සිල්පර බැහැර කිරීම පිළිබඳ පැහැදිලි කිරීම් අවශ්‍ය කටයුතු සඳහා පහත පරිදි දක්වා සිටිමි.

ඒ අනුව, රාත්තල් 80 වර්ගයේ රේල් පීලි මීටර් 111,195.67ක් , රාත්තල් 90 වර්ගයේ රේල් පීලි මීටර් 22,474.63ක් හා කොන්ක්‍රීට් සිල්පර 85,719ක් ඉහත මහව - අනුරාධපුර දුම්රිය මාර්ග කොටසෙන් ගලවා ඉවත් කෙරිණි.

අද දින වන විට, ඉහත ගලවා ඉවත් කළ ද්‍රව්‍ය වලින් සැලකිය යුතු කොටසක් වෙනත් මාර්ග කොටස් සංවර්ධන හා පුනරුත්ථාපන කටයුතු සඳහා බැහැර කර ඇති අතර, දැනට බැහැර කිරීම සඳහා පවතින්නේ රාත්තල් 80 වර්ගයේ පීලි මීටර් 72,330.42ක් , රාත්තල් 90 වර්ගයේ පීලි මීටර් 3,672.89ක් හා කොන්ක්‍රීට් සිල්පර 55,041ක් පමණි.

දුම්රිය මාර්ගයේ පාලම් අලුත්වැඩියා කටයුතු, දිට්වා සුළි කුණාටුවෙන් පසුව තාවකාලිකව පිළිසකර කරන ලද දුම්රිය මාර්ග කොටස්වල වැඩ කටයුතු නිම කිරීම හා අලින්ට ගමන් කිරීම සඳහා කාසිකොටේ ප්‍රදේශයේ ඉදිකරනු ලබන උමං පාලමේ ඉදිකිරීම් කටයුතු සඳහා මේ වන විට මාස 02ක කාලයක් සඳහා මහව සිට මගී දුම්රිය ධාවනය අත්හිටුවා ඇති අතර, අලි උමං පාලම දක්වා පමණක් සේවා දුම්රියයන් ධාවනය කළ හැකිව පවතී.

01. ඒ අනුව, මූලික අදියර ලෙස මහව සිට අලි උමං පාලම දක්වා වූ කොටසේ ඇති රාත්තල් 80 වර්ගයේ පීලි මීටර් 2,438, රාත්තල් 90 වර්ගයේ පීලි මීටර් 960.4 ක් හා කොන්ක්‍රීට් සිල්පර 8,820ක් වූ ප්‍රමාණය 2026 අප්‍රේල් මාසය වන විට බැහැරට ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන අතර, සේවා දුම්රියට අමතරව බූම් (Boom) රථ හා ලොරි රථ මගින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

02. ඒ අනුව,කාසිකොටේ ප්‍රදේශයේ පිහිටි අලි උමං පාලමේ සිට අනුරාධපුරය දක්වා වූ කොටසේ ඉතිරිව පවතින රේල් පීලි හා කොන්ක්‍රීට් සිල්පර ප්‍රමාණය වනුයේ රාත්තල් 80 වර්ගයේ පීලි මීටර් 69,892.42ක් ,රා.90 වර්ගයේ පීලි මීටර් 2,712.49ක් හා කොන්ක්‍රීට් සිල්පර 46,221කි.

2.1. කෙසේ වෙතත්, ඉහත අලි උමං පාලමේ සිට අනුරාධපුරය දක්වා ඇති ද්‍රව්‍ය අතරින් රාත්තල් 80 වර්ගයේ රේල් පීලිවලින් 40% ක් පමණ අධික ලෙස ගෙවී යාම, කඩතොලු වීම ආදී දෝෂ හේතුවෙන් නැවත දුම්රිය මාර්ගයට යෙදීමට නොහැකි තත්වයේ පවතින අතර, භාවිතයට ගත නොහැකි එම 40% රේල් පීලි ප්‍රමාණය මීටර් 28,636.42 ක ප්‍රමාණය අවසානයේදී ටෙන්ඩර් මගින් විකිණීමට හෝ ගොඩනැගිලි අංශවල කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කරනු ලැබේ.

එමෙන්ම එම කොටසේ ඇති කොන්ක්‍රීට් සිල්පරවලින් 25%ක් පමණ (11,556) ඉරිතැලීම් හා පැලීම් හේතුවෙන් නැවත පාවිච්චි කළ නොහැකි අතර, ඒවා දුම්රිය මාර්ගයේ ආරක්ෂක කළුගල් රැඳවුම් වශයෙන් යොදා ගැනීමට කටයුතු කරනු ලැබේ. (මහව සිට අලි උමං පාලම දක්වා වූ කොටසේ දුම්රිය මාර්ගයට පාවිච්චි කළ නොහැකි රේල් පීලි හා සිල්පර කලින් හදුනාගෙන ඉවත්කොට ඇත)

ඒ අනුව දුම්රිය මාර්ගයට නැවත පාවිච්චි කළ හැකි බැහැර කළ යුතු ද්‍රව්‍ය ප්‍රමාණය වන්නේ රාත්තල් 80 වර්ගයේ රේල් පීලි මීටර් 41,256ක්, රාත්තල් 90 වර්ගයේ රේල් පීලි මීටර් 2,712.49ක් හා කොන්ක්‍රීට් සිල්පර 34,665ක් පමණි.

03. කාසිකොටේ අලි උමං පාලමේ සිට අනුරාධපුර දක්වා කොටසේ රාත්තල් 80 වර්ගයේ හා රාත්තල් 90 වර්ගයේ නැවත භාවිතයට සුදුසු රේල් පීලි ඉවත් කිරීම 2026 මැයි මාසයේ සිට සේවා දුම්රියක් මගින් සිදු කිරීමට කටයුතු යොදනු ලැබේ.

3.1. ඒ අනුව, දුම්රිය ධාවනය අතරතුර, දිවා කාලයේ ලැබෙන පැය 03 ක පමණ වන මගී දුම්රිය නොමැති අවස්ථාවේ රේල් පීලි 50ක්ද, රාත්‍රී කාලයේ එසේ ලැබෙන පැය 03ක පමණ කාලයේ රේල් පීලි 50ක් ද වශයෙන් දිනකට පීලි 100 බැගින් දින 03 කදී පීලි 300ක් පමණ මෙම සේවා දුම්රියට පටවා ගැනීමට හැකියාව පවතී. මෙම දින 03 ට අමතරව පීලි අවශ්‍ය ස්ථානයට ගෙන ගොස් බෑම සිදු කිරීම හා නැවත පැමිණීම සඳහා දින 03ක පමණ කාලයක් ගතවේ. ඒ අතරතුර විවේක දිනයක්ද සැලකූ විට සතියකට පීලි 300ක්, එනම් ගණනය කළ විට පීලි මීටර් 4,120ක් පමණ බැහැර කිරීමේ හැකියාව පවතී. ඒ අනුව මෙම කාර්යය සඳහා මාස 11 පමණ කාලයක් ගතවන අතර කාලගුණික තත්වය, දුම්රිය එන්ජින් සපයා ගැනීමේ හැකියාව, දුම්රිය ධාවන කාර්ය මණ්ඩල සපයා ගැනීම් ගැටළු හා සේවක පිරිස් සපයා ගැනීමේ ගැටළු ආදිය නිසාවෙන් ඇති විය හැකි ප්‍රමාදයන් සැලකූ විට 2026 මැයි මස සිට ඉදිරි වසර 01 ½ක කාලයකදී ඉහත රේල් පීලි ප්‍රමාණය සම්පූර්ණයෙන් බැහැර කිරීමේ හැකියාව පවතී.

3.2. අලි උමං පාලමේ සිට අනුරාධපුරය දක්වා කොටසේ පවතින නැවත දුම්රිය මාර්ගයට යෙදිය හැකි බැහැර කළ යුතු කොන්ක්‍රීට් සිල්පර 34,665ක ප්‍රමාණයද බූම් (Boom) සහිත වාහන හා ලොරි රථ යොදාගෙන ඉවත් කිරීම 2026 මැයි මස සිට සිදු කිරීමට කටයුතු යොදනු ලැබේ. ඒ අනුව එක් බූම් (Boom) ට්‍රක් රථයක් මගින් දිනකට කොන්ක්‍රීට් සිල්පර 100ක් පැටවීම සිදු

කල හැකි අතර, ඒවා ලොරි රථ මගින් පටවා ගෙන ගොස් බෑම සිදු කොට නැවත පැමිණීම සඳහා දින 03ක් ගතවේ. විවේක දිනයක්ද සැලකූ විට සතියකට කොන්ක්‍රීට් සිල්පර 200ක් මෙමගින් ඉවත් කළ හැකි අතර, බූම් (Boom) රථ යුගලයක් හා ඒ සඳහා සරිලන පරිදි ලොරි රථ යෙදූ විට සතියකට කොන්ක්‍රීට් සිල්පර 400ක් ඉවත් කළ හැකිය. එසේ ඉවත් කළ හැකි උපරිම ප්‍රමාණය සතියක් තුළ සිල්පර 400ක් වන අතර ඊට හේතුව මෙම සිල්පර බූම් (Boom) රථ මගින් ලොරිවලට පැටවීම සඳහා සුදුසු ස්ථානයකට ඩක්කු හා සේවක පිරිස් යොදාගෙන දුම්රිය ධාවනය සිදුවන අතරතුර මෙම සිල්පර රැගෙන ඒමට සිදුවීමේ දුෂ්කරතාවයයි. මේ සඳහා විශාල සේවක පිරිසක්ද යෙදීමට සිදුවේ.

ඒ අයුරින් ඉහත සිල්පර ප්‍රමාණය ඉවත් කිරීම සඳහා මාස 20ක පමණ කාලයක් ගතවේ. කෙසේ වෙතත් පවතින කාලගුණික තත්වය, ඩක්කු මගින් දුම්රිය ධාවනය අතරතුර ප්‍රවාහනය කළ හැකි සිල්පර ප්‍රමාණය, සේවක පිරිස් සපයා ගැනීම හා වාහනවල ඇතිවිය හැකි කාර්මික දෝෂ වැනි ප්‍රායෝගික දුෂ්කරතා නිසා සිදු විය හැකි ප්‍රමාදවීම් සැලකූ විට 2026 වර්ෂයේ මැයි මාසයේ මෙම ක්‍රියාවලිය ආරම්භ කොට 2028 වර්ෂයේ අවසානය වන විට මෙම කොන්ක්‍රීට් සිල්පර ප්‍රමාණය ඉවත් කර ගැනීමට කටයුතු කළ හැකිව තිබේ.

ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කර්මාන්ත)

02/02/2026

ඇමුණුම 02

(ඇමු:01)

මගේ අංකය - බල / බිල් / හිඟ / 2026
බලපත්‍ර බිල්පත් ශාඛාව
ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී කාර්යාලය,
2026.05.25

ප්‍රධාන අභ්‍යන්තර විගණක ,

ප්‍ර.මු.නි. මඟින්,

ප්‍ර.දු.ග.(ආදායම්) මඟින් ,

2025.11.27 වන දින පැවැති රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර හිඟ මුදල් අය කර ගැනීමට ක්‍රමවේදයක් සකස් කර එය රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත දැනුම් දෙන ලෙස සිදු කර ඇති නිර්දේශ හා සම්බන්ධයෙනි .

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ වෙත යොමු කරන ලද මාගේ අංක .බල / බිල් / COPA / 2025 හා 2025.12.24 දාතමින් යුතු ලිපිය හා සබැඳේ.

02. 2025.11.27 වන දින පැවැති රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද හිඟ ආදායම් වාර්තාවට අදාලව 2025.12.31 දිනට යාවත්කාලීන කරන ලද හිඟ ශේෂය උක්ත ලිපිය මඟින් ඔබ වෙත යොමු කර ඇති බව පෙන්වා දෙමි. ඒ අනුව එකී ලිපියේ අවසාන ඡේදයෙන් සඳහන් කර ඇති පරිදි 2025.09.30 දිනට පැවැති හිඟ ශේෂය නිරවුල් කර ගැනීමේ 2026.03.31 දිනට ප්‍රගතිය ඇතුලත් වාර්තාව (ඇමුණුම - 01) අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

03. තවදුරටත් හිඟව පවතින ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත් , මේ වන විට අදාල ශේෂ නිරවුල් කර ඇත්නම් ඊට අදාල විස්තර දුම්රිය දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් දැනුම් දෙන ලෙසත් දන්වමින් හිඟ පවතින ආයතන වෙත මේ වන විට ලිපි මඟින් දැනුම් දී ඇත. තවද වැඩිම හිඟ ශේෂයක් පවතින දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - ගාල්ල වෙත අදාල හිඟ මුදල් කඩිනමින් නිරවුල් කරන ලෙසත් , නිරවුල් කර ඇති ශේෂ සම්බන්ධ තොරතුරු අප වෙත දැනුම් දෙන ලෙසත් නැතහොත් එම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා නිකුත් කරන බලපත්‍ර අවලංගු කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට සිදු වන බවත් දු.සා.ගේ අංක. බල/බිල්/4009 හා 2026.03.24 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත. ඊට පිළිතුරු දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අංක. දප/අදෙ/හි01/06/2026 හා 2026.04.30 දිනැති ලිපිය මඟින් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර , ඒ මඟින් දැනුම් දී ඇත්තේ එම දෙපාර්තමේන්තුවට අදාල බලපත්‍ර සංඥේත අංකය ඇතැම් විදුහල්පතිවරුන් සහ කලාප කාර්යාල වැරදි ලෙස භාවිතා කිරීම මත මෙම ගැටළුකාරී තත්වය නිර්මාණය වී ඇති බවත් , මෙම තත්වය නිවැරදි කිරීම සහ අදාල ශේෂ නිරවුල් කිරීම සඳහා අදාල කලාප අධ්‍යාපන කාර්යාල දැනුවත් කර ඇති අතර කඩිනමින් මෙම තත්වය නිරවුල් කරන බවය.

04. 2025.12.24 දින වන්විට, 2025.09.30 දිනට අදාලව පැවැති හිඟ බලපත්‍ර බිල්පත් ආදායම වන රු. 784,534,426.13 ක මුදලින් රු. 109,769,418.60 ක මුදලක් 2026.03.31 දක්වා වූ මාස 03ක කාලය තුල අය කර ගෙන ඇත. 2025.12.31න් අවසන් වර්ෂය තුල රු.2,819,401,803.30 ක වටිනාකමින් යුතු බලපත්‍ර ඉන්වොයිස් කර ඇති අතර ඉන් රු.2,731,992,523.31 ප්‍රමාණයක් 2026.03.31 දින වන විට නිරවුල් කර ඇති බවද එය මුළු ඉන්වොයිස් ප්‍රමාණයෙන් 96.89% ක් වන බවද කාරුණිකව දැනුම් දෙමි. තවද 2025 වර්ෂයට අදාලව තවදුරටත් හිඟව පවතින ශේෂයන්ද ඇතුලත්ව අදාල ආයතන සම්බන්ධීකරණය කර ගනිමින් සමස්ත හිඟ ශේෂය නිරවුල් කර ගැනීම් සඳහා තවදුරටත් කටයුතු කර ගෙන යන බව කාරුණිකව දැනුම්දෙමි.

ඇමුණුම් - 01යි.

25/05

දුම්රිය ගණකාධිකාරී (ආදායම් - බලපත්‍ර හා වෙළඳ)
ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙනුවට

පිටපත -
දු.සා
- තරු. දැ.ගැ.ස

2025.09.30 දිනට බලපත්‍ර බිල්පත් හිඟ ආදායම් ශේෂය

	සංකේත අංකය	ආයතනය	2025.12.24 දිනට ශේෂය (2025.09.30 දින දක්වා පැවැති සමස්ත ශේෂයෙන් (රු.)) B	2026.03.31 දිනට ශේෂය (නිරවුල් කිරීමෙන් පසු සමස්ත ශේෂය (රු.)) A	2025.12.24 - 2026.03.31 අතර නිරවුල් කිරීම (B - A) රු.
		පූර්ව බලපත්‍ර අංක 01 ඔස්සේ	769,194.00	769,194.00	-
1	3924	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - හෝමාගම	4,108,810.00	3,393,225.00	715,585.00
2	3926	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - පිළියන්දල	31,210,087.00	14,229,195.00	16,980,892.00
3	3927	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - මහරගම	19,495,643.00	13,419,149.00	6,076,494.00
4	3929	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - මීරිගම	30,266,639.00	13,097,062.00	17,169,577.00
5	3931	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - මීතොටමුල්ල	5,671,410.00	5,671,410.00	-
6	3932	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - පොල්ගහවෙල	7,324,406.00	6,432,731.00	891,675.00
7	3933	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - කුරුණෑගල	17,971,915.00	17,971,915.00	-
8	3936	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - මාතලේ	7,767,367.00	5,383,090.00	2,384,277.00
9	3940	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - දඹුල්ල 02	24,395,073.00	16,106,663.00	8,288,410.00
10	3941	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - මහනුවර	9,969,251.00	7,036,551.00	2,932,700.00
11	3943	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - නිතරක්ගොඩ	1,526,900.00	482,200.00	1,044,700.00
12	3944	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - දිඹුලාගල	2,386,155.00	679,140.00	1,707,015.00
13	3950	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - මාතර	5,752,739.00	5,536,479.00	216,260.00
14	3951	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - කතරගම	1,649,039.00	1,213,789.00	435,250.00
15	3952	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - වවුනියාව	7,617,120.00	5,562,950.00	2,054,170.00
16	3953	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - මඩකලපුව	15,567,470.00	4,203,215.00	11,364,255.00
17	3955	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - කලිවිල්	4,831,880.00	4,275,810.00	556,070.00
18	3958	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - මංචනාල්ල	4,985,769.00	4,985,769.00	-
19	3961	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - අක්කරෙයිසත්තු	28,409,597.00	28,409,597.00	-
20	3962	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - සම්මන්තුරේ	4,607,381.00	4,603,633.00	3,748.00
21	3963	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - එරාවූර්	11,687,943.00	11,687,943.00	-
22	3964	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - කින්නියා	8,705,843.00	8,705,843.00	-
23	3965	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - බදුල්ල - හාලිඇල	14,130,820.00	13,625,440.00	505,380.00
24	3966	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - බණ්ඩාරවෙල	6,036,066.00	6,036,066.00	-
25	3972	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - පදිවිස්සු කලාපය, කුරුවක්ඩිකුඩි	15,381,441.00	15,381,441.00	-
26	3973	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය - කල්කුඩා කලාපය, මාලවමඩිත	15,357,449.00	15,215,579.00	141,870.00
27	4003	පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක කාර්යාලය - අනුරාධපුරය	9,462,419.00	9,365,169.00	97,250.00
28	4004	කලාප අධ්‍යාපන කාර්යාලය - කුරුණෑගල	6,429,291.00	6,429,291.00	-
29	4006	කලාප අධ්‍යාපන කාර්යාලය - ගාල්ල	19,883,826.00	19,883,826.00	-
30	4009	දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - ගාල්ල	82,766,149.00	82,766,149.00	-
31	4010	උතුම් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - බදුල්ල	7,280,447.00	7,079,767.00	200,680.00
32	4012	ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලය - මඩකලපුව	59,386,978.00	59,386,978.00	-
33	4013	ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලය - මාතර	34,407,197.00	29,907,262.00	4,499,935.00
34	4015	ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලය - යාපනය	12,374,016.00	9,384,045.00	2,989,971.00
35	4017	ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලය - වවුනියාව	14,094,216.00	11,958,194.00	2,136,022.00
36	4018	ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලය - මහනුවර	3,244,870.00	2,951,790.00	293,080.00
37	4019	ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලය - කෑගල්ල	7,060,050.00	3,948,355.00	3,111,695.00
38	4020	ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලය - මුලතිව්	6,540,505.00	834,030.00	5,706,475.00
39	4022	ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලය - පොළොන්නරුව	11,036,299.00	11,036,299.00	-
40	4023	ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලය - කිලිනොච්චිය	9,007,592.00	8,068,677.00	938,915.00
41	4034	කලාප අධ්‍යාපන කාර්යාලය - කල්පිටිය	14,647,680.00	14,647,680.00	-
42	4035	කලාප අධ්‍යාපන කාර්යාලය - කිලිනොච්චි	10,238,847.00	8,653,272.00	1,585,575.00
43	4036	කලාප අධ්‍යාපන කාර්යාලය - මහව	12,413,342.00	9,247,088.00	3,166,254.00
44	4037	කලාප අධ්‍යාපන කාර්යාලය - මිරිඩල්ල	5,636,882.00	2,534,216.00	3,102,666.00
45	4052	කලාප අධ්‍යාපන කාර්යාලය - අකුරැස්ස	4,391,505.00	1,592,770.00	2,798,735.00
46	4068	නියෝ.පළා.සෙ.අධ. - කල්පිටිය	22,292,883.50	22,029,283.50	263,600.00
47	4092	මහ රෝහල - අනුරාධපුරය	2,242,703.00	2,242,703.00	-
48	4094	නියෝ.පළා.සෙ.අධ. - කිලිනොච්චිය	-	-	-

	සංකේත අංකය	ආයතනය	2025.12.24 දිනට ශේෂය (2025.09.30 දින දක්වා පැවැති සමස්ත ශේෂයෙන් (රු.)) B	2026.03.31 දිනට ශේෂය (නිරවුල් කිරීමෙන් පසු සමස්ත ශේෂය (රු.)) A	2025.12.24 - 2026.03.31 අතර නිරවුල් කිරීම (B - A) රු.
49	4101	සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය - කොළඹ	1,151,159.00	1,151,159.00	-
50	4104	වෛද්‍ය සැපයුම් අංශය	284,785.60	284,785.60	-
51	4114	නියෝ.පළා.සෞ.සේ. අධ්‍යක්ෂ කාර්යාලය - ගාල්ල	-	-	-
52	4116	නියෝ.පළා.සෞ.අධ. - මහනුවර	14,250.00	14,250.00	-
53	4119	නියෝ.පළා.සෞ.අධ. - මඩකලපුව	14,949,176.00	14,092,451.00	856,725.00
54	4123	නි.ප.සෞ.අධ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය - කුරුණෑගල	4,084,995.00	2,712,295.00	1,372,700.00
55	4126	නියෝ.පළා.සෞ.සේ. අධ්‍යක්ෂ කාර්යාලය - බදුල්ල	9,144,077.28	9,144,077.28	-
56	4149	විශේෂකාර්ය බලකා මූලස්ථානය	-	-	-
57	4152	නාවික හමුදා මූලස්ථානය	31,769,460.00	31,769,460.00	-
58	4154	යුධ හමුදා මූලස්ථානය	19,396,016.00	19,396,016.00	-
59	4157	ප්‍රභූ ආරක්ෂක අංශය	5,007,367.00	5,007,367.00	-
60	4158	රාජ්‍ය බුද්ධි සේවාව	1,953,620.00	1,953,620.00	-
61	4159	පොලිස් විශේෂකාර්ය බලකාය	2,969,491.00	2,969,491.00	-
62	4160	පොලිස් මූලස්ථානය	1,852,190.00	1,852,190.00	-
63	4161	පොලිස් අභ්‍යාස විද්‍යාලය - කළුතර	1,520,211.00	1,520,211.00	-
64	4175	පොලිස් අධිකාරී - යාපනය	2,631,755.00	2,631,755.00	-
65	4176	පොලිස් අධිකාරී - අනුරාධපුරය	2,151,784.00	2,151,784.00	-
66	4184	පොලිස් අධිකාරී කාර්යාලය - වවුනියාව	4,153,060.25	4,153,060.25	-
67	4425	කැප්පැල් ප්‍රධාන කාර්යාලය	11,300,230.00	8,681,967.40	2,618,262.60
68	4531	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගාල්ල	2,001,382.00	2,001,382.00	-
69	6020	ජේරාදෙණිය විශ්ව විද්‍යාලය	5,054,243.25	4,491,693.25	562,550.00
70	6045	රුහුණු විශ්ව විද්‍යාලය	1,493,263.25	1,493,263.25	-
		එකතුව	**784,534,426.13**	**674,765,007.53**	**109,769,418.60**

ඇමුණුම 03

~~ඇමුණුම 04~~

GME 35 B

දුරකථනය / தொலைபேசி / Telephone } 421281

යොමු අංකය / தொடர்பு எண் / Reference No. } NA.3837/MISC/2026

විෂය / விடயம் / Subject } .....

ශ්‍රී ලංකා දුම්රිය සේවය
இலங்கை புகையிரத சேவை
SRI LANKA RAILWAYS

ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය
பிரதான பொறியியலாளர் அலுவலகம்
Chief Engineer's Office
ඩී. ආර්. විජයවර්ධන මාවත,
டீ. ஆர். விஜயவர்தன மாவத்தை,
D. R. Wijeyawardana Mawatha,
කැ. පෙ. 370,
க. பெ. 370,
P. O. Box 370,
කොළඹ / கொழும்பு / Colombo } 2026.05.08

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මුදල් කළමනාකාර,

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් ලිමිටඩ,

නිමාව,

කොළොන්නාව.

<u>සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් ලිමිටඩ ආයතනයට අයත් පරිශ්‍රයන් 09 වෙනුවෙන් අදාල සැලසුම් ලබාගැනීම.</u>

<u>දුම්රිය රක්ෂිතයන්ට අදාළව මැනුම් සිදුකිරීමේ වියදම් ඇස්තමේන්තුව</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් මාවෙත යොමු කරන ලද 2026.03.24 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව අදාල ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා සී.පී.එස්.ටී.එල්. ආයතනයේ නමට හා වැට් අංකය සඳහන් කර එවන ලෙස ඔබ විසින් ඉල්ලා ඇති පහත අංක දරන ඉන්වොයිස් පත් මාර්ග හා කර්මාන්ත උප දෙපාර්තමේන්තුවේ දුම්රිය ගණකාධිකාරි විසින් මා වෙත යොමු කර ඇත. එම ඉන්වොයිස් පත් මේ සමග ඔබ වෙත ඉදිරිපත් කරන අතර, අදාල ගෙවීම් කටයුතු සිදු කර නොපමාව මා වෙත දැනුම් දීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

අනු අංකය	Invoice No	මුදල රු.	මැනුමට අදාල ස්ථානය
01	PERFO/AWR04/2026/34	රු. 18,072.72	කුරුණෑගල
02	PERFO/AWR04/2026/35	රු. 18,072.72	මාතර
03	PERFO/AWR04/2026/36	රු. 18,072.72	අනුරාධපුරය
04	PERFO/AWR04/2026/37	රු. 36,145.45	මඩකලපුව
05	PERFO/AWR04/2026/38	රු. 18,072.72	කෝටගල
06	PERFO/AWR04/2026/39	රු. 18,072.72	හපුතලේ
07	PERFO/AWR04/2026/40	රු. 36,145.45	සරසවි උයන
08	PERFO/AWR04/2026/41	රු. 27,109.08	පේරාදෙණිය

03. අදාල මුදල් ගෙවීමේ දී දුම්රිය සාමාන්‍යාධිකාරි, මහජන බැංකුව - නගර මධ්‍ය ශාඛාවේ අංක 176100159027316 දරණ ගිණුමට බැර කර ලබා ගත් ලදුපත ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කර්මාන්ත), ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, ඩී.ආර්.විජේවර්ධන මාවත, කොළඹ 10 යන ලිපිනය වෙත ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වන අතර, වෙක්පතකින් ගෙවීම් කරන්නේ නම් දුම්රිය සාමාන්‍යාධිකාරිගේ නමින් ගෙවීමට කටයුතු කරන්න. ඔබ විසින් මුදල් බැර කිරීමේ දී ඔබගේ නම, ලිපිනය, දුරකථන අංකය සහ මුදල් ගෙවන කාරණය ලදුපතේ සටහන් කිරීමට කාරුණික වන්නේනාම් මැනවි.
(ඇමුණුම් 08)

ඉංජිනේරු ඒ.එම්.එස්.පී.කේ. දීගල
ප්‍රධාන ඉංජිනේරු (මාර්ග/කර්මාන්ත)
එ/ව
2024/05/06

පිටපත -

1. දුම්රිය සාමාන්‍යාධිකාරි - කරු.දැ.ගැ.ස.
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වාණිජ) - කරු.දැ.ගැ.ස.
   (යොමුව - දු.ර.ක.ප්/බනිජ තෙල්/විවිධ -2025.08.05)
3. දුම්රිය ගණකාධිකාරි (මා/ක), - කරු.දැ.ගැ.ස.
4. මිනින්දෝරු අධිකාරි - කරු.දැ.ගැ.ස.

ඇමුණුම 04
ඇමුණුම 05

(28)

ඇමුණුම 01 (05)

බඳවා ගැනීමේ ප්‍රගතිය ද්විතික මට්ටම

අනු අංකය	තනතුරු නාමය	වැටුප් කේතය	2025.03.10 බඳවා ගැනීම සඳහා අනුමැතිය ලද සංඛ්‍යාව	බඳවා ගත් සංඛ්‍යාව	බඳවා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග
02	දුම්රිය ස්ථානාධිපති	Railway 2025	106	91	ඉතිරි 13 දෙනා බඳවා ගැනීම සඳහා විභාගය සමත් අයදුම්කරුවන්ගේ ලේඛණයක් විභාග දෙපාර්තමේන්තුවෙන් ගෙන්වා ගැනීමට කටයුතු කරමින් පවතී.
03	දුම්රිය නියාමක	Railway 2025	73	6	ඉතිරි පුරප්පාඩු 130 සඳහා බඳවා ගැනීම් සිදු කිරීම සඳහා සුදුසුකම් සංශෝධනය කර නැවත අයදුම්පත් කැඳවීම සඳහා කටයුතු කරමින් පවතී.
04	දුම්රිය එන්ජින් රියදුරු	Railway 2025	92	115	ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා නැවත අයදුම්පත් කැඳවීම සඳහා කටයුතු කරමින් පවතී.
05	අධීක්ෂණ කළමනාකරු	Railway 2025	89	107	ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා නැවත අයදුම්පත් කැඳවීම සඳහා කටයුතු කරමින් පවතී.
11	දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (යාන්ත්‍රික)	MT-02	127	193	ඉතිරි පුරප්පාඩු 70 සඳහා නැවත අයදුම්පත් කැඳවීමට කටයුතු කරමින් පවතී.
12	දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (විදුලි)	MT-02	30	47	
13	මූලික තාක්ෂණ ශිල්පී	MT-01	384	92	ඉතිරි පුරප්පාඩු පිරවීම සඳහා බඳවා ගැනීම් සුදුසුකම් සංශෝධනය කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.
14	උපදේශක	MN-03	08	3	2025.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලබා දී ඇත. 3 දෙනෙකු සේවයට වාර්තා කර ඇත. ඉතිරි පුරප්පාඩු 05 සඳහා ලේඛණයේ ඊලඟට සුදුසුකම් ලැබූ 05 දෙනෙකු වෙත පත්වීම් ලබා දීමට කටයුතු කරමින් පවතී.
එකතුව			**909**	**654**	

ඇමුණුම 05

ඇමුණුම 02

2026.03.31 දිනට කාර්ය මණ්ඩල විස්තර පහත පරිදි ඉදිරිපත් කරමි.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	සත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	214	135	79
තෘතීයික මට්ටම	451	85	366
ද්විතික මට්ටම	11339	6624	4715
ප්‍රාථමික මට්ටම	8605	8064	541
එකතුව	20609	14908	5701

ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 5701 කි.

ප්‍රාථමික මට්ටමේ තනතුවල 1474 ක සේවක අතිරික්තය මේ වන විට 810 ක් වේ. අතිරික්තය පවතිනුයේ දු.කා.ස. තනතුරේ වන අතර මෙම තනතුරේ ඊලඟ උසස් වීම් වන පොලිස්මන්, පොයින්ට්ස්මන් හා දුම්රිය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(279)

ඇමුණුම 03 (01)

බඳවා ගැනීම් සහ උසස් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි ඉදිරිපත් කරමි.

අනු අංකය	සේවා මට්ටම	2026.03.31 දිනට පුරප්පාඩු	පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග
i	ජ්‍යෙෂ්ඨ මට්ටම	79	දීප ව්‍යාප්ත සේවාව වල පවතින පුරප්පාඩු 21 සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාන අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇත. මීට අමතරව දෙපාර්තමේන්තුගත විධායක සේවයේ තනතුරු පුරප්පාඩු අතුරින් විවෘත පදනම මත තනතුරු 05 ක් සීමිත පදනම මත පුරප්පාඩු 13 ක් පිරවීම සඳහා 2025.05.21 බඳවා ගැනීම් කමිටු අනුමැතිය සඳහා යොමු කර ඇත. සීමිත පදනම මත බඳවා ගැනීම් පවතින විධිවිධාන අනුව සිදු කරන ලෙස අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PQM/RRPCM/2025/decision හා 2025.10.08 දිනැති ලිපියෙන් දන්වා ඇත. ඒ අනුව කටයුතු සිදු කරමින් පවතී. විවෘත බඳවා ගැනීම් සඳහා 2025.12.16 අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව කැඳවීමේ නිවේදන සකස් කර අනුමැතියට යොමු කිරීම සඳහා කටයුතු කරමින් පවතී. ඒ අනුව පුරප්පාඩු 79 න් පුරප්පාඩු 18 ක් පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. මීට අමතරව 1 පන්තියේ හා විශේෂ පන්තියේ පුරප්පාඩු 16 ක් පැවතියද සුදුසුකම් සහිත නිලධාරීන් නොමැති වීම මත පරප්පාඩු පිරවීමට නොහැකි වී ඇති අතර ආවරණ රාජකාරී සඳහා නිලධාරීන් පත් කර ඇත. මීට අමතරව 11 පන්තියේ පුරප්පාඩු 13 ක් පවතින අතර එම තනතුරුවලට ස්ථිරව පත් කිරීම සඳහා 11 පන්තියේ නිලධාරීන් නොමැති බැවින් 111 පන්තියේ නිලධාරීන් රාජකාරී ආවරණය/ වැඩ බැලීම සඳහා පත් කර ඇත. මිනින්දෝරු සේවයේ පුරප්පාඩු 8 ක් පවතින අතර එම පුරප්පාඩු සම්බන්ධයෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත. සහකාර අධිකාරී (වාණිජ්/ගමනාගමන) පුරප්පාඩු 03 ක් පවතින අතර මේ වන විට එම පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරමින් පවතී
ii	තෘතීයික මට්ටම	366	දැනට පවතින පුරප්පාඩු 364 පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ඇමුණුම් A මඟින් දක්වා ඇත.
iii	ද්විතික	4715	2026.03.31 දිනට පවතින පුරප්පාඩු 4715 සඳහා පෙර ලද අනුමැතීන් මත විවෘත හා සීමිත පදනම මත බඳවා ගැනීම් සඳහා රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සමාලෝචන කමිටුව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් ලබා දෙන ලද අනුමැතිය අනුව තනතුරු 1574 ක් බඳවා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ඇමුණුම් B මඟින් දක්වා ඇත.

			සීමිත පදනම මත 2523 බඳවා ගැනීම සඳහා බඳවා ගැනීමේ කමිටු වෙ 2025.05.21 දින යොමු කර ඇත. සීමිත පදනම මත බඳවා ගැනීම් පවති: විධිවිධාන් අනුව සිදු කරන ලෙස අග්‍රාමාත්‍ය ලේකම්ගේ අං POM/RRPCM/2025/decision හා 2025.10.08 දිනැති ලිපියෙන් දන්ව ඇත. ඒ අනුව කටයුතු සිදු කරමින් පවතී විවෘත බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලැබී ඇති සංඛ්‍යාව = 1574 මේ වන විට බඳවා ගෙන ඇති සංඛ්‍යාව = 657 සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා කටයුතු කරන සංඛ්‍යාව = 2522 සීමිත පදනම මත බඳවාගෙන ඇති සංඛ්‍යාව =571 කළමනාකරණ සේවා නිලධාරීන් 88 ක් බඳවාගෙන ඇත. ඒ අනුව 2026 වර්ෂයේ ද්විතික මට්ටමේ පුරප්පාඩු 4715 න් පුරප්පාඩු 2868 ක් පිරවීම සඳහා තවදුරටත් කටයුතු කරමින් පවතී.